ISSN 1391 - 1031
2016 ඔක්තොම්බර්
22 වෙළුම 07 කලාපය

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"එය ධනපති ආණ්ඩුවක් නිසා පාන් දීම එයට කළ නොහැකිය. එයට දිය හැකි හොඳම දෙය, 'දක්ෂ ලෙස සංවිධානය කළ දුර්භික්ෂය' වන්නේය. නමුත් ජනතාව දුර්භික්ෂය පිළි නොගනු ඇත. පාන් තිබෙන බවත්, එය ලබා ගත හැකි බවත්, එහෙත්, එය ලබා ගත හැක්කේ ප්‍රාග්ධනයේ හා ඉඩම් හිමිකමෙහි ශුද්ධත්වයට ගරු නොකරන ක්‍රමවලින් පමණක් බවත්, ඔවුන් ඉගෙන ගනු ඇත. සමහර විට ඉතා ඉක්මනින් ඔවුන් එය ඉගෙන ගනු ඇත.

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**19 පිටුව**

**05 හවුල් ආණ්ඩුවේ...**



මෝඩකම් දෙකක් එක් නුවණක්කාර කමක් වන්නේ නැතැයි" කියමනක් තිබේ. ඒ අනුව දුබලකම් දෙකක්...

**07 ලාභය වෙනුවෙන්...**



ලාභය වෙනුවෙන් සිදුකරනු ලබන ආහාර ද්‍රව්‍ය වෙළඳාමේ (ජාවාරමේ) ප්‍රධාන ගොදුර...

**09 හොරු රකින...**



මාමා-බෑනා එකමුතුව මෙම ගනුදෙනුව සිදුකර ඇත්තේ අගමැති රනිල් වික්‍රමසිංහ සහ එ.ජා.ප.යේ...

**11 ප්‍රකෘතිය වටහා...**



සිය නිෂ්පාදනයන් සඳහා වැඩි වැඩියෙන් සූරාකෑම හා ලාභ ලැබීම සඳහා, ලෝකයේ රටවල්...

සංවාදය.......................... 03
තරුණ............................ 04
ආවර්ජනා........................ 06
ජාත්‍යන්තර........................ 08
කාන්තා........................... 10
කාලීන........................... 12
වේදිකාව......................... 13
විශේෂාංග........................ 14

# රාජ්‍ය මූල්‍ය ආයතන

# දියකර හැරීමේ සූදානමක්!

02 පිටුවට









රටේ සම්පත් විකිණීමට, බිලිදීමට හා එට්කා ගිවිසුමට එරෙහිව 2016.09.20 කොළඹදී...

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## වතු කම්කරුවන්ට මාසික වැටුප් ක්‍රමයක් දිනා දෙන සටනක් ඕනෑ

**කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා**

දෙමුහුන් වැටුප් ක්‍රමය පරදවා මාසික වැටුප් ක්‍රමයක් දිනා ගැනීම හා ඉඩමක නිවසක අයිතිය වෙනුවෙන් සටන් කිරීමට වතු කම්කරු ජනතාව පෙළගස්වමින් සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ 10 වන සමුළුව සැප්තැම්බර් 25 දින පෙ.ව. 10ට හැටන් සාරදා මහල් ශාලාවේ විශාල වතු කම්කරු ජනතාවකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා ප්‍රධාන ආරාධිතයා ලෙස සමුළුවට සහභාගි විය. වතු කම්කරු ජනතාවට අවුරුදු එකහමාරක් පමණ කිසිදු වැටුප් වැඩිවීමක් ලැබී නැති බවත් අදත් දිනකට රු 450ක අඩු පඩියක් ලබමින් වතු කම්කරු ජනතාව සූරාකෑමට ලක්වන බවත් ලාල්කාන්ත සහෝදරයා එහිදී පැවසීය. මේ නිසා මාසික වැටුප් ක්‍රමයක් දිනාගැනීමට වතු කම්කරු ජනතාව සටන් කළ යුතු බවත් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය එම සටනට සම්පූර්ණ සහාය ලබා දෙන බවත් ලාල්කාන්ත සහෝදරයා වැඩිදුරටත් පවසා සිටියේය. සමස්ත ලංකා වතු කම්කු සංගමයේ හිටපු සභාපති රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයා හා වර්තමාන සභාපති කේ. සෙල්වරාජ් සහෝදරයාද මෙහිදී අදහස් දැක්වූහ.



## ලංගමය ගොඩගන්න ජ.වි.පෙ. සමිතියෙන් යෝජනා

දහසකුත් පොරොන්දු දී බලයට පැමිණි යහපාලන ආණ්ඩුව විසින් ද තව දුරටත් ලංගමය විනාශය කරා දක්කාගෙන යන බව, මේ වන විට පැහැදිලි ලෙස පෙනෙන්නට තිබේ. රටේ ජනතාවට, විශේෂයෙන්ම ගම්බද ජනතාවට, කාර්යාල සේවකයන්ට හා ශිෂ්‍යයන්ට ප්‍රවාහනයේ දී මහත් සේවාවක් ඉටු කරනු ලබන ලංගමය බේරා ගැනීම සඳහා සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය විසින් එහි ප්‍රධාන ලේකම් සේපාල ලියනගේ සහෝදරයාගේ අත්සනින් යුතුව මුදල් අමාත්‍යාංශය වෙත 2017 අයවැයටද ඇතුළු කරගැනීම සඳහා යෝජනා මාලාවක් ඉදිරිපත් කර ඇත.

අනෙකුත් රාජ්‍ය ආයතනයන්ට ලබාදෙන සියලු අයිතිවාසිකම් හා වරප්‍රසාද ශ්‍රී ලංගමයට හා එහි සේවකයන්ට ලබාදීම, අවධිමත් බඳවා ගැනීම්, මාරුකිරීම් හා උසස්කිරීම් හා දේශපාලන අතපෙවීම් නතරකර විධිමත් ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කර පරිපාලනය ක්‍රමවත් කිරීම, ප්‍රධාන නගරවල පිහිටි ශ්‍රී ලංගම ඩිපෝවල ඉන්ධනහල් අරම්භකර පාරිභෝගිකයන්ට ඉන්ධන අලෙවි කර මුදල් ඉපැයීම සහ වාහන අමතර කොටස් අලෙවි සැල් ආරම්භ කිරීම, ශ්‍රී ලංගම තෝරාගත් ඩිපෝවල නව රියදුරු පුහුණු පාසල් සහ දුම් පරීක්ෂණ ස්ථාන ආරම්භ කිරීම ඇතුළු යෝජනා රැසක් මෙයට ඇතුලත් කර ඇත.

## අධ්‍යාපන ලේකම්ගේ නූගත් වැඩ නිසා පාසල් ගුරු මාරු අවුලක

**ලංකා ගුරු සේවා සංගමය**



කලාප මට්ටමේ හා පළාත් මට්ටමේ ගුරු ස්ථාන මාරු මණ්ඩල කැඳවීම හා ගුරු ස්ථාන මාරු සිදු කිරීම ජාතික ගුරුමාරු ප්‍රතිපත්තියට අනුව සිදුකිරීමටත්, මෙම වර්ෂයට අදාලව ජාතික පාසල් ගුරුමාරු මණ්ඩල පිහිටු වීමටත්, ජාතික පාසල් ගුරුමාරු මණ්ඩලය කැඳවීමටත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයා මේ වනතුරු කිසිදු පියවරක් ගෙන නොමැත.

විධිමත් ගුරුමාරු මණ්ඩලය නොකැඳවමින් මේවන විටත් විවිධ පුද්ගල හිතවක්තකම් හා අමනාපකම්ද දේශපාලන හිතවත්කම් හා අමනාපකම්ද මත පදනම් වෙමින් මේ වර්ෂයට අදාළ ගුරු ස්ථාන මාරු අමාත්‍යාංශය විසින් සිදුකර ඇති අතර ඇතැම් ගුරුවරුන් අත්තනෝමතිකව ස්ථාන මාරු කරනු ලැබ ඇත.

මේ පිළිබඳව ලංකා ගුරු සේවා සංගමය එහි ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයාගේ අත්සනින් යුතුව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට ලිඛිතව දැනුම් දී ඇති අතර වහාම අත්තනෝමතික ගුරු ස්ථාන මාරු නවතන ලෙසත් ජාතික පාසල් ගුරුමාරු මණ්ඩලය කැඳවා, ස්ථාපිත කර ගුරු ස්ථාන මාරු විධිමත්ව සිදුකිරීමට කටයුතු කරන ලෙසත් දන්වා ඇත.

## රේගු සටනට, දේශීය ආදායම් හා සුරාබදුත් එක්වෙයි

දේශිය ආදායම් පනත අහෝසිකර බදු අයකිරීම පුද්ගලික අංශයට පැවරෙන පරිදි නව පනත් දෙකක් සකස් කිරීමටත් සුරාබදු දෙපාර්තමේන්තුවට අත්තනෝමතිකව සේවා ව්‍යවස්ථාවක් හඳුන්වාදීම හා දෙපාර්තමේන්තුවට පිටින් ඇමතිවරයා යටතේ විශේෂ ඒකකයක් පිහිටුවීමටත් විරෝධය පාමින් සුරාබදු හා දේශීය ආදායම් බදු නිලධාරීන්ගේ වෘත්තීය සමිති, රේගු වෘත්තීය සමිති සන්ධානය සමග එක්ව සටන් ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. ඒ අනුව සැප්තැම්බර් 23 දහවල් කොළඹ ලේක්හවුස් වටරවුමේ දී ඔවුන් එක්ව විරෝධතා ව්‍යාපාරයක් දියත් කර තිබුණි.

වෘත්තීය සමිති සාකච්ඡා පවා මගහරිමින් සාකච්ඡා සඳහා ගිය රේගු නිලධාරීන්ගේ ආත්ම ගෞරවය පවා නොතකා හැසිරෙමින් සිටි මුදල් ඇමතිවරයා මෙම සංවිධානාත්මක අරගලය ඉදිරියේ සාකච්ඡාවක් ලබා දීමට එකඟ වී ඇති බව වාර්තා වේ.




### රාජ්‍ය මූල්‍ය ආයතන...

01 පිටුවෙන්

**ජාත්‍යන්තර මූල්‍ය ආයතනයන්හි නියෝග අනුව රජය ආර්ථික කටයුතුවලින් ඉවත්වීමේ ආර්ථික උපායමාර්ගයක සිටින වත්මන් හවුල් ආණ්ඩුව රටේ ආර්ථිකයේ මර්මස්ථාන බඳු ආයතන දේශපාලන වුවමනාවන්ට නතුකරගැනීමේ හා දියකර හැරීමේ ක්‍රියාමාර්ගයක සිටින බව අනාවරණය වී තිබේ.**

ආණ්ඩුව විසින් මේ වන විට ගනිමින් තිබෙන ක්‍රියාමාර්ග හමුවේ මෙය තහවුරු වෙමින් තිබෙන බව ආර්ථික විශ්ලේශකයෝ පෙන්වා දෙති. විශේෂයෙන් ආණ්ඩුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දුර්වල කරමින් ආදායම් එකතු කිරීමේ කාර්යය පෞද්ගලික සමාගමකට ලබා දීමට පියවර ගනිමින් සිටින අතර රේගු දෙපාර්තමේන්තුව දුර්වල කිරීමටත් ජාවාරම්කරුවන්ට රිංගා යාමට හැකි පරිදි රේගු අණපනත් ලිහිල්කිරීමටත් සැලසුම් සකස් කරමින් සිටී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු එකතු කිරීම අකාර්යක්ෂම බවත් ඇස්තමේන්තු ගත බදු ප්‍රමාණයෙන් විශාල ප්‍රමාණයක් එකතු නොවී ඇති බවත් පවසන ආණ්ඩුව, ඒ සඳහා බදු එකතු කිරීමේ ක්‍රියාවලිය මැකෙන්සි නම් විදේශ සමාගමකට පැවරීමට තීරණය කර තිබේ. එමෙන්ම රාජ්‍ය බදු එකතු කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කරනු වෙනුවට විදේශ සමාගම්වලට පැවරීමෙන් කොමිස් මුදල් ලෙස රටේ බදු මුදල් අහිමි කරගැනීමට කටයුතු කරන ආණ්ඩුව, අනෙක් අතට රටේ ආර්ථික තොරතුරු විදෙස් සමාගමක් අතට පත්කිරීමෙන් ජාතික ආරක්ෂාවද අනතුරේ හෙළන බව විශ්ලේෂකයින්ගේ අදහසයි.

එසේම දැනට පවතින දේශීය ආදායම් පනත බණ්ඩනය කොට පනත් දෙකක් නිර්මාණය කිරීමට සැලසුම් කරන ආණ්ඩුව, 2016 නව බදු පරිපාලන පනත මගින් සියලු නිලධාරීන් පත් කිරීමේ බලය මුදල් ඇමති වෙත පවරාගැනීමට උත්සාහ දරයි. ව්‍යාපාරිකයෙකු වන මුදල් ඇමතිවරයෙකු වෙත බදු ක්ෂේත්‍රයේ මෙම බලය පැවරීම බලවත් අනතුරක් ඇති කරන බවට සැකයක් නැත.

මේ අතර රටට ආදායම සොයා දෙන රේගුව දුර්වල කරන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර ඇති ආණ්ඩුව, රේගුවේ නිලධාරීන් සතුව තිබෙන බලතල අඩු කිරීමටද රේගු පනත යටතේ වැරදිකරුවන්ට දඬුවම් ලිහිල් කිරීමටද සැලසුම් කරයි. නව පනතට අනුව අතිරේක අධ්‍යක්ෂක ජෙනරාල්වරුන් හය දෙනෙකු පත් කිරීමට ආණ්ඩුව අපේක්ෂා කරන අතර ඉන් තිදෙනෙක් කැබිනට් මණ්ඩලය මගින් පත්කරමින් දේශපාලන මැදිහත් වීම් සඳහා ඉඩකඩ පාදාගැනීමටද උත්සාහ කරන බව වෘත්තිය සමිති පවසයි.

මේ වන විටද මෙම ආයතනයන්හි වෘත්තීය සමිති විසින් ආණ්ඩුවේ නව තීරණ හා සැලසුම්වලට එරෙහිව උද්ඝෝෂණ ආරම්භ කර ඇත. මේ පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දුන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලෙකම් ටිල්වින් සිල්වා සහෝදරයා, මෙම අනතුර හුදු එම ආයතනයන්ට පමණක් සීමා නොවන බැවින් ආණ්ඩුවේ නව ලිබරල්වාදී ආර්ථික උපායමාර්ග පරාජයට පත්කිරීම වෙනුවෙන් පුළුල් ජනතා සටන් පෙරමුණක් ගොඩනැගිය යුතු බවත් ඒ සඳහා වැඩකරන ජනතාව ඇතුළු සියලු ජන බලවේගයන්හි සහයෝගය අපේක්ෂා කරන බවත් පැවසීය.

### හොරු රකින...

09 පිටුවෙන්



කරන්නේ ඔහුගේ මතයෙන් ඔබ්බට නීති විරෝධී හෝ සාපරාධී කටයුතු මෙම ගනුදෙනුවේදී සිදුවී ඇත්දැයි පරීක්ෂා කළ යුතු බවයි.

විගණකාධිපතිගේ නිගමන අනුවත් සාමාන්‍ය අවබෝධයෙන් බැලූ බැල්මටත් ඉතා පැහැදිලි ලෙසම මහ බැංකුව පමණක් නොව රජයේ බැංකුවක් ලෙස ලංකා බැංකුවත් යොදා ගනිමින් දැවැන්ත මූල්‍ය වංචාවක් රටට සිදුකර ඇති බව මේ අනුව හෙළිදරව් වේ. මහේන්ද්‍රන් මාමා-බෑනා සමාගම මීට සෘජුවම සම්බන්ධ බව පැහැදිලිය. මාමා-බෑනා එකමුතුව මෙම ගනුදෙනුව සිදුකර ඇත්තේ අගමැති රනිල් වික්‍රමසිංහ සහ එ.ජා.ප.යේ පූර්ණ අනුග්‍රහය සහ අවශ්‍යතාවය අනුව බව අවස්ථා කිහිපයකදීම හිටපු මහබැංකු අධිපතිවරයා විසින් පිළිගෙන ඇත. නමුත් මේ සියලු වංචා කණපිට හැරවීමෙන් "යහපාලනය" පිරිසිදු කිරීමේ කුමන්ත්‍රණ ව්‍යාපාරයක්ද එ.ජා.ප.ය විසින් දැනටමත් දියත් කර ඇත. මෙය වංචාවක් නොව ආණ්ඩුව මහ බැංකුව හරහා සිදුකළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අර්ථ දැක්වීමට ඔවුන් මුල සිටම උත්සාහ කරන ලද්දේ එබැවිනි. මුලින් අගමැතිවරයා මෙම ගනුදෙනුවට කිසිදු සම්බන්ධයක් නොමැති බව ඒත්තු ගැන්වීමට සියලු ආකාරයේ උත්සාහයන් දැරූ එ.ජා.ප. නියෝජිතයින් පසුව කෝප් කමිටුවේදීද මාධ්‍ය මගින්ද මෙය අගමැතිවරයා විසින් සිදුකළ ඉල්ලීමකට අනුව මහ බැංකු අධිපතිවරයා විසින් ගනු ලැබූ තීරණයක් බව ප්‍රකාශ කිරීමේ මෙහෙයුමක් ඇරඹීය. එයට හේතුව ශ්‍රී ලංකා මහ බැංකුව බාර විෂය භාර අමාත්‍යවරයා අගමැතිවරයා බව (ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශ්‍ය යටතේ මහ බැංකුව පවතින නිසා) පසුව මතක් වීමෙනි. මහ බැංකුව බාර ඇමතිවරයා ලෙස අගමැතිවරයා මෙම තීරණය ගත් නිසා එතෙක් ක්‍රියාත්මක වූ සෘජු මිලදී ගැනීමේ ක්‍රමය වෙනුවට විවෘත වෙන්දේසි ක්‍රමය අනුගමනය කරමින් අර්ජුන මහේන්ද්‍රන් අධිපතිවරයා මෙම ගනුදෙනුව සිදුකර ඇති බැවින් අධිපතිවරයා නිවැරදි බවත් විෂය භාර ඇමති ලෙස අගමැතිවරයාට එවැනි තීරණයක් ගතහැකි බැවින් අගමැතිවරයා පිරිසිදු බවත් මේ සුද්ධ කරන්නන්ගේ තර්කයයි.

මේ තර්කය පිළිගත්තද ඉන් පසු මතුවන ගැටලු රාශියකි. පළමු කාරණය, විෂය භාර ඇමතිවරයාගේ තීරණයක් මහ බැංකු අධිපතිවරයාට පමණක් හිතුමතේට ක්‍රියාවට නැගිය නොහැකි වීමය. එම ප්‍රතිපත්ති තීරණයක් නම් එය මුදල් මණ්ඩලය විසින් මුදල් මණ්ඩලයේ තීරණයක් බවට පත්කර ක්‍රියාත්මක කළ යුතුය. මෙම වංචනික ගනුදෙනුවේදී කිසිදු අවස්ථාවක මුදල් මණ්ඩලය එවැනි ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇති බව තහවුරු නොවීය. එසේම අගමැතිවරයා විෂය භාර ඇමතිවරයා නම් මුදල් මණ්ඩලය තුළ ඔහුගේ නියෝජිතයා ලෙස ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයා සිටිය යුතුය. නමුත් මෙම තීරණය ගනු ලැබූ විටත් මේ මොහොතේත් මුදල් මණ්ඩලයේ සිටින්නේ අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයෙක් නොව මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාය. ඒ විෂය භාර ඇමති ලෙස මුදල් ඇමතිවරයාගේ නියෝජිතයා හැටියටය. එවිට මතුවන ගැටලුව අගමැති යටතේ මහ බැංකුව ක්‍රියාත්මක වීම නීත්‍යානකූලව පිළිගත හැකිද යන්නයි. එවැනි අර්බුද රැසක් එවිට යළි මතුවේ.

පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙර කලින් පැවති කෝප් කමිටුව හිටපු අධිපති ඇතුළු නිලධාරීන් කැඳවා දින 12ක් තිස්සේ ලබාගත් සාක්ෂි සටහන් වර්තමාන නව පරීක්ෂණයක් සඳහා නව පාර්ලිමේන්තුව යටතේ අදාළ කරගත නොහැකි බවට එ.ජා.ප. මන්ත්‍රීවරුන් නගන විරෝධතා තර්කයයි. ඔවුන් එවැනි තර්කයක් මතුකර ඇත්තේ මෙම මහ බැංකු බැඳුම්කරයට පමණි. එසේම විගණකාධිපතිවරයාගේ වාර්තාව ප්‍රතික්ෂේප නොකළද ඔහුගේ නිගමන ප්‍රතික්ෂේප කිරීමට (පිළි නොගෙන සිටීමට) එ.ජා.ප. මහේන්ද්‍රන්ගේ නියෝජිතයෝ කෝඳුරු තෙල් සොයමින් සිටිති. කෝප් කමිටු සාමාජිකයෙක්වත් නොවන ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයා මෙම පරීක්ෂණ නිවැරදි නොවන බවත් කෝප් කමිටුව විසින් ගනු ලබන තීරණය බෙදුණු තීරණයක් බවත් කලින්ම සමාජගත කිරීමට මාධ්‍ය හරහා වෑයම් දරන්නේද හොරාට කලින් කිරිඇල්ල වැට පනිමින්ය. එ.ජා.ප. පාලනය මහ බැංකු වංචනික ගනුදෙනුවේ සුජාතභාවයක් සෙවීමට වෙර දරන අසාර්ථක උත්සාහය දකින විට සිහිපත් වන්නේ, අසූචි ගොඩක් ඇඟිල්ලෙන් ලෙව කෑ මිනිසෙකු 'හොඳ වෙලාවට කකුලට පෑගුණේ නැත්තේ' යනුවෙන් හිත හදා ගත්තා වැනි කතාවකි. වර්තමාන එ.ජා.ප. පාලනයද යහපාලනයේ සුජාතභාවය රැක ගැනීමට වෙර දරන්නේ එවැනි ආකාරයටය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ලෙඩා මළත් බදු ඉල්ලන ආණ්ඩුවක්!

"ලෙඩා මළත් බඩ සුද්දයි" යනුවෙන් කියමනක් අපේ ජනවහරේ තිබේ. එය දැන් 'ලෙඩා මළත් බදු ඉල්ලයි' යනුවෙන් වෙනස් කිරීමට සිදුව තිබේ. ඒ වත්මන් හවුල් ආණ්ඩුව මරණාසන්න ලෙඩාගෙන් පවා වැට් බදු අයකිරීමට තීරණය කර තිබෙන නිසාය.

පසුගිය මැයි මස සිට වැට් බදු 15% දක්වා වැඩිකරමින් ආණ්ඩුව ජනතාව මත අසාධාරණ බදුබරක් පැනවීය. එය සෞඛ්‍ය, අධ්‍යාපන සහ පොදුවේ භාණ්ඩ හා සේවා රැසකට අදාළ විය. මීට එරෙහිව විශාල උද්ඝෝෂණයක් පැන නැගුණ අතර ආණ්ඩුව ඊට මුහුණ දීමට නොහැකි තත්වයකට පත්විය. යම් පිරිසක් අධිකරණයට ගියේ ඒ අතරය. වැට් බදු පැනවීමේ ක්‍රියාවලිය දෝෂ සහගත බව පැවසූ අධිකරණය නිවැරදි ක්‍රමයට වැට් බදු පනවන ලෙසත් එතෙක් වැට් බදු අයකිරීම නවතන ලෙසත් ආණ්ඩුවට උපදෙස් දෙනු ලැබීය. ජනතා විරෝධය හමුවේ කරකියාගත නොහැකිව සිටි ආණ්ඩුවට එය වෙස්වළාගත් ආශීර්වාදයක් විය. උද්ඝෝෂණද නතර විය. එහෙත් වැට්බදු බර පැටවීම නතර වූයේ නැත. එය දැන් 'නිවැරදි ක්‍රමයට' එමින් තිබේ.

වැට්බදු පැනවීම සඳහා අලුතින් ඉදිරිපත්කොට පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට යන බදු සංශෝධනයේදී සෞඛ්‍ය සේවාවට වැට් බදු අදාළ නැතැයි ආණ්ඩුව පවසා තිබේ. සෞඛ්‍ය සේවා සඳහා වැට් අය නොකරන බව කීමෙන් බද්දට එරෙහි ජනතා විරෝධය අඩුකර ගැනීමට හැකි බව ආණ්ඩුව දනී. එහෙත් එය මුළුමනින්ම ජනතාව නොමඟ යැවීමක් හා රැවටීමක් වී තිබේ.

ආණ්ඩුව වැට් අය නොකරන්නේ බාහිර රෝගීන් පෞද්ගලික රෝහල්වලින් කර ගන්නා ලේ, මුත්‍රා, පරීක්ෂණ වැනිදේ සඳහාය. ඒවා විශාල වියදම් යන ඒවාද නොවේ. එහෙත් විශාල වශයෙන් මුදල් වියදම් වන පෞද්ගලික රෝහල්වල නේවාසිකව සිට කරගත යුතු පරීක්ෂණ, ප්‍රතිකාර හා ශල්‍යකර්ම සඳහා වැට් බදු අහෝසිවී නැත. ඒවා 15% ගණනේ අයකිරීමට නියමිතය. එය ඉතා බරපතළ තත්වයකි.

මේ වනවිට බරපතළ ශල්‍යකර්ම කළ යුතු රෝග වූ, හදවත් රෝග, වකුගඩු රෝග, ස්නායු රෝග, මොළයේ විවිධ රෝගී තත්වයන් හා පිළිකා වැඩි වෙමින් තිබේ. ලංකාවේ වැඩිහිටි ජනගහනය නිරන්තරව වැඩිවෙමින් පැවතීමද වැරදි ආහාර පුරුදු හා ආහාරවල වස විස පැවතීමද මෙවැනි රෝග වැඩිවීමට හේතුවී තිබේ. ලංකාවේ වැඩිහිටි ජනගහනය, 1990 ජනගහනයෙන් 8.9%ක් වූ අතර එය 2000දී 9.6%දක්වාද 2010 දි 12.2% දක්වාද 2014දී 13.4% දක්වා වැඩිවිය. මේ වේගය අනුව 2026 වනවිට එය 18.9%ක අගයක් ගන්නා බවට උපකල්පනයකර තිබේ. මෙවැනි තත්වයක් හමුවේ ලංකාවේ රජයේ සෞඛ්‍ය සේවාව පුළුල් නොවීමත් එහි පහසුකම් අවම වීමත් නිසා බොහෝ රෝගීන්ට සිදුව ඇත්තේ පෞද්ගලික රෝහල්වලින් ප්‍රතිකාර ගැනීමටය. ඒ නිසා පෞද්ගලික රෝහල් ප්‍රමාණය වැඩිවෙමින් තිබෙන අතර ඒවායින් ප්‍රතිකර ගන්නා රෝගීන් සංඛ්‍යාවද වැඩිවී තිබේ.

ඉක්මනින්ම කළ යුතු හදවත් සැත්කම්, වකුගඩු සැත්කම්, මොළය ආශ්‍රිත ස්නායු සැත්කම්වලදී රජයේ රෝහල්වලින් ඒවා කරගැනීමට මාස ගණන් පොරොත්තු ලේඛනවල සිටීමට රෝගීන්ට සිදුවේ. එලෙස සිට තම වාරය එනවිට රෝගියා මියගොසින්ය. ඒ නිසාම මුදල් තිබුණත් නැතත් ජනතාව හදිසි සැත්කම් හා ප්‍රතිකාර සඳහා පෞද්ගලික රෝහල් වෙත පැමිණේ. මෙලෙස පැමිණෙන බොහෝ දෙනා මහා ධනපතියන් නොවේ. මැද පංතියේ හා දුප්පත් අය මේ අතර බොහෝය. සමහරු ශල්‍යකර්ම සඳහා මුදල් උපයාගන්නේ ඉඩම් උගසට තබා දේපළ විකුණා, හතර අතට ණය වීමෙනි. තවත් සමහරු ශල්‍යකර්මයට අවශ්‍ය මුදල් සෙවීමට මහ මඟට බැස මුදල් සම්මාදමේද යති. ජීවිතය හා මරණය අතර සටනක් කරන තම රෝගියාගේ දිවි බේරා ගැනීමට දේපළ උගසට තබා, රටට ණයවී, මුදල් සම්මාදමේ ගොස් පෞද්ගලික රෝහලට පැමිණෙන විට රෝගියාගෙන් ආණ්ඩුව 15%ක බදු ගැනීම ඉතාම අසාධාරණය. එය කිසිදු ආචාර ධර්මයකට එකඟ නැත.

ආණ්ඩුව මේ වනවිට පෞද්ගලික රෝහල්වලින් 17.5% ආදායම් බද්දක් අයකර ගනී. එය ගෙවන්නේ රෝහල් අයිතිකරුවන්ය. එහෙත් වැට් බද්ද ගෙවිය යුත්තේ රෝගියාය. එය සුළුපටු ප්‍රමාණයක් නොවේ.

සාමාන්‍යයෙන් ලංකාවේ හදවත් සැත්කමක් සඳහා පෞද්ගලික රෝහලකදී රු. 6,98,000ක් පමණ වැයවේ. ඊට 15% වැට් බද්ද රු.1,04,000ක් පමණ වේ. එවිට ශල්‍යකර්මයේ මුළු වියදම රුපියල් ලක්ෂ 8ක් පමණ වේ. ස්නායු ශල්‍යකර්මයක් කිරීමට සාමාන්‍යයෙන් ලක්ෂ 10ක් පමණ වැයවන අතර එවිට ගෙවිය යුතු වැට් බද්ද පමණක් ලක්ෂ එකහමාරක් පමණවේ. තම රෝගියාගේ ජීවිතය බේරාගැනීමට ගේ දොර උගසට තබා හිඟමනේ ගොස් මුදල් ටිකක් සොයාගෙන එන පීඩාවට පත් ජනයාගෙන් ආණ්ඩුව රුපියල් ලක්ෂයක්, ලක්ෂ එකහමාරක් බදු ගැනීම කිසිලෙසකින් සාධාරණය කළ නොහැක. ආණ්ඩුවට හා එහි නායකයන්ට හදවත් තිබේ නම් රෝගීන්ට බදු ගැසීමට කල්පනා කරන්නේ නැත. එහෙත් ධනපති ආණ්ඩුවලට හිත් පිත් නැත. මොවුනට හොඳ නරක කියාදීමද ඵලරහිතය. මන්ද ධනපති පාලනය යනු හදවතක් නැති කෲර පාලනයක්ම වන බැවිනි.

මේ තත්වය තුළ මෙම අසාධාරණ බදුබරට එරෙහිව මෙරට ජනයා නැගී සිටිය යුතුය. ආණ්ඩුවේ නාස්තිකාර වියදම් වෙනුවෙන් මරණාසන්න රෝගියා පවා බදු ගෙවිය යුතු නැත. වැට් බද්ද පැනවීම නැවැත්වීම සඳහා සටනට පණ පොවන අතර මෙම හදවතක් නැති, තෙතමනයක් නැති, සදාචාරයක් නැති සමාජ ක්‍රමය පැරදවීම සඳහා වූ සටනටද පණ පෙවිය යුතුය. ඒ හැර ජනතාවට අන් මඟක් නැත.

# ජ.වි.පෙ. ගොඩනගන පොදුජන මධ්‍යස්ථානය 2020දී රටේ අනාගතය තීරණය කරාවි!



**ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා**

***නියමුවා:- හවුල් ආණ්ඩුවට වසරක් ඉක්ම යද්දී ඔවුන් විකිණීමත් බිලිදීමත් තමන්ගේ ආර්ථික ප්‍රතිපත්තිය බවට පත්කර ගෙන ඇති බව පේනවා. මෙය විසින් ජනතා අපේක්ෂා සමග ඇති කරනු ලබන පරස්පරය ඔබ තේරුම් ගන්නේ කොහොමද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** වර්තමාන මෛත්‍රී-රනිල් ආණ්ඩුව පැත්තෙන් කරගෙන යන ආර්ථික ක්‍රියා පිළිවෙත සම්බන්ධව ගත්තොත් මූලික කරුණු දෙකක් තියෙනවා. එකක් මේ ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ ලංකාවෙ සහ ලෝකෙ පුරා පොදුවේ ධනපති ක්‍රමය මූණදී තියෙන අර්බුදය. ඒ තමයි මුළු ලෝකයම ආර්ථික වර්ධනය බිඳ වැටී තියෙනවා. අපනයන, නිෂ්පාදන බිඳවැටී තියෙනවා. ආර්ථිකය දුර්වලවීම නිසා ජනතාව විසින් භාණ්ඩ හා සේවාවන් පරිභෝජනය කිරීමත් අඩුවෙලා. නමුත් ලෝකෙ ආර්ථික වර්ධන වේගය දුර්වලවීම විසින් ලෝකෙ ධනය ගොඩ ගැසීම නැත්නම් ලෝකයේ වටිනාකම් නිෂ්පාදනයවීම විශාල වශයෙන් නතරවෙලා තියෙනවායැයි අපි මෙයින් කිසිසේත්ම හිතන්න හොඳ නැහැ. දැනුත් ලෝකය 0.1%කින් වර්ධනය වෙනවා. එතකොට ප්‍රශ්නය අපේ රටෙ අදාළව ගත්තොත්, ආණ්ඩුව සුවිශාල රාජ්‍ය ණය අර්බුදයකට, විශාල විනිමය හිඟයකට, නිෂ්පාදන බිඳ වැටීමකට මුහුණදී තියෙනවා. අපනයන බිඳවැටී තියෙනවා.

මේ ඔක්කොම ඇතුලෙ ධනපති පංතියේ දේශීය හා විදේශීය ඉතාම ඉහළ මට්ටමේ ධනපතියන් පිරිසක් විසින් රටේ ආර්ථිකය කොල්ලකමින් සිටිනවා. ඒ නිසා ලෝක ධනපති ක්‍රමයේ අර්බුදයත් අපේ රටේ ධනපති ක්‍රමයේ අර්බුදයේ ස්වභාවයත් විසින් තමයි විකිණීම සහ බිලිදීම කියන දේ වෙන්නේ. අපි විකිණීම ගත්තොත් ආණ්ඩුව රාජ්‍ය දේපළ වරාය, තෙල් ටැංකි, ඉඩම් වගේ ඒවා පමණක් නොවෙයි, ලාභ ලබන ආයතන පවා විකුණනවා. උදාහරණ වශයෙන් වරායේ නැගෙනහිර ජැටිය ගත්තොත් පැහැදිලිවම ආණ්ඩුවට ලාභ ගන්න පුළුවනි. නමුත් විකුණනවා. විකිණීමේ අරමුණ පැහැදිලිවම තියෙන්නෙ දේශීය හා විදේශීය ධනපතියන්ට අවශ්‍යයි, ලාභය ගැන කිසිදු අනතුරක් ගන්නේ නැතුව තමන්ගෙ ප්‍රාග්ධනය ආයෝජනය කරන්න; ලාභ ගන්න පුළුවන් තැන්වල ව්‍යාපාර අත්පත් කර ගන්න. ඒ නිසා තමයි 1000%ක් ලාභ ලැබිය හැකි කියල පැහැදිලිවම පේන කොළඹ වරායෙ නැගෙනහිර පර්යන්තය විකුණන්නෙ.

එක පැත්තකින් ණය අර්බුදය විසඳා ගැනීම සඳහා ආණ්ඩුවට විකුණන්න සිද්ධ වෙලා. අනික් පැත්තෙන් තමන්ගේ පංතියේ ප්‍රබලයින්ට ජනතාවගේ දේපළ ලබාදීම මගින් ලාභ ගොඩගැසීමේ වුවමනාවත් මේක ඇතුලෙ තියෙනවා. දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ බදු එකතුකිරීම පෞද්ගලික සමාගමකට දෙන්න යනවා. බදු එකතුකිරීම ගැන අවුරුදු 100 වැඩි අත්දැකීම් තියෙන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බිලිදීම සිද්ධ වෙන්නෙ ඒ ආකාරයට.

> "එක පක්ෂයකටවත් අධික බලයක් නොමැතිවීමේ වාසිය ජ.වි.පෙ. අපි දකිනවා. හැදෙන අලුත් ව්‍යවස්ථාවක් තුළට යම් ජනතා අයිතිවාසිකම් ප්‍රමාණයක්, ප්‍රගතිශීලී නීති ප්‍රමාණයක් එකතු කර ගන්න ජ.වි.පෙ. අපි මැදිහත් වෙමින් ඉන්නවා. රටේ ප්‍රශ්න සියල්ල විසඳෙනවා යැයි ව්‍යවස්ථාව කරේ තියාගෙන යන්න අපි සූදානම් නැහැ."

බිලිදීමේ තවත් පැත්තක් එට්කා සහ ට්‍රාන්ස් පැසිපික් වැනි ගිවිසුම් මගින් සිදු වෙනවා. රටක් වශයෙන් අපට ආර්ථික ස්වෛරීත්වයක් තිබිය යුතුයි. ධනේශ්වර ආර්ථිකයක් වශයෙන්වත් යම්කිසි නෛතික ආරක්ෂාවක් අපේ රටටම අනන්‍ය තීන්දු තීරණ ගැනීමේ බලයක් ලබාගත යුතුයි. ඒත් එට්කා සහ ට්‍රාන්ස් පැසිපික් වැනි ගිවිසුම්වලින් අපේ රටේ අනාගත ආර්ථික ස්වෛරීත්වය අත්හරිනවා. ඒ නිසා ඇත්තටම මේ දෙක එක පැත්තකින් ධනපති ක්‍රමයේ අර්බුදය. අනෙක් පැත්තෙන් ඒක තමයි වත්මන් ධනපති ආණ්ඩුවල ස්වභාවය. ඔවුන්ට මේ වෙනුවෙන් තර්ක, හේතු නැහැ. ඇත්ත හේතුව රටට කියන්නත් බැහැ. තමන්ගේ හිතවතුන්ට ලාභ ගැනීමට රාජ්‍ය ප්‍රත්පත්ති සකස්කිරීම කියන්නත් බැහැ. මෛත්‍රී-රනිල් ආණ්ඩුව ඇතුළෙත් පැහැදිලිවම සිදුවෙන්නේ පසුගිය කාලෙ වගේම ඒ විකිණීම සහ බිලිදීම තමයි. ඒ නිසා අපි රටක් වශයෙන් මේ විකිණීමටත් බිලිදීමටත් විරුද්ධව පෙළගැසීම අනිවාර්යයෙන්ම කළ යුතු වෙනවා. මේ වෙනකොටත් වරාය, ඛනිජතෙල් වෘත්තීය සමිති ඉදිරියට ඇවිත් තිබෙනවා. විකිණීම හා බිලිදීමට විරුද්ධව වෘත්තීය සමිති පෙළගස්වන්න වෘත්තීය සමිති මධ්‍යස්ථානය මැදිහත්වී සිටිනවා. අනිවාර්යයෙන්ම ආණ්ඩුව සහ වැඩකරන ජනතාව අතර බරපතළ ගැටුමක් ඇතිවීම වළක්වන්න බැහැ. මේ ආර්ථික ක්‍රියාමාර්ග නිසා ජනතාව මේ ආණ්ඩුවෙන් වේගයෙන් ඉවත්වෙමින් ඉන්නවා.

***නියමුවා:- නව ව්‍යවස්ථාව පිළිබඳ සාකච්ඡාවක් ඒ සම්බන්ධ නිල ක්‍රියාවලිය තුළත් සමාජය තුළත් සිදුවෙමින් තිබෙනවා. නව ව්‍යවස්ථාව සම්බන්ධයෙන් සමාජය තුළ මතු කෙරෙමින් පවතින කරුණු දැඩි ලෙස විවාද සම්පන්නයි. මේ පිළිබඳ සත්‍ය තත්වය කුමක්ද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** දැනට පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියක් සිදුවෙනවා. මීට මාස 8කට කලින් අනුමත කරපු ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයක් සහ ව්‍යස්ථා සකස්කරන අනුකමිටු 06කුත් ව්‍යවස්ථාව සම්බන්ධව වැඩකටයුතු ආරම්භ කර තිබෙනවා. ඒ කමිටු තුළ පාර්ලිමේන්තුවේ

15 වැනි පිටුවට






# Yes We Can

## බාහිර උපාධි කප්පාදුවට එරෙහි පෙරමුණක් ගොඩනගමු!

අපේ රටේ තරුණ තරුණියන් හැමදාම සිහින පොදියකට උරුමකම් කියයි. ඉගෙන ගැනීම ඔවුන්ගේ සිහිනයකි."ඉගෙන ගත්තොත් තමයි හොඳ ජොබ් එකකට පැනගන්න පුළුවන්" අපේ රටේ තරුණ තරුණියන් අතර ඇත්තේ එවැනි මතයකි. ඒක නිසා තමයි ඉගෙන ගන්න මේ තරම් යුද්ධයක් තියෙන්නේ. ඒකේ අවසාන ඉලක්කය උපාධියක් හිමිකර ගැනීමයි. හැම අවුරුද්දකම උසස් පෙළ විභාගය සඳහා 250,000ක් පමණ පෙනී සිටිති. ඉන් 150,000ක් පමණ සමත් වුවත් විශ්වවිද්‍යාලයට ඇතුල් වීමට අවස්ථාව හිමිවන්නේ 25,000ක් වැනි සුළු පිරිසකට පමණයි. එවිට අපේ රටේ අධ්‍යාපන ක්‍රියාවලිය තුළ උසස් පෙළ විභාගය සමත් වූ පිරිසෙන් තවත් 125,000ක්ම ඒ අවස්ථාව අහිමි වුණු අධ්‍යාපනයේ අනාථයින් බවට පත්වේ. ඉදින් ඒ තරුණ පිරිසේ ඉතිරි වූ ඊළඟ බලාපොරොත්තුව "බාහිර උපාධියකින් ගොඩ යාමය."

එහෙත් අද වෙනවිට තරුණ තරුණියන්ට තිබුණු ඒ අවසාන බලාපොරොත්තුවත් සිහිනයක් බවට පත්වෙමින් තිබේ. අපේ රටේ බාහිර උපාධි අධ්‍යාපනයට කණකොකා හැඬවෙන්නට පටන් ගත්තේ දැනට අවුරුදු කිහිපයකට ඉහතදීයි. ඒ මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පාලන සමයේදීයි. වර්ෂ 2010 සිට 2014 දක්වා කාලය තුළ මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන්ම නතර කර දමනු ලැබිණි. එහෙත් ඒ මොහොතේ දී ශිෂ්‍යයන්, ගුරුවරුන් මෙන්ම අධ්‍යාපනය සම්බන්ධව ප්‍රගතිශීලී මතයක් දරන සියලු දෙනාත් මෙන්ම සමාජවාදී තරුණ සංගමය ලෙස අපත් එක් වී ඊට එරෙහිව ගත්ත දැවැන්ත උද්ඝෝෂණ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් විදියට 2014 වසරේ සිට නැවත මෙම පාඨමාලා ක්‍රියාත්මක කරන්නට පටන් ගෙන තිබෙනවා. නමුත් ඒ දැඩි කොන්දේසි මතයි. නිදසුනක් ලෙස ගතහොත් රුපියල් 6000ක් වෙලා තිබුණු පාඨමාලාව රුපියල් 72,000 දක්වා මිල වැඩි වී තිබිණි. එහෙත් ඒ තත්වය තුළ හෝ එම පාඨමාලාව ඉදිරියට ගෙන ආවත් දැන් නැවතත් මේ යහපාලනයැයි කියා ගන්නා මෛත්‍රී - රනිල් හවුල් ආණ්ඩුව විසින් කරමින් ඉන්නේ කුමක්ද? අද වන විට කැළණිය සරසවියට විශේෂ උපදෙස් පත්‍රිකාවක් හරහා දැනුම් දී තිබෙන්නේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වන අභ්‍යන්තර සිසුන් ප්‍රමාණයට සමාන පිරිසක් බාහිරව බඳවා ගන්නා ලෙසයි. එනම් විශ්වවිද්‍යාලයට අභ්‍යන්තරිකව 1000ක් දෙනා ඇතුළත් කර ගන්නේ නම් බාහිරවත් ඇතුළත් කරගත හැක්කේ 1000ක් පමණක් බවයි.

නමුත් ආණ්ඩුව විසින් තමන්ගේ මේ තක්කඩි ක්‍රියාවලිය වසන් කිරීම සඳහා ගෙන එන තර්කය වන්නේ "රාජ්‍ය විශ්වවිද්‍යාලවලින් වසරකට පිටවන උපාධිධාරීන් ප්‍රමාණය දෙගුණයක් කර ගැනීම රජයේ අරමුණ වී ඇති බවයි." බැලූ බැල්මට ගැටලුවක් නොපෙනුණද මෙය හොඳින් අධ්‍යයනය කළහොත් මේ තුළ ආණ්ඩුවේ සහ අදාළ බලධාරීන්ගේ සටකපට වුවමනාව හඳුනා ගත හැකිය. උදාහරණයක් ලෙස ගතහොත් කැළණිය විශ්ව විද්‍යාලයට 2006 වසරේ දී බාහිර අයදුම්පත් 11,082ක් ලැබී තිබූ අතර ඉන් උපාධිය හිමිකරගෙන ඇත්තේ 1158ක් පමණි. ඒ වගේම 2007 දී ගතහොත් 13,959 ක් වූ අයදුම්කරුවන් අතරින් උපාධිය ලබාගෙන ඇත්තේ 2057ක් පමණි. 2008 දීත් 12656ක් වුණු අයදුම්කරුවන් අතරින් උපාධිය ලබාගෙන ඇත්තේ 3518ක් පමණි. 2009දීද අයදුම්කරුවන් 16,704ක් අතුරින් උපාධිය ලබාගෙන ඇත්තේ 2100 දෙනෙක් පමණි. ඒ වගේම 2010 වසරේදීත් අයදුම්කරුවන් 15,400ක් අතුරින් උපාධිය සම්පූර්ණ කර ඇත්තේ 1994ක් පමණි. ඒ අනුව ලියාපදිංචි කිරීම් සංඛ්‍යාවෙන් 10%කට ආසන්න ප්‍රමාණයක් පමණක් උපාධිය සම්පූර්ණ කර ඇති බව පැහැදිලිය. එබැවින් උපාධිධාරීන් ප්‍රමාණය වැඩි කිරීමට ආණ්ඩුවට සැබෑ වුවමනාවක් තිබෙන්නේනම් මේ එයට ලියාපදිංචිය සීමා කිරීම විසඳුමක් නොවන බවට සැකයක් නැත.

අධ්‍යාපනයට 6%ක් වෙන් කිරීමේ ප්‍රතිපත්තිය පිළිගනිමින් තරුණ තරුණියන්ගේ අධ්‍යාපන අයිතිය තහවුරු කිරීම සඳහා රාජ්‍ය මැදිහත් වීම ඉහළ දැමිය යුතු බව මැතිවරණයට පෙර පිළිගත් ආණ්ඩුවක් මෙවැනි ක්‍රියාවලියකට අවතීර්ණ වීම කිසිසේත්ම අනුමත කළ නොහැකිය. ආණ්ඩුව කළ යුතුව තිබුණේ බාහිර උපාධි පාඨමාලා ගාස්තු පහත දමමින් ඊට සිසුන් බඳවා ගැනීම සඳහා තිබූ සීමාවන් ඉවත් කිරීමයි. නමුත් මේ ක්‍රියාවලිය හරහා ආණ්ඩුව සිදු කරමින් ඉන්නේ අධ්‍යාපනය කප්පාදු කිරීමයි. එසේම අධ්‍යාපනය ලබා දීම සඳහා වන රජයේ පංගුව අඩු කරමින් පෞද්ගලික අංශය සඳහා වැඩි වැඩියෙන් ඉඩකඩ විවර කරවීමයි. බාහිර උපාධි පාඨමාලා සඳහා වන රුපියල් 60,000 ගාස්තුවද ඉතා අපහසුවෙන් ගෙවා දමනා දෙමව්පියන් සිටිනා රටක ලක්ෂ 120ක් දී උපාධි ලබාගත හැක්කේ කොපමණ සුළු සංඛ්‍යාවකටද යන්න ගැටලුවකි. මේ අධ්‍යාපන කප්පාදු ක්‍රියාවලිය වහා හකුළාගත යුත්තේ ද එබැවිනි. එසේම කැළණිය විශ්වවිද්‍යාලය සඳහා 2014 වසර වෙනුවෙන් රුපියල් 1500 ගණනේ ගෙවා අයදුම්පත් එවූ තරුණ තරුණියන් 14,000ක් පමණ සිටියත් මේ ක්‍රමයට අනුව ඇතුළත් කරගත හැකිව ඇත්තේ සිසුන් 2160ක් පමණි. මෙයින් බොහෝ සිසුන් අවුරුදු එකහමාරක් දෙකක් තිස්සේ එකී පාඨමාලාව සඳහා උපකාරක පංති සඳහාද ගොස් ඇත. එහෙත් දැන් කිසිදු දැනුම් දීමකින් තොරව ආණ්ඩුව විසින් මේ සිසු කප්පාදුව සිදුකරමින් ඉන්නේ කිසිදු හිරිකිතයකින් තොරවය.

"යහපාලනය" යැයි කියන නිල් - කොළ හවුල් ආණ්ඩුව විසින් උත්සහා කරමින් සිටින්නේ, අපේ රටේ අහිංසක දුප්පත් අම්මා තාත්තාගේ දරුවන්ට උපාධියක් හිමිකර ගැනීම සඳහා තිබෙන අයිතියට පහර ගැසීමටය. එබැවින් දැන් කළ යුතුව ඇත්තේ නිහඬව නොසිට ඊට එරෙහිව පෙරමුණක් ගොඩනැගීමයි. අසාධාරණයට පත් වූ සමස්ත ශිෂ්‍ය ප්‍රජාවටත්, ගුරුවරුන්ටත්, අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රගතිශීලී මතයක් දරන්නා වූ රටේ සියලු දෙනාටත් ආරාධනා කරන්නේ ඒ වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය සමඟ අත්වැල් බැඳගන්නා ලෙසයි.

# CHE
## අධිරාජ්‍යවිරෝධී සටන්කරුවා...

චේ සිය භාවිතාව තුළ පෙන්වන ලද අසමසම විප්ලවීය ගුණයන් හේතුවෙන් ලොව පුරා බොහෝ තරුණ විප්ලවාදීන් චේ තම පරමාදර්ශය කොටගෙන ගන්නවා. ඔහු තුළ ධනවාදී සමාජය වෙනස් කිරීම සඳහා වන වුවමනාවත් අධිරාජ්‍යවාදය පැරදවීමේ වුවමනාවත් නිසග ලෙසම එකට වෙලී තිබුණා. ඒ සඳහා ඔහු සිය ජීවිතය නොතකා ඒ වෙනුවෙන් තමට කළ හැකි උපරිම දේ කළ කෙනෙක් අද දවස ගැන සිතනවිටද වත්මන් සමාජය වෙනස් කිරීම අත්‍යවශ්‍ය කාර්යය බවට පත්ව තිබෙනවා. වත්මන් ධනවාදී සමාජය යනු අධිරාජ්‍යවාදය විසින් හසුරුවනු ලබන්නක් බව සමාජය දෙස විචක්ෂණශීලීව බලන ඕනෑම අයෙකුට තේරුම් ගත හැකියි. බැවින් වර්තමාන සමාජය වෙනස් කිරීම උදෙසා මැදිහත්වන ඕනෑම විප්ලවවාදීයෙකු එය අධිරාජවාදයටද එරෙහි සටනක් ලෙස ගත යුතුව තිබෙනවා. චේ වැන්නකුගේ ආදර්ශය වර්තමානයේදී අපට අත්‍යාවශ්‍ය වී ඇත්තේද එබැවිනුයි. ඔහු වැන්නෙකුගේ භාවිතය වත්මන් සමාජය වෙනස්කරන්නෙකුට හැමවිටම මඟ කියනු ඇති.

චේ 50 දශකයේ මුල්භාගයේ ලතින් ඇමරිකාව පුරා යතුරුපැදියකින් ගමන් කරමින් සිදුකළ සංචාරය ඔහුගේ ජීවිතය බොහෝ වෙනසකට ලක්කිරීමට හේතු වූවා. පීඩිත ලතින් ඇමරිකානුවන්ගේ ජීවිත තුළින් ලද අත්දැකීම තමාද ලතින් ඇමරිකානුවෙක්ය යන හැඟීම ඔහු තුළ තදින් ඇතිකළා.

මෙක්සිකෝවට ගිය චේට මෙක්සිකොවේ කියුබානු සංක්‍රමණිකයන් මගින් රාහුල් කස්ත්‍රෝවත් ෆිදෙල් කස්ත්‍රෝවත් මුණගැසුණා. චේ, ෆිදෙල් ඇතුළු පිරිස නියැලෙමින් සිටි සටනට එක්වීමට එක සිතින් කැමැත්ත පළකළා. ලතින් ඇමරිකාව පුරා සිදුකළ සංචාරයේ අත්දැකීම් විසින් ඔහුට ඕනෑම රටක විප්ලවය වෙනුවෙන් සටන් කළ හැකි ජාත්‍යන්තරවාදී ජීවගුණය සපයා තිබුණා.

ෆිදෙල්ගේ කියුබාව නිදහස් කරගැනීමේ සටනට එක්වූ තරුණ සටන්කාමී චේ ගරිල්ලා සටනේදීද ඉතාමත් දක්ෂ ආදර්ශමත් ගරිල්ලා භටයෙකු බවට පත්වුණා. ඔහුගේ නිර්භීතකම, සටනේදී පෙරමුණ ගැනීම විසින් වඩාත් තහවුරු වුණා. ගරිල්ලා සටනේදී ඔහු දැක්වූ දක්ෂතා මත වයස අවු. 29දී ඔහු ගරිල්ලා හමුදාවේ ඉහළම තනතුරක් වන මේජර් තනතුර දක්වා පිදෙල් කස්ත්‍රෝ විසින් උසස් කරනු ලැබූවා.

සටනේදී චේ සිදුකළ කැපකිරීම කොතරම්ද යන්න ගරිල්ලා ව්‍යාපාරයත් කියුබානු ජනතාවත් දැනසිටියා. ඔහු එහිදී ලබාදුන් නායකත්වය නිසා කියුබානු ජනතාවගේ නොමඳ අදර ගෞරවයට පාත්‍ර වුණා.

විප්ලවයේ ජයග්‍රහණයෙන් පසු කියුබානු රජයේ නිලයන් කිහිපයක් ඔහුට හිමිවුණා. සතුරා අවනත කළ හැකි ආකාරයේ චතුර කථිකත්වයත් අධිරාජ්‍යවාදයට දරුණු විවේචනයක් ගෙන දෙන්නෙකු ලෙසත් හවානාවේ යුද නායකත්වය ඔහුට හිමිවුණා. ඉඩම් ප්‍රතිසංස්කරණ දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තුවේ කර්මාන්ත මණ්ඩලයේ ප්‍රධානියා ලෙස පත්කෙරුණා. බහුතර ජනතාවකට ප්‍රතිලාභ ලැබෙන අන්දමේ ඉඩම් ප්‍රතිසංස්කරණයක් කිරීමේ වගකීම භාරගනිමින් කටයුතු කළා. ජාතික බැංකුවේ ප්‍රධානියා ලෙස කටයුතු කළා. දේශපාලන ආත්ම ශක්තිය නොමැතිකම නිසා තාක්ෂණ ශිල්පීන් හා මූල්‍ය ප්‍රවීණයින් රට හැරයද්දී චේ එම තනතුරු ස්වේච්ඡාවෙන් භාරගත්තා. ආර්ථික විශේෂඥයින් අවශ්‍ය වෙලාවට ඔහු එය භාරගෙන කටයුතු කළා. වරක් ඔහුගෙන් ඔබ ආර්ථික විශේෂඥයෙකුද යන්න විමසූවිට ඔහු ඒ ගැන පැවසූයේ, 'නැහැ මම කොමියුනිස්ට්වාදියෙක් කියලයි'. ළදරු කියුබානු ආණ්ඩුවට වසක් පිරීම සමගම ඌරුබොක්ක ඇමරිකන් අධිරාජ්‍යවාදීන්ගේ ආක්‍රමණය එල්ල වෙමින් තිබුණු අතර ඊට එරෙහිව ජනතාව සූදානම් කරමින් ආක්‍රමණික ඇමරිකානු හමුදා මුළුමනින්ම පරාජයට පත් කෙරුණා. එය ලතින් ඇමරිකාවේදී අධිරාජ්‍යවාදීන් මුහුණදුන් පළමු පරාජය මෙන්ම අධිරාජ්‍යවාදීන් මුහුණ දුන් දරුණුතම පරාජයක් වුණා. එම සටනේදී කියුබානු ජනතාව සූදානම් කරමින් චේ ඇමරිකානු ආක්‍රමණයට එරෙහි පෙරමුණ ගෙන සටන් කළා.

චේ කියුබාවේ කර්මාන්ත ඇමතිවරයා ලෙස සමාජවාදය ගොඩනැගීමේ ක්‍රියාවලියේදී මුල පටන් ආර්ථිකය ගොඩනැගීමට සිදුවුණා. එය ඔහුට තවත් සියාරාමහේස්ත්‍රාවක් වුණා. ඇමරිකානු සම්බාධක හමුවේ තම ආර්ථිකය පවත්වාගැනීමේ අභියෝගයට මුහුණ දෙමින් භෝග විවිධාංගීකරණ වැඩපිළිවෙළ ක්‍රියාවට නැගූ අතර එය සාර්ථක කරගත්තා. චේ තමන්නට ලබුණු කිසිදු නිලයක් වරප්‍රසාද වෙනුවෙන් පාවිච්චි නොකළ අතර චේ තමාට ලැබුණු ඉතා සුළු වරප්‍රසාදයන් පවා ප්‍රතික්ෂේප කළා. කියුබානු විප්ලවයේ නියමුවකු ලෙස රාජතාන්ත්‍රික කටයුතුවල නියැලෙන්නට පටන්ගත්තා. කියුබාව නියෝජනය කරමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහා සමුළුවට සහභාගි වුණා. එහිදී ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ම්ලේච්ඡත්වය හෙළිදරවු කරමින් එය විවේචනය කළ චේ, තෙවැනි ලෝකයේ රටවල් අධිරාජ්‍යවාදී ග්‍රහණයෙන් මිදී විමුක්තිය උදාකරගැනීම යුක්ති සහගත බව තරයේ අවධාරණය කළා. චේට එහිදී විශාල පිළිගැනීමක් තුන්වන ලෝකයේ රටවල නියෝජිතයින් ගෙන් හිමි වුණා.

ඒ අනුව ක්‍රියාත්මක වූ චේ තම තනතුරු හා වගකීම්වලින් ඉවත්ව 1965 දී සැබෑ ජාතන්තරවාදියෙකු ලෙස ලෝකයේ වෙනත් රටවල විමුක්තිකාමී අරගලයන්ට දායක වීමට සටන් පෙරමුණට ගියා. ඒ අනුව ඔහු කොංගෝවට පැමිණියා. 1966 දී සෙබළ පිරිසකට ආයුධ පුහුණුව ලබාදී අරගලයක් ඇරඹීම වෙනුවෙන් බොලිවියාවට ගිය චේ 1967 ඔක් 8 වන දා බොලීවියානු හමුදා සමග සටන් කරමින් සිටියදී අත්අඩංගුවට පත්ව මිය ගියද ලොව පුරා තරුණ විප්ලවාදීන් තුළ ඔහු අදටද ජීවත්ව සිටිනවා.

අද දවසේ කාර්යභාරයවී ඇති ලාංකේය සමාජය වෙනස්කිරීමේ කාර්යයේ නියැලී සිටින ජනතා විමුක්ති පෙරමුණත් එහි තරුණ අංශය වන සමාජවාදී තරුණ සංගමයත් ඔක්තෝබර් 08 දිනට යෙදෙන චේ දිනය සැමරීමෙන් ඔබ්බට යමින් ලාංකේය සමාජයට චේ ගත් මඟ විදහාපාමින් බොහෝ පිරිසක් සමග මෙවරත් එම අත්දැකීම් බෙදාගැනීමට සූදානම්ව සිටිනවා.





### ස්මරණ....

තලා පොඩි කර නැසූ මොහොතේ
තැනින් තැන මල් පොකුරු වැළලේ
දමා පෙරළා දැමූ පොළවේ
ගසට පොවනා රුහිරු ඉහිරේ
කඩා සිඳ බිඳ දැමූ චෑක්ෂේ
සොයා ගිය සුණු විසුණු මැද්දේ
නුඹේ නමත් රතු මලක ලියවේ.....

නිම්මි

# හවුල් ආණ්ඩුවේ පරස්පරය



පසුගිය සැප්තැම්බර් 04 දා ශ්‍රී.ල.නි.ප.ය (මෛත්‍රී පාර්ශවය) කුරුණෑගලදී තම සමුළුව පැවැත්වීය. එහිදී ශ්‍රී.ල.නි.ප. සභාපති මෛත්‍රීපාල සිරිසේන මහතා ප්‍රකාශ කර තිබුණේ මීළඟ මැතිවරණවලදී ශ්‍රී.ල.නි.ප.ය 'අත' ලකුණින් තරග වදින බවත් ශ්‍රී.ල.නි.ප.යේ ආණ්ඩුවක් පිහිටුවීම තම අරමුණ නිසා පක්ෂය ඊට සූදානම් කළ යුතු බවත්ය. ඒ අතර සැප්. 10 වනදා බොරැල්ලේදී තම සංවත්සරය පැවැත්වූ එ.ජා.ප.යද පවසා තිබුණේ ඉදිරියේදී යූ.ඇන්.පී. ආණ්ඩුවක් හැදීමට සූදානම් වන ලෙසය. මෙම ප්‍රකාශ දෙකම බරපතළ ප්‍රතිවිරෝධතාවක් නිර්මාණය කරන ප්‍රකාශයන් වන අතර මෙම පක්ෂ දෙකේම නායකයෝ එම ප්‍රතිවිරෝධය ගැන කිසිදු පැහැදිලි කිරීමක් කිරීමටද අසමත්ව සිටිති.

මෙම ප්‍රතිවිරෝධය හෙවත් පරස්පරය කුමක්ද? වත්මන් ආණ්ඩුව එ.ජා.ප - ශ්‍රී.ල.නි.ප හවුල් අණ්ඩුවකි. මෙම ආණ්ඩුව පවත්වාගෙන යාමේදී මෛත්‍රීපාල ජනාධිපතිවරයා නිතර පවසන්නේ මෙම ආණ්ඩුව ප්‍රතිපත්තිමය පදනමක් මත ගොඩ නැගුවක් බවත් රට හැදීම එහි අරමුණ බවත් මේ ආණ්ඩුව සිය පස්වසරක කාලය රට පාලනය කරන බවත්, එය බිඳ දැමීමට කිසිවකුටත් ඉඩ නොදෙන බවත් අවුරුදු 05න් පසුද එක්ව රටපාලනය කිරීමට තමන් සූදානම් බවත්ය. ඒ අතර අගමැති රනිල් වික්‍රමසිංහ මහතාද නිතර පවසන්නේ ජනාධිපති මෛත්‍රීපාල මහතා මූලිකත්වයේ තබාගෙන රට හැදීමේ කාර්යය කරන බවත් මෙම ආණ්ඩුව බිඳ නොවැටෙන බවත් මෙය ප්‍රතිපත්තිමය අරමුණු මත එක්ව රට පාලනය කිරීමේ හොඳම ආදර්ශය බවත්ය. වරෙක එලෙස පවසන ඔවුන්ම තවත් විටෙක තම තමන්ගේ පක්ෂවල තනි ආණ්ඩු හදන බව පවසති.

මෙම ප්‍රකාශයන් වර්ග දෙක එකිනෙකට පරස්පරය. රට හැදීමට තිබෙන හොඳම ආණ්ඩුව මෙම හවුල් ආණ්ඩුව නම් මෙය පවතින්නේ රට හැදීමේ ප්‍රතිපත්තිමය එකඟතාවය මත නම් ඊළඟ ඡන්දයේදී තනිකර ශ්‍රී.ල.නි.ප. ආණ්ඩුවක් හදන බවට මෛත්‍රීපාල මහතාත් තනිකර යූ.ඇන්.පී. ආණ්ඩුවක් හදන බවට රනිල් මහතාත් කරන කථා ප්‍රතිවිරෝධීය. ශ්‍රී.ල.නි.ප හෝ යූ.ඇන්.පී තනි ආණ්ඩුවක් හැදිය යුත්තේ, හවුල් ආණ්ඩුව වැඩකට නැති එකක් නම්ය. එවිට වත්මන් හවුල් ආණ්ඩුව අසාර්ථක පාලනයක් බව ජනාධිපතිවරයාත්, අගමැතිවරයාත් පිළිගත්තා බවට පත් වේ. එහෙත් ඔවුන් එසේ පිළිගන්නේ නැත. එසේ නම් තනි පක්ෂ ආණ්ඩුවක් හදන්නේ ඇයි? ඊටද පිළිතුරක් නැත. එකම විට, එකම වේලාවේ හවුල් ආණ්ඩුවේ ගුණ වයමින් එය ආරක්ෂා කිරීමට කතා කරන අතරම තම තමන්ගේ පක්ෂවල තනි ආණ්ඩු හැදීමට කතා කිරීම මේ පරස්පරය විහිළුවක් බවට පත් කර තිබේ.

මෙම පරස්පරය මෙම හවුල් ආණ්ඩුවේ පැවැත්මත් සමඟම බැඳී තිබේ. වත්මන් හවුල් ආණ්ඩුව ප්‍රතිවිරෝධයන්ගේම එකතුවකි. මෙවැනි හවුල් ආණ්ඩුවක් හැදීමට හේතු වූ කරුණු කිහිපයක් තිබේ. එම කරුණු අතර නැත්තේම ප්‍රතිපත්තිමය එකඟතාවය ලෙසින් රටට කියන කරුණය. මෙම ආණ්ඩුව දුබලතා දෙකක එකතුවකි. එනම්, එ.ජා.පයට හෝ ශ්‍රී.ල.නි.ප.යට තනිව ආණ්ඩුවක් පිහිටුවීමට තරම් බලයක් නොලැබීමේ ප්‍රතිඵලයක් ලෙස ගොඩ නැගුණකි. වසර 20ක් විපක්ෂයේ සිටි, තම පක්ෂය හේදවී තම නායකත්වයද අභියෝග යට ලක්ව තිබුණු වේලාවක අහම්බෙන් ලැබුණු භාග බලය අත් හැරීමට රනිල් වික්‍රමසිංහ මහතාට නොහැක. ඔහු මෛත්‍රී පෙරටුකර ගනිමින් හවුල් පාලනයට එන්නේ ඒ නිසාය. මෛත්‍රීගේ පැත්තෙන් බලන විටද හවුල් ආණ්ඩුවේ සිටීම හැර වෙන විකල්පයක් ඔහුට නැත. රාජ්‍ය බලයට ඔහු දායක නොවන්නේ නම් එක් අතකින් ඔහුගේ ජනාධිපති ධූරය බල රහිත වන අතර අනෙක් අතින් ශ්‍රී.ල.නි.ප නායකත්වය තම අතේ තබා ගැනීමටද නොහැකි වනු ඇත. දැනට ශ්‍රී.ල.නි.ප නායකත්වය ඔහු අතේ තිබෙන්නේත් ශ්‍රී.ල.නි.ප. ඉහළ මණ්ඩලවල පිරිස ඔහු වටා සිටින්නේත්, ඔහු හවුල් ආණ්ඩුවට එක්ව තමා සමඟ සිටින අයට ඇමති ධූර හා තනතුරු ලබා දීමට සමත් වූ නිසාය. බලය නැති නම් මේ සියලු දෙනා මෛත්‍රී හැර යනු ඇත. එබැවින් අන්ධයා හා කොරා නාඩගම මෙන් මෛත්‍රී - රනිල් දෙදෙනාටම තම නායකත්වය රැක ගැනීම වෙනුවෙන් බලයේ වුවමනාව විසින් එක්ව ආණ්ඩු කිරීමට බලකර තිබේ. විවිධ ප්‍රතිවිරෝධතා මැද වුවද හවුල් ආණ්ඩුවේ පැවැත්මේ සැබෑ හේතු ඒවාය.

එය එසේ නම් වෙන වෙන ආණ්ඩු හදන්න කතා කරන්නේ ඇයි. මෙම නායකයින් දෙදෙනාටම තම තමන්ගේ ආණ්ඩු හැදීමට සූදානම් වන්න යැයි සාමාජිකයින්ට කීමට සිදුව ඇත්තේ සාමාජිකයා සතුටු කිරීම සඳහාය.

මෛත්‍රීපාල මහතා ශ්‍රීල.නි.ප.යේ නිල නායකයා වුවද ශ්‍රීල.නි.ප. පහළ සාමාජිකයන්ගේ කැමැත්ත ඔහුට ලබා ගැනීමට ඔහු අසමත්ව තිබේ. බිමේ ශ්‍රී ලංකාකාරයාට මෛත්‍රී පෙනෙන්නේ තමන්ගේ සන්ධාන ආණ්ඩුව පරාජය කිරීමට රනිල් සමග එක්වූ පුද්ගලයා ලෙසය. එසේම දැනුත් එ.ජා.ප.ය සමග හවුලේ රට පාලනය කරන නිසා ශ්‍රීල.නි.ප.ය එ.ජා.ප.යට විකුණා දැමූ කෙනා ලෙස මෛත්‍රී ගැන ශ්‍රී.ල.නි.ප සාමාජිකයා කල්පනා කරන බව පෙනේ. මෙය තවත් බරපතළ වන්නේ මහින්ද රාජපක්ෂ කල්ලිය මෙම මතය නිතර ප්‍රකාශ කිරීම නිසාය. මේ නිසා තමන් පිරිසිදුම ශ්‍රී ලංකා කාරයා ලෙසත්, තම අරමුණ ශ්‍රී.ල.නි.ප යේ තනි ආණ්ඩුවක් හැදීම බවත් හඬනගා කීමට මෛත්‍රීපාල සිරිසේන මහතාට සිදුව තිබේ. ඉන් ජනිත වන ප්‍රතිවිරෝධය නොසලකා එසේ කීමට සිදුව තිබෙන්නේ එසේ නොවුණහොත් මෛත්‍රීපාල මහතා සාමාජිකයින් නැති නායකයෙක් වන නිසාය. එය හරියටම හමුදාවක් නැති ජනරාල් කෙනෙකුගේ තත්වයට පත්වීමකි. ශ්‍රීල.නි.ප.ය ඉදිරි මැතිවරණවලදී 'අත' ලකුණින් තරග කරන බව මෛත්‍රීපාල මහතා විසින් පවසන්නේද තමන් නියම ශ්‍රී ලංකාකාරයා බව පෙන්වීමටය. 1977 න් පසු අතුරු මැතිවරණවලට පමණක් යොදාගත් ඉන්පසු පාවිච්චි නොකළ ශ්‍රීල.නි.ප සාමාජිකයාටද අමතකව ඇති 'අත' මෛත්‍රීගේ අතට ගන්නේත් මහින්දට වඩා ඔහු ශ්‍රී ලංකා බව ඇඟවීමටය. එහෙත් මෛත්‍රීපාල මහතාගේ තත්වය ඉන් මුළුමනින්ම හොඳ අතට පත්වේ යැයි කිව නොහැක. කෙසේ වෙතත් මේ අර්බුදය නිසා මෛත්‍රීපාල මහතාට එකවිටම හවුල් ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටීමටත් ශ්‍රී ලංකා ආණ්ඩුවක් හැදීමටත් කතා කිරීමට සිදුවී තිබෙන අතර එය කිසියම් හාස්‍යයක්ද ජනිතකර තිබේ.

එ.ජා.ප.යද මුහුණ දී ඇත්තේ මෙවැනිම අර්බුදයකටය. එ.ජා.පය හවුල් ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශවය වුවද එයට අණ්ඩු බලය මුළුමනින්ම ලැබී නැත. ඇත්තේ බාග බලයකි. ජනාධිපතිකම ශ්‍රීල.නි.ප. නායකයා සතුය. ඇමති මණ්ඩලයෙන් අඩක් ශ්‍රීල.නි.ප. සතුය. පළාත් සභා එ.ජා.ප යට නැත. පළාත් පාලන ආයතන විසිරුවා හැර තිබේ. බිමේ බලය එ.ජා.ප යට නැත. ඒ නිසා එ.ජා.ප යේ නායකයින් බලය බුක්ති විඳිමින් සිටියද බිමේ එ.ජා.ප. පාක්ෂිකයාට බලය ලැබී නැත. වෙනදා තනිව ආණ්ඩුවක් පිහිටවූ විට බිම දක්වා ගමන් කරන බල යාන්ත්‍රණය ගොඩ නොනැගීම නිසා බිමේ එ.ජා.ප පාක්ෂිකයා සිටින්නේ අසතුටිනි. රනිල් අගමැති වූවාට "යූ.ඇන්.පී.කාරයෙක් රස්සාවකට දා ගැනීමටවත්" යූ.ඇන්.පී.යට නොහැකි වී ඇතැයි ඔවුන් සිතන්නට පටන් ගෙන තිබේ. වෙනදා ආණ්ඩු මාරු වූ විට යූ.ඇන්.පී.කාරයන්ට රැකියා දෙන ලංගම, වරාය, තෙල් සංස්ථාව, සමෘද්ධි බලකාය වැනි ආයතන දැන් ඇත්තේ ශ්‍රීල.නි.ප. ඇමතිවරු අතේය. එ.ජා.ප බිමේ පාක්ෂිකයාට තම පක්ෂය බලයට ආ බව නොදැනෙන්නේ මේ නිසාය. මෙලෙස බිමේ ඇති වන විරෝධය එ.ජා.ප නායකයින්ට දැනෙන්නට පටන් ගෙන තිබේ. සංවත්සරය පවත්වා එ.ජා.ප ආණ්ඩුවක් හැදීමට රනිල් පොරොන්දු වන්නේ එම බිමේ විරෝධය නිවීමටය. එහෙත් එය හවුල් ආණ්ඩුවේ පැවැත්ම සඳහා ඔහුම කරන ප්‍රකාශ සමග පරස්පර වන අතර එය විසඳා ගැනීමට ක්‍රමයක් ඔවුන්ට නැත. ඔවුන් මුහුණ පා ඇති අර්බුදයේ තත්වය එයයි.

ආණ්ඩුව තුළ වන ප්‍රතිවිරෝධය එ.ජා.ප. - ශ්‍රීල.නි.ප. ප්‍රතිවිරෝධයට පමණක් සීමා වී නැත. මෙම ආණ්ඩුව තුළ තවත් ප්‍රතිවිරෝධතා තිබේ. මෙහි බලය බෙදීම ප්‍රතිපත්තිමය ලෙස පිළිගෙන 13ට එහා ගිය බලය බෙදීමක් දිය යුතු බව පවසන අය මෙන්ම (එ.ජා.ප.ය, ඩිලාන් පෙරේරා වැනි) බලය බෙදීමට විරුද්ධ හෙළ උරුමයද සිටී. වත්මන් හවුල් ආණ්ඩුව බටහිර හා ඉන්දීය බලපෑම්වලට අනුව වැඩ කරද්දී නව ව්‍යවස්ථා සම්මත කිරීමට සූදානම් වෙද්දී හෙළ උරුමයේ පැවැත්මද අභියෝගයට ලක් වේ. එවිට ඔවුන්ටද සිදුව ඇත්තේ ආණ්ඩුව තුළ සිටිමින් එහි හැම දේකටම දායක වන අතරම ඇමති ධූරවල බලය යොදා පිරිසක් කොළඹට ගෙන්වා සමුළු පවත්වා දේශප්‍රේමය ගැන යටි ගිරියෙන් කෑ ගැසීමටය.

මේ සියලු 15 වැනි පිටුවට

"මෝඩකම් දෙකක් එක් නුවණක්කාර කමක් වන්නේ නැතැයි" කියමනක් තිබේ. ඒ අනුව දුබලකම් දෙකක් ඒක්වූ විට එක් ප්‍රබලකමක් ඇති වන්නේද නැත. සිදුවන්නේ දුබලකම දෙගුණ වීමය. එබැවින් වත්මන් හවුල් පාලනය දුබල එකක් වීම වැළැක්විය නොහැකි අතර එය බිඳ වැටෙද්දී එයට දායක වූවන්ද පරාජය වී නව විකල්ප බලයකට මඟ විවර කරන බව ඉතා පැහැදිලිය."



"අප මෙම නිර්ධන පංති අරගලය ගැන කථා කරන්නේ ඉතාමත් අවංක ලෙසිනි. අපගේ පැත්ත, නැතහොත්, අනෙක් පැත්ත තෝරා ගැනීම ඒ ඒ පුද්ගලයාට භාර කටයුත්තකි. පැත්තක් ගැනීම මඟහැරීමට දරන සෑම ප්‍රයත්නයක්ම කෙළවර වනු ඇත්තේ අමාරුවේ වැටීමෙනි."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**11වැනි වෙළුම,**
**83-84පිටු**

# අලි සහ ඌණු

මේ මොහොත වන විට අලි මිනිස් ගැටුම රටේ ජාතික මට්ටමේ ගැටලුවක් බවට පත්ව අවසන්ය. සෑම දිනකම වාගේ ප්‍රවෘත්ති ප්‍රකාශයන් තුළින් අලි මිනිස් ගැටුම හේතුවෙන් හානි වූ මිනිස් ජීවිත සම්බන්ධයෙන් ප්‍රවෘත්තියක් ලැබෙන පරිදි මෙම තත්වය උග්‍රවී තිබේ. පසුගිය රාජපක්ෂ පාලනය තුළ මෙයට විසඳුමක් ලෙස ඉදිරිපත් කරන ලද්දේ මෙම අලි, වල් අලි වෙනුවට 'වන අලි' ලෙස නාමකරණය කිරීමය. ඊනියා යහපාලනය තුළද එයට වඩා වඩා වෙනසක් දක්නට නොලැබේ. මේ තත්වය තුළ ජ.වි.පෙ.ට අනුබද්ධ සමස්ත ලංකා ගොවිජන සම්මේලනය මේ අලි මිනිස් ගැටුම වළක්වා ගැනීම සඳහා ස්ථිර වැඩපිළිවෙළක් සකසා දෙන ලෙස මෙන්ම අලින්ගේ ප්‍රහාරයන්ට ලක් වීම හේතුවෙන් මිය ගිය වුන් වෙනුවෙන් දැනට ගෙවනු ලබන රුපියල් ලක්ෂයක වන්දි මුදල වෙනුවට රුපියල් දශ ලක්ෂයක් ගෙවන ලෙස ආණ්ඩුවට බල කිරීමේ ක්‍රියාමාර්ග රැසකට එළඹ සිටී.

අලි මිනිස් ගැටුම සම්බන්ධයෙන් එසේ ක්‍රියාමාර්ග ගනිමින් සිටින සමස්ත ලංකා ගොවිජන සම්මේලනය පසුගිය සැප්තැම්බර් 02 වෙනිදා දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය ඉදිරිපිට A 9 යාපනය - නුවර මාර්ගය අවහිර කරමින් දේශීය ලොකු ළූණු කිලෝවකට සාධාරණ මිලක් ලබාදෙන ලෙස ආණ්ඩුවට බල කරමින් උද්ඝෝෂණ ව්‍යාපාරයකද නිරත විය. එම උද්ඝෝෂණ සඳහා ගොවිජන සම්මේලනය ජාතික සංවිධායක වයඹ පළාත් සභා මන්ත්‍රී නාමල් කරුණාරත්න සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් දහසකට අධික දඹුල්ල ප්‍රදේශයේ ළූණු වගාවේ නියුතු ගොවීහු පිරිසක් සහභාගි වී සිටියහ.

අලි-මිනිස් ගැටුම වේවා, ලොකු ළූණු කිලෝවකට සාධාරණ මිලක් ලබා ගැනීම වේවා එකිනෙකට වෙනස් ගැටලු සේ හැඟී ගියද මහජනතාවගේ ආණ්ඩු ගණනාවක් පුරා නොවිසඳී පවතින ගැටලුය. ඊනියා යහපාලනය තුළද නොවිසඳී ඉදිරියට යමින් ඇත්තේ එම පැරණි සමාජ, ආර්ථික ගැටලුමය.



# වමේ කාර්යභාරය වෙනුවෙන් උතුරට



ප්‍රාජයට පත් රාජපක්ෂ කල්ලිය නැවත වතාවක් රට තුළ ජාතිවාදී කලබල ඇති කිරීම ඉලක්ක කර ගනිමින් කටයුතු කරමින් සිටී. තමන්ට හිතැති විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය මෙන්ම මුහුණු පොතද ඔවුන් මේ සඳහා මූලික වශයෙන් යොදවා ගෙන තිබේ. ඔවුනට අනුව උතුරේ දෙමළ ජනයා නැවත සන්නද්ධ අරගලයකට අර අඳිමින් ඇත. වසර 30කට අධික යුද්ධයකින් බැට කෑ එම ජනයාගේ අපේක්ෂාව එය නොවුණත් පැරදුණු රාජපක්ෂවරුන්ගේ සහ ඔවුන් වටා සමීපතමයින්ගේ මූලික ප්‍රාර්ථනය වී ඇත්තේ එයයි. ඔවුන් ගොඩඒමට සිතන්නේ, එමගින් ගොඩනැගෙන ව්‍යාකූලත්වය තුළිනි. උතුරේ සිටින බෙදුම්වාදී අතළොස්සකගේ ක්‍රියාකාරකම් දකුණේ ජාතිවාදීන්ගේ ප්‍රාර්ථනය හා සමපාත වන්නේ එලෙසය.

රාජපක්ෂවරුන් එසේ කටයුතු කරද්දී රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුවද මුව හමට තඩි බානවාසේ පසුගිය පාලනය විවේචනය කරමින් සිටිනවා විනා රටේ උතුරේත් දකුණේත් ජනතාවගේ මූලික අවශ්‍යතාවන් සම්පාදනය කිරීම වෙනුවෙන් සිදු කරන දෙයක් නොමැත.

මේ ආකාරයට පැවති සහ වර්තමාන ආණ්ඩුවල ප්‍රතිපත්ති මගින් රටේ නිර්මාණය වෙමින් පවතින අර්බුද පිළිබඳවත්අර්බුද කැඳවන සමාජ ආර්ථික රටාවටඇති විකල්පය පිළිබඳවත් "රටේ අනාගතය හා වමේ කාර්යභාරය" යන මැයෙන් සම්මන්ත්‍රණයක් පසුගිය සැප්තැම්බර් 17 වෙනිදා යාපනය නගරයේදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත් විණි. මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. මධ්‍යම කාරක සභික රාමලිංගම් චන්ද්‍රසේකර් සහෝදරයාද ඇතුළු විශාල පිරිසක් සහභාගි වූහ.

# විකිණීම හා බිලිදීම = රනිල් + මෛත්‍රී

ප්‍රසිද්ධ දේපළ වෙළඳාම් සමාගමක නම් වෙනස් කරමින් රනිල් - මෛත්‍රී ප්‍රසිද්ධ දේපළ වෙළඳාම්කරුවෝ යනුවෙන් සඳහන් උපහාසාත්මක පුවතක් මේ දිනවල සමාජ ජාලා වෙබ් අඩවිවල සැරිසරමින් තිබේ. මෙවෙනි පුවත් දැකීමෙන් කටුක යථාර්ථය පිළිබඳ හාස්‍යය මුසු සතුටක් ලැබුවද මේ පුවත පිටුපස ඇත්තේ, රටක් ලෙස අප මුහුණ දී සිටින භයානක ඉරණම බව අමතක කළ යුතුව නැත.

2001 - 2004 කාල පරාසයේ තුළ පැවති එ.ජා.ප. ආණ්ඩුවේ ආර්ථික වැඩපිළිවෙළ වූයේ 'යළි පුබුදමු ශ්‍රී ලංකා' යන්නයි. රනිල් වික්‍රමසිංහ අගමැති ධූරය දැරූ එම ආණ්ඩුව සීගිරිය පවා විකුණන්නට සැලසුම් සාදා ඇති බවට විවේචන එකල ඔවුන් වෙත එල්ල විය. ජ.වි.පෙ., එ.ජා.ප.යට එරෙහි විවේචනයන්හි ප්‍රමුඛයා වූ අතර එ.ජා.ප.යේ පෞද්ගලීකරණ ක්‍රියාවලියට දැඩි විරෝධයක් එල්ල කරන ලදී.

නමුත් වර්තමානය වන විට එ.ජා.ප. අගමැති ද ශ්‍රීල.නි.ප.ය ජනපතිද අන්‍යෝන්‍ය අවබෝධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි අනුව පෞද්ගලීකරණය හෙවත් රාජ්‍ය ආයතන කුණු කොල්ලයට විකිණීම ආරම්භ කර ඇත. එයාර් ලංකා, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය, මත්තල ගුවන් තොටුපොළ, හම්බන්තොට වරාය, ලංකා හොස්පිටල් ආයතනය,මෙන්ම ඛණිජ තෙල් සංස්ථාව, විදුලි බල මණ්ඩලය, ජාතික ජල සම්පත් හා ජලාපවාහන මණ්ඩලය, ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම හා වරාය අධිකාරියද "ව්‍යුහාත්මක වෙනස්කම්" දවටනය යටතේ පෞද්ගලීකරණය කිරීමේ සැලැස්මක්ද මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. එමෙන්ම එට්කා වැනි ගිවිසුම් හරහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට නිදහසේ ඇතුල් වීමට ඉන්දියාවට ඉඩ සැලසීමද මෙයට සමාන්තරව සිදු වෙමින් තිබේ.

මේ සියලු තත්වයන් සැලකිල්ලට ගනිමින් ජ.වි.පෙ. විසින් මේ පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "විකිණීම, බිලිදීම සහ එට්කා" යන නමින් සම්මන්ත්‍රණ මාලාවක් ආරම්භ කරන ලදී. මෙහි ආරම්භක සම්මන්ත්‍රණය පසුගිය සැප්තැම්බර් 20වැනිදා කොළඹ මහජන පුස්තකාලයේදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.




# වම වෙනුවෙන් අන්තර්ජාල පුස්තකාලයක්



තොරතුරු යන්න අද ලෝකය පුරා වැඩි ඉල්ලුමක් ඇති දේ බවට පත්ව තිබේ. විද්‍යාවේ සහ තාක්ෂණයේ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස අද දැනුම සෙවීමේ ක්‍රමවේදයන් ඉතිහාසයට වඩා සරල කර ඇත.

එහෙත් අප ජීවත්වනු ලබන්නේ ධනවාදී සමාජයක් තුළය. එනිසා ඔවුන්ගේ න්‍යාය පත්‍රයන්ට හසු නොවී දැනුම සොයා යාමට ඉඩ ප්‍රස්ථා අවමය. විශේෂයෙන්ම ධනවාදය තුල විද්‍යාව හා තාක්ෂණය වර්ධනය කරනු ලබන්නේ ලාභය උපරිම කරගැනීම වෙනුවෙන් විනා ජනතාවගේ සුභ සිද්ධිය සඳහා නොවේ. ඔවුන් අන්තර්ජාලය බිහිකරන්නේද එම අරමුණිනි. මේ තත්වය තුළ අන්තර්ජාලය හරහාද කටයුතු සිදුවෙමින් තිබෙනුයේ එක්කෝ භාණ්ඩ හා සේවා අලෙවිය වෙනුවෙනි. නැතහොත් ලිංගිකත්වය, මිත්‍යාව නැතහෝ ධනවාදයට සේවය කරන නොයෙක් මතවාදයන් තමන්ගේ ඔළු තුළට ඔබා ගත් ධනවාදයට ගැලපෙන මිනිසෙක් නිර්මාණය කරගැනීම වෙනුවෙනි.

එහෙත් අන්තර්ජාලයේ ගෝලීය ස්වභාවය තුළ අතුරු ඵලයක් ලෙස සමාජවාදය වෙනුවෙන්ද සේවය කරයි. ඒ, ලොව පුරා වමේ තොරතුරු, අදහස්, අත්දැකීම් බෙදාහදා ගන්නා වේදිකාවක් නිර්මාණය කරමිනි.

මෙවන් වටපිටාවක් තුළ දැනුම සොයා යන අය වෙනුවෙන්, විශේෂයෙන් වමේ දේශපාලනික කියවීමක යෙදෙන්නවුන් වෙනුවෙන් තොරතුරු සොයා ගැනීම සඳහා www.leftlibrary.net නමින් වෙබ් අඩවියක් පසුගිය සැප්තැම්බර් 11වැනිදා කොළඹ ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේදී එළිදක්වන ලදී.

දේශපාලනය, කලා, ආර්ථික, අධ්‍යාපන ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක ලිපි මෙන්ම මාක්ස්වාදී ලිපි ලේඛනද අඩංගු වන මෙම වෙබ් අඩවි එළිදැක්වීමේ උත්සවයේදී 'දාස් කැපිටාල්' කෘතියේ සිංහල පරිවර්තක ජයතිලක ද සිල්වා මහතා, මාධ්‍යවේදී නාරද බක්මීවැව මහතා සහ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් දේශන ඉදිරිපත් කරන ලදී.

# ලාභය වෙනුවෙන් වස කැවීම

අප රටේ ඖෂධ මාෆියාවක් සම්බන්ධයෙන් දීර්ඝ කාලයක සිට සංවාදයක් තිබේ. මහාචාර්ය සේනක බිබිලේ වැනි රටට හිතැති පුද්ගලයන් ඒ මාෆියාවට එරෙහි සටනක්ද අරඹා තිබිණි. ඖෂධවලට නොදෙවෙනි මාෆියාවක් මේ වන විටත් ක්‍රියාත්මක වෙමින් තිබේ. එය ආහාර මාෆියාව ලෙස නාමකරණය කළ හැක.

එහෙත් ඒ සම්බන්ධයෙන් සමාජයේ පවතිනුයේ ඉතා අඩු අවධානයකි. එනිසා මෙවර "ගවේෂණ" තුළින් අප අනාවරණය කිරීමට සැරසෙනුයේ මිනිස් පරිභෝජනයට නුසුදුසු ආහාර පාන විසින් සමාජය ගොදුරු කර ගෙන ඇති ආකාරයයි.

## Proaction Reaction

අස්වයා ගියාට පසු ඉස්තාලය වැසීම වැනි කියමනක අර්ථය වන්නේ, යමක් සිදුවූ පසු එයට ප්‍රතික්‍රියා දැක්වීමේ ඵල රහිතභාවයයි. නමුත් මෙරට ආහාර නිෂ්පාදන කර්මාන්තයට අදාළව ගතහොත් එම කියමනද පරයා යමින් අශ්වයා ගිය පසුවද ඉස්තාලය වසා නොදමන ක්ෂේත්‍රයක් බවට පත්වී තිබේ.

අනෙකුත් භාණ්ඩ මෙන්ම මෙරටට ගෙන්වන ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් ඒවා පරිභෝජනයට සුදුසුද නැද්ද යන්න පිළිබඳව පරීක්ෂා කිරීමේ නිසි ක්‍රමවේදයක් රට තුළ නොමැත. ඒවා වරායෙන් ගොඩබෑ පසු වෙළඳපොළට නිකුත් වන අතර එයින් පසු එම ආහාර ද්‍රව්‍ය පරිභෝජනය හේතුවෙන් කිසියම් ආබාධ හෝ රෝගී තත්වයක් ඇති වූවාදැයි සොයා බැලීමට ක්‍රමවේදයක්ද නැත. ඇතැම් රටවලින් මෙරට ආනයනය කරන සහල්, පරිප්පු, කඩල ආදී ධාන්‍ය වර්ගයන්හි පැහැය වෙනස් කිරීමට හෝ කල් තබා ගැනීමට රසායනික ද්‍රව්‍ය අධික ලෙස මිශ්‍ර කරන බවට කතාබහක් පවතී. වරායේදී නීතියට පමණක් සීමා වූ 'පරීක්ෂාවකින්' පසු මේවා වෙළඳපොළට මුදා හැරෙන නිසා ඒවා පසුව රට පුරා ඇති වෙළඳසැල් මගින් පාරිභෝගිකයින් අතට පත්වේ. යම් ආකාරයකට මේ ධාන්‍ය වර්ගය මිනිස් පරිභෝජනයට නුසුදුසුයැයි පැමිණිල්ලක් ලැබීමෙන් හෝ නැත්නම් මොනයම් ආකාරයකට අදාළ බලධාරීන් විසින් එහි සාම්පලයක් රැගෙන ගොස් පරීක්ෂාවට ලක් කළ පසු එය මිනිස් පරිභෝජනයට නුසුදුසු බවට තහවුරු වූවායැයි සිතමු. නමුත් කණගාටුවට කරුණ වන්නේ, පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබෙනවිට එම ආහාර වර්ගය පාරිභෝගිකයින් වෙත ගොස් හමාර වී තිබිය හැකි වීමය.

ඇතැම් කර්මාන්ත ශාලාවල, නැතිනම් නේවාසිකාගාරවල ආහාර විෂ වීමෙන් එහි සේවකයන් හෝ නේවාසිකයින් රෝහල් ගත කර ඇති බවට පුවත් අප නිතර නිතර අසා ඇත්තෙමු. මෙවෙනි සිදුවීම්වලට භාජනය වූවන් මෙන්ම අසන දකින අයටද එහි අරුමයක් නැති තරම්ය. එතරම්ම සාමාන්‍යකරණය වී ඇත. එහෙත් සැබැවින්ම මෙවැනි සිදුවීම් තුළ ගැඹුරට ගොස් සොයා බැලුවහොත් අපට පෙනීයන්නේ, මෙම ආහාර පාන පරිභෝජනයට පෙර පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් නොමැතිකමය. නිදසුනක් ලෙස මතභේදයට ලක්වී ඇති අජිනෝ මොටෝ නම් ආහාර රසකාරකය සම්බන්ධයෙන් ආණ්ඩුවෙන් මෙතෙක් විධිමත් පරීක්ෂණයක් සිදුවී නොමැති අතර තානාපති කාර්යාල කිහිපයක් විරුද්ධ වීම හේතුවෙන් ආණ්ඩුව ඒ රසකාරකය තහනම් කිරීම නවතා දැමූ බවට කථාබහක් පවතී.

සාමාන්‍යයෙන් රෝහල්, නේවාසිකාගාර, කර්මාන්ත ශාලා ආදියට ආහාර සැපයීම බාර ගනු ලබන්නේ, කොන්ත්‍රාත්කරුවන් විසිනි. නමුත් ඔවුන් ඒ සඳහා එළවළු, මස්, මාළු, සහල් ආදිය ලබාගනු ලබන්නේ කොතැනින්ද? ඒවායේ ප්‍රමිතිය කෙසේද යන්න සොයා බැලීමේ ක්‍රියාවලියක් (Proaction) අපට නොමැත. නමුත් ඒවා ආහාරයට ගැනීමෙන් ඇතිවන උදරාබාධයන්, විවිධ අසාත්මිකතා හෝ වෙනයම්ම රෝගී තත්වයක් සිදුවූ පසු එය සිදුවුයේ කෙසේද යන්න සොයා බැලීමේ ක්‍රියාවලියක් (Reaction) බොහෝ විට සිදුවේ. ඒවාද පසුව අතරමඟ ඇණහිටීම වෙනමම කාරණාවකි.

මේ වන විට නිවෙස් තුළ අහාර පිළියෙළ කරගැනීමේ ක්‍රියාවලිය අඩුවෙමින් යන අතර ඒ අනුව තමන්ගේ සමාජ මට්ටම්වලට අනුරූප වන ආකාරයට අලෙවිසැල්වලින් ආහර පාන ලබා ගැනීමට ජනයා යොමුවී සිටී. නාගරික ප්‍රදේශවල මෙය සුලභ කරුණකි. පාරේ නවතා ඇති කෑම රථ, කුඩා කඩ, මධ්‍යම පරිමාණයේ හෝටල් සහ සුපිරි මට්ටමේ හෝටල් මේවා අතර වේ. නමුත් මේවායේ නිපදවෙන් ආහාරපාන සම්බන්ධයෙන් ප්‍රායෝගික තලයේ Proaction හෝ Reaction ක්‍රියාවලියක් අප රට තුළ නැත. එහෙත් නෛතිකව ගත් කළ එනම් ආහාර පිළිබඳ ආඥා පනත අනුව ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානවලට මෙන්ම ඒවා පිස අලෙවි කරන ස්ථාන සඳහා බලපත්‍රයක් ලබා තිබිය යුතුය. මෙම බලපත්‍රය වාර්ෂිකව අලුත් කළ යුතු අතර අදාළ රාජ්‍ය නිලධාරීන් පැමිණ පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම බලපත්‍ර නිකුත් කරනු ලබයි. නමුත් මේ වන විට හතු පිපෙන්නාසේ බිහිවී ඇති ආහාර පාන අලෙවි ස්ථානවලට බලපත්‍ර ඇතැයි විශ්වාස කළ හැකිද? බලපත්‍ර ඇති ස්ථානවලට පවා සඳහා ඒවා ලබාදීමේදී ස්ථානීය පරීක්ෂාවක් සිදුකිරීම ඇතුළු නිසි ක්‍රමවේද අනුගමනය කළේද යන්නත් වෙනම සොයා බැලිය යුතු කාරණයක්ව පවතී.

### පැරණි දේ අලුත් කිරීම

නිවසේ පිළියෙළ කළ ආහාරයක් පිළුණු වී ආහාර මේසයේ තිබුණහොත් එකම ගාලගෝට්ටියකි. එය එක්කො පිසූ කෙනාගේ වරදකි. නැතිනම් කෑමට තැබූ කෙනාගේ වරදකි. ඒ කල් ඉකුත් වූ යමක් අහාරයට ගැනීම තමන්ගේ ශරීර සෞඛ්‍යයට අහිතකර බව කුඩා කාලයේ පටන් අප දන්නා හෙයිනි. එහෙත් අප එසේ දැන සිටියද අපේ ඇස් වසා කල් ඉකුත් වූ ආහාර ද්‍රව්‍ය තොග පිටින් වෙළඳ පොළ ආක්‍රමණය කර තිබේ. එය ඉතා සංවිධානාත්මකව සිදුවන අතර මෙවැනි දේ සිදුවන බව සොයා බැලීමට ඇති රාජ්‍ය යාන්ත්‍රණයද බිඳ වැටී ඇති හෙයින් මෙම ක්‍රියාවලිය බාධාවකින් තොරව සිදු වෙමින් පවතී.

ඇසුරුම් කරන ලද භාණ්ඩවල නිපදවූ දිනය සහ කල් ඉකුත් වන දිනය වෙනස් කර වෙළඳපොළට එවීම සාමාන්‍ය ක්‍රමයයි. සැබැවින්ම මෙවනි දේ සිදුවන්නේ මහා පරිමාණයෙනි. තොරතුරු වාර්තා වන ආකාරයට ඇතැම් සුපිරි වෙළඳසැල් ජාලයන් මේ ක්‍රියාවලියේ ප්‍රමුඛස්ථානයක් ලබා ගෙන සිටී. තම නිෂ්පාදනයන් කල් ඉකුත් වීමට පෙර අලෙවි කර ගැනීමට නොහැකි වූ සමාගම් විසින් සැමන්, චොකලට්, කිරිපිටි ආදීයෙහි කල් ඉකුත් වන දිනය වෙනස් කර මේ සුපිරි වෙළඳසැල් මගින් නැවත වෙළඳපොළට මුදාහරිනු ලබයි.

මහා පරිමාණයෙන් එසේ සිදුවෙද්දී ක්ෂුද්‍ර වෙළඳපොළ තුළ දින වෙනස් නොකරම කල් ඉකුත් වූ ආහාර ද්‍රව්‍ය අලෙවි වේ. ඒ මෙසේය. දිනපසු වූ බිස්කට්, කේක්, පැණි බීම ආදී ද්‍රව්‍ය උත්සව සමයන්හි දුම්රිය ස්ථාන, බස් නැවතුම්පොළවල් ආදී මිනිසුන් කලබලකාරීව ගැවසෙන ස්ථානයන්හි අලෙවියට තැබීමෙනි. දින වෙනස් කිරීමෙන් කල් ඉකුත්වූ අහාර පාන වෙළඳපොළට එසේ එක් වෙද්දී දින පිළිබඳ කථිකාවකින් තොරවම කල් ඉකුත් වූ මස්, මාළු, එළවළු, පළතුරු, කිරිපිටි ආදිය කුඩා හා මහා පරිමාණ හෝටල් මගින් අපේ ආහාර වේලට එක් වනු ලබයි. පවතින නීති රීතිද පොතට පමණක් සීමා වී තිබෙන තත්වයක් තුළ රට පුරා මේ ව්‍යාපාර ඉතා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් තිබේ.



### හොදම දේ ළමුන්ටද?

ලාභය වෙනුවෙන් සිදුකරනු ලබන ආහාර ද්‍රව්‍ය වෙළඳාමේ (ජාවාරමේ) ප්‍රධාන ගොදුර බවට පත්ව ඇත්තේ, අපේ අනාගත පරම්පරාවයි. ලෝකයේ දියුණු ධනේශ්වර රටවලද ළමා පරම්පරාව ආහාර නිපදවන සමාගම්වල ගොදුරක් බවට පත් ඇති තත්වයක් තුළ මෙරට ගැන කථා කිරීම පවා බෙදවාචකයකි.

පාසැල්, ටියුෂන් පංති ඉලක්ක කර ගනිමින් ඇති පැණි බීම පැකට්, අයිස් පැකට්, අයිස් ක්‍රීම් සහ බහු ජාතික සමාග මිහි ආහාර අලෙවිසැල් තුළ තිබෙන අධික ලෙස සීනි, පිටි සහ විවිධ වර්ණක යොදා හැඩ කළ ආහාර වර්ග සඳහා පාසැල් යන වයසේ ළමුන් ඇබ්බැහි වී හමාරය. සාමාන්‍යයෙන් නිරෝගී පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය වන්නේ තේ හැදි 06ක තරමේ සීනි ප්‍රමාණයක් බව වෛද්‍ය මතයයි. ඒ, එදිනෙදා අප ගන්නා පිෂ්ඨය සහිත ආහාර ජීර්ණයෙන් සහ සෘජුව තේ පානයන් හරහා ශරීරයට එකතු වන සීනී ප්‍රමාණයන්ගේ එකතුවයි. නමුත් වෙළඳපොළේ ඇති බහු ජාතික සමාගමක ලීටර් 02ක බීම බෝතලයක අඩංගු සීනි ප්‍රමාණය තේ හැඳි 86ක් බව අනාවරණය වී තිබේ. මේ බීම විශේෂයෙන් නාගරික ප්‍රදේශ තුළ පැසැල් සිසුන් අතර ප්‍රසිද්ධියක් උසුලයි. ඒ අනුව එම වයසේ ළමුන් ගන්නා පිටි සහිත ආහාර පාන, පැණි බීම ආදිය නිසා අනාගතයේ දියවැඩියා රෝගීන්ගෙන් පිරුණු රටක් අපට නිර්මාණය වනු නිසැකය. එසේම සිසිල් බීම සෑදීම සඳහා ගන්නා පැකට් කළ කුඩු විශේෂයන් සම්බන්ධයෙන්ද ඇත්තේ බලවත් සැකයකි. මේවා පිළිකාකරකද නැතහොත් වෙනත් රෝගී තත්වයන් ඇති කිරීමට ඉවහල්වේද යන්න සොයා බැලීමේ ක්‍රමවේදයන් පවා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවේ.

මේ තත්වයන් හමුවේ මෙම ජාවාරම් නැවැත්වීම සඳහා නීති රීති හෝ කිසියම්ම ක්‍රමවේදයක් නොමැති දැයි කෙනෙකුට හැඟී යන්නට පුළුවන. සැබැවින්ම ඒ සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් ඒ ඒ පළාත් පාලන ආයතනවලට අනුයුක්ත කර ඇති අතර ආහාර පාන මිනිස් පරිභෝජනයට ගැලපේදැයි සොයා බැලීම සඳහා රාජ්‍ය මැදිහත් වීමෙන් පරීක්ෂණාගාරද පවතී. නමුත් මෙහි ඇති ගැටලුව වන්නේ, අවංක නිලධාරීන් අතළොස්සක් සිටියද රාජ්‍ය යාන්ත්‍රණයේ තිබෙන අකාර්යක්ෂමභාවය මෙන්ම නිලධාරී හිඟය, හේතුවෙන් මේ ආහාර ද්‍රව්‍ය සම්බන්ධයෙන් සිදුකරන පරීක්ෂණ ක්‍රියාවලිය ඇන හිට තිබේ. අනෙක් පැත්තෙන් ආහාර පිළිබදව රට පවතින නීතියද යාවත්කාලීන නැත. අද තත්වයන්ට නොගැලපේ. ආහාර පාන හෝ ඒවා පිළියෙල කරන, නැතිනම් ගබඩා කරන ස්ථානයන් වූ විට එම ආහාරපාන මිනිස් පරිභෝජනයට නුසුදුසු තත්වයට පත් කිරීම හේතුවෙන් වරදකරුවෙකු වූ පුද්ගලයෙකු හෝ ආයතනයක් මත පැනවෙන උපරිම දඩ මුදල වන්නේ රු.5000/-ක් වැනි මුදලකි. එසේම වරදට හසුවූ පසු එහි අධිකරණ ක්‍රියාවලිය සඳහාද මාස 06ක් හෝ 07ක් නැතිනම් වසරක පමණ කාලයක් වුවද ගත විය හැක.

මෙහිදී අප අනාවරණය කරනු ලැබුවේ, මේ ආහාර ජාවාරමේ ඉතා සුළු පැති කඩක් පමණි. ඇතැම් පිරිස්, මේ ක්ෂේත්‍රයේ විද්වත්හු පවා මේ උවදුරෙන් බේරීමට හැකි හොඳම මාර්ගය තමන්ගේ ආහාර පාන නිවසේදීම පිළියෙල කර ගැනීම බව පවසති. එම ප්‍රකාශයන්ගේ යම් සත්‍යතාවයක් තිබුණද සමාජයක් ලෙස කල්පනා කිරීමේදී එය ප්‍රායෝගික විසඳුමක් නොවන බව දිනෙන් දින ඉහළ යන ඉල්ලුම දෙස බලන විට පෙනී යයි. ඒ ඔස්සේ තවදුරටත් ගමන් කළහොත් වස විසෙන් දුරස් වීම සඳහා තමන් භාවිතයට ගන්නා එළවළු, පළතුරු ආදිය තමන් විසින් වගා කර ගැනීම වඩා සුදුසු බවට මතයත් වුවද නිර්මාණය විය හැක. එයද සමාජයක් ලෙස සැලකූ විට විසඳුමක් නොවේ.

සමාජයක් ලෙස මෙයට විසදුම් සොයන්නේ නම් රටේ ආණ්ඩුව මෙයට මැදිහත් වී නිසි පරිදි නිලධාරී යාන්ත්‍රණය යොදවා යටිතල පහසුකම්ද ශ්‍රම සම්පත්ද වැඩි දියුණු කරමින් රටේ ජනතාවද මේ ක්‍රියාවලිය හා බද්ධ කර ගනිමින් ගමනක් යායුතු තිබේ. රටේ මානව සම්පත නිරෝගී කිරීමට අවශ්‍ය ආණ්ඩුවක්නම් කළ යුත්තේ එයය. ඒ වෙනුවට ආණ්ඩුවට අවශ්‍ය බහුජාතික සමාගම්වල ඖෂධ වෙළඳපොළ පුළුල් කරදීමටනම් මේ ඉඩහැර ඇති ආකාරය ඒ සඳහා හොඳටම ප්‍රමාණවත්ය.



"මලක් වැඩේ යැයි සිතන ඕනෑම තැනක ඇති කටුව ගලවා, මලක් සිටවූ අයෙකු ලෙස, මා සමුගන්නා දිනයක, මා ගැන සඳහන් කරනු ඇසීමට මම කැමැත්තෙමි."

**ඒබ්‍රහම් ලින්කන්**

# කොකා කෝලාද ස්ප්‍රයිට්ද යන්න තෝරන එ.ජ. ජනාධිපතිවරණය





එක්සත් ජනපදයේ 58වන ජනාධිපතිවරණය එළඹෙන නොවැම්බර් 08වන අඟහරුවාදාට යෙදී තිබේ. එහිදී එක්සත් ජනපදයේ 45වන ජනාධිපතිවරයාත් 48වන උප ජනාධිපතිවරයාත් තෝරා පත්කර ගැනේ. ඍජුව ජනාධිපතිවරයා තෝරනුයේ සමස්ත ජනතාව නොවේ. එනම් ජනාධිපතිවරයා සර්වජන ඡන්දයෙන් තේරී පත් නොවේ. එහෙත් ජනාධිපතිවරයා සහ උප ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනෙන මැතිවරණ පදවි වෙනුවෙන් ජනතාව ඡන්දය ප්‍රකාශ කරයි. ඒ ඒ අපෙක්ෂකයා හෝ අපේක්ෂිකාව වෙනුවෙන් එක් එක් ප්‍රාන්තයෙන් තෝරා පත් කෙරෙන නියෝජිතයින් සංඛ්‍යාව අනුව ජනාධිපතිවරයා කවුදැයි තීරණය වනු ඇත.

මෙවර මැතිවරණයට රිපබ්ලිකන් පක්ෂය නියෝජනය කරමින් ව්‍යාපාරිකයෙකු වන ඩොනල්ඩ් ට්‍රම්ප් ඉදිරිපත් වී සිටී. ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය (ඩිමෝක්‍රටික් පක්ෂය) නියෝජනය කරමින් හිටපු එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් ඉදිරිපත් වී සිටී. මීට අමතරව ස්වාධීන අපේක්ෂකයින් සහ හරිත පක්ෂය ඇතුළු පක්ෂ කිහිපයක අපේක්ෂකයින් ඉදිරිපත් වී ඇත. එසේ වුවද තරඟය පවතින්නේ ප්‍රධාන පක්ෂ දෙකේ අපේක්ෂකයින් දෙදෙනා අතරය.

මේ වනවිට ඔවුන් දෙදෙනා අතර තරඟය තීව්‍ර වී ඇති අතර ජයග්‍රහණය පිළිබඳ විවිධ අනාවැකිද පළවෙමින් තිබේ.

ඇලන් ලිට්ච්මාන් නම් ඉතිහාසය පිළිබඳ මහාචාර්යවරයා පවසන්නේ ඩොනල්ඩ් ට්‍රම්ප් ඉතා සුළු ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කිරීමට ඉඩ ඇති බවයි. එසේ වුවහොත් ඩොනල්ඩ් ට්‍රම්ප් එක්සත් ජනපද ජනාධිපති ධුරයට තේරී පත්වන වයස්ගතම පුද්ගලයා ලෙසද ඉතිහාසගත වනු ඇත.

එක්සත් ජනපද සංගතය සහ එරට ඉහළ පෙලැන්තිය ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ජයග්‍රහණය බලාපොරොත්තු නොවන නමුදු ඔහු රිපබ්ලිකන් පක්ෂ අපේක්ෂකයා ලෙස තේරී පත්වීමෙන් වැළැක්වීමට ඔවුන්ට නොහැකි විය. සිය කෙටිකාලීන මැතිවරණ ව්‍යාපාරය තුළදී පෙරළිකාරී සහ ආන්දෝලනාත්මක චරිතයක් බවට ඔහු පත්විය. බොහෝ දෙනෙකු ඔහුගේ ප්‍රකාශ පිළිබඳ සහ ඔහුගේ හැසිරීම් පිළිබඳ අප්‍රසාදය පළ කළහ. එසේ වුවත් ඒ හරහා ඔහු සමස්ත ලෝකයේම අවධානය දිනා ගත්තේය.

එක්සත් ජනපදයේ ධනපති පාලක පැලැන්තියේ අපේක්ෂාව හිලරි ක්ලින්ටන්ගේ ජයග්‍රහණයයි. එහෙත් ඇය පරණ මුහුණකි. දැනටමත් දන්නා කෙනෙකි. එසේම ඇයගේ පක්ෂය අවුරුදු 08ක් පුරාම බලය හොබවමින් සිටී. ඒ අතර ඇය රාජ්‍ය ලේකම්ව සිටියදී සිදුකරන ලද වංචා පිළිබඳ චෝදනාවකටද ලක්වී සිටින්නීය.

ඇතැම් සමීක්ෂණවලට අනුව (Real clear politics polls) ක්ලින්ටන් ට්‍රම්ප් ඉක්මවා සිටී.

**විචාරකයින් පවසන්නේ මෙවර එක්සත් ජනපද ජනාධිපතිවරණය කලින් මැතිවරණවලට වඩා වෙනස් බවයි. එම වෙනස ඔවුන් පවසන අන්දමට, කලින් ජනාධිපතිවරණවලදී. තීරණය කෙරුණේ වඩා හොඳ පේප්සි කෝලාද, කොකා කෝලාද යන්නයි. මෙවර මැතිවරණයේදී තෝරනු ලබන්නේ වඩා හොඳ කොකා කෝලාද ස්ප්‍රයිට්ද යන්නයි.**

එක්සත් ජනපදයෙන් පිටත සිටින නිරීක්ෂකයන්ට ට්‍රම්ප් වෙනස් ලෙස පෙනෙන අතර, (ඔවුහු ඔහුගේ අමනෝඥ, පිළිකුල් සහගත කතාවලට විරෝධය දක්වති.) එක්සත් ජනපද වැසියන් ඔහු දකින්නේ එක්සත් ජනපද දේශපාලනයේ නව පන්නයක් ලෙසටය. මේ හේතුව නිසා විචාරකයන්ට අනුව ලෝකය බලාපොරොත්තු වන ආකාරයේ ප්‍රතිඵලයක් නොලැබී යන්නටද ඉඩ තිබේ. ඔවුන් උදාහරණයක් ලෙස දක්වන්නේ මහා බ්‍රිතාන්‍යයේ පැවති BREXIT ජනමත විචාරණයයි. එහි ප්‍රතිඵලය කිසිවෙකු අපේක්ෂා නොකළ එකකි.

විචාරකයන්ට අනුව පෙරදී එක්සත් ජනපද ජනාධිපතිවරණය ධනපති පාලනයේ නීත්‍යානුකූලභාවය වැඩිකර ගැනීමේ ක්‍රමයකි. එය ඒ මොහොතේ පාලනයේ හොඳ නරක පිළිබඳ ජනමත විචාරණයකි. එහෙත් මෙවර මැතිවරණය එසේ නොවේ. එය ගෝලීයකරණය තුළ තවදුරටත් රැඳී සිටිනවාද නැතිනම් හුදකලාභාවයට යනවාද යන්න තීරණය කරන ජනමත විචාරණයකි. ජාත්‍යන්තර අර්ථයෙන් ගත්කළ, පෙරදී එක්සත් ජනපද ජනාධිපතිවරණය එරට මෘදු බලය වැඩිකරන, අනෙකුත් රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් වීමට ඉඩකඩ විවෘත කරන දෙයකි. එය ලෝකයේ කාගේත් අවධානයට ලක්වන මැතිවරණයය. එමගින් එකසත් ජනපදය ලෝක 'නායකයාගේ' භූමිකාවට අවශ්‍ය යුක්තිසහගතභාවය නිර්මාණය කෙරේ.

එහෙත් මෙවර මැතිවරණයේ විශේෂත්වය වන්නේ, එය එසේ නොවී සංවාදය ලෝක නායකයාගේ භූමිකාව ඉටුකරනවාද? නැද්ද යන්නට යොමුවී තිබීමයි. එය එක්සත් ජනපදය සහ ලෝකයේ රටවල් අතර සබඳතාවයෙහි වෙනස්වීමක් පෙන්නුම් කරයි.

කෙසේ වෙතත් මේ සියල්ල පිළිබඳ අවසන් තීරණය මැතිවරණය ප්‍රතිඵලයත් සමඟ ලැබෙනු ඇත.

## රුසියාව එක්සත් ජනපද ගුවනේ

සැප්තැම්බර් 26 වන සඳුදා සිට තමන් එක්සත් ජනපදයේ භූමියට ඉහළින් නිරික්ෂණ ගුවන් මෙහෙයුම් සිදු කිරීමට සූදානම් බව රුසියානු ආරක්ෂක අමාත්‍යාංශය නිවේදනය කර තිබේ. මෙම ගුවන් මෙහෙයුම් සැප්. 26 දින සිට ඔක්. 01 දින දක්වා, කි.මී. 4250 කට ඉහළින් සිදු කිරීමට නියමිතය. මෙම මෙහෙයුම් සිදුකරනු ලබන්නේ 'විවෘත ගුවන් ගිවිසුම' (OPEN SKY TREATY) යටතේය. එහිදී එම රුසියානු නිරීක්ෂණ ගුවන් යානාවල එක්සත් ජනපද විශේෂඥයින්ද ගමන් කරනු ඇති අතර, ඉහත ගිවිසුමට එක්සත් ජනපදය කෙතරම් දුරට අනුගතද යන්න මෙම නිරීක්ෂණ චාරිකාවලින් පරීක්ෂාවට ලක් කරනු ඇත.

මෙම ගිවිසුම අත්සන් කෙරුණේ සමාජවාදී සෝවියට් දේශය බිඳ වැටීමෙන් පසු, සීතල යුද්ධය අවසන් වීමත් සමඟ විශ්වාසය ගොඩ නැගීමේ ක්‍රියා මාර්ගයක් ලෙසටය. එය 1992 මාර්තු මාසයේදී අත්සන් තැබුණ අතර 2002 වසරේ මුල් භාගයේ සිට ක්‍රියාත්මක විය. මෙම ගිවිසුමට රුසියාව, බොහොමයක් නැටෝ රටවල් ඇතුළු රටවල් 34ක් අත්සන් තබා ඇත.



## චීන මුදල් ලොව පුරාම

එක්සත් ජනපදයේ පළමු රෙන්මින් (යුවාන්) නිෂ්කාශන බැංකුව නිව්යෝර්ක් නුවරදී ආරම්භ කෙරුණි. රෙන්මින් (යුවාන්) ජාත්‍යන්තර මුදල් ඒකකයක් බවට පත්වීමේ ගමන් මගේ එක් ප්‍රධාන ජයග්‍රහණයක් වූයේ එය සංචිත ව්‍යවහාර මුදලක් ලෙස නිල වශයෙන් ඇතුලත් කර ගැනීමයි. චීන මහ බැංකුව පසුගිය 21වැනි දින, නිව්යෝර්ක් නුවර පිහිටි චීන බැංකුව (BANK OF CHINA) රෙන්මින් (යුවාන්) නිෂ්කාශන සේවා සපයන බැංකුවක් ලෙස ප්‍රකාශයට පත් කළේය. මේ වන විටත් හොංකොං, ලන්ඩන්, සිංගපූරුව, ටොරොන්ටෝ යන නගරවල රෙන්මින් (යුවාන්) නිෂ්කාශන බැංකු පිහිටා ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල රෙන්මින් මුදල් ඒකකය සිය සංචිත ව්‍යවහාර මුදල් ඒකකයක් ලෙස ප්‍රකාශයට පත් කළ අතර එය ක්‍රියාවට නැගෙන්නේ මෙම ඔක්තෝබර් 01වැනි දින සිටය. ඒ අනුව එදින සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජික රටවල් 189 විසින් රෙන්මින් මුදල් ඒකකය ලෝකයේ ප්‍රධාන සංචිත ව්‍යවහාර මුදල් ඒකක පහෙන් එකක් ලෙස සලකනු ලබයි.



## තව තවත් ගිලෙන එක්සත් ජනපද ආර්ථිකය

ආර්ථික අර්බුදය පියමං කළා යැයි පැවසුණද එක්සත් ජනපදයේ ආර්ථිකය තවදුරටත්, දිගු කාලීන පසුබෑස්මක පවතින බව වාර්තාවේ. මෙම තොරතුරු වාර්තා කරනු ලබන්නේ 'ගැලප්' නම් පර්යේෂණ හා සමීක්ෂණ ආයතනය විසිනි. 1935 වසරේදී ජෝර්ජ් ගැලප් නම් පුද්ගලයා විසින් ආරම්භ කළ මෙම ආයතනය ලෝකය පුරා සමීක්ෂණ හා පර්යේෂණ සිදුකරමින්, සංඛ්‍යා දත්ත හා විශ්ලේෂණ සපයනු ලබයි.

මෙම ආයතනය ඉදිරිපත් කළ සංඛ්‍යාලේඛන අනුව එක්සත් ජනපදයේ ආර්ථිකය දිගු කාලීන පසුබෑස්මක පවතී. එරට මධ්‍යම හෝ ඉහළ මධ්‍යම පංතිකයන් යැයි හඳුන්වා ගනු ලබන පිරිස මේ වන විට 61% සිට 51% දක්වා අඩු වී තිබේ.

එක් එක් ජනපදයේ මිලියන 25කගේ ආර්ථිකය මුළුමනින්ම විනාශ වී ගොස් ඇත. එය මිලියන 250ක් වූ වැඩිහිටි ජනගහනයෙන් 10%කි. එක්සත් ජනපදයේ නිල සංඛ්‍යාලේඛනවලට අනුව එරට විරැකියාව 4.9%කි. එහෙත් ඉහත සඳහන් කළ මිලියන 250ක ජනතාව ඊට අයත් නොවේ. තවද එක්සත් ජනපදයේ හොඳ රැකියාවක් කරන්නෙකු සහ රැකියා නැත්තෙකු හෝ අඩු මට්ටමේ රැකියාවක නිරතවන්නෙකු අතර වෙනස එන්න එන්නම අඩුවෙමින් තිබේ.

එක්සත් ජනපදයේ ශ්‍රම සංඛ්‍යලේඛන කාර්යාංශයේ වාර්තාවලට අනුව එක්සත් ජනපදයේ වැඩිහිටි ජනගහනයෙන් පූර්ණ කාලීනව රැකියාවක නියුක්තවන ප්‍රමාණය 2010 වසරේ සිට 48%ක සීමාවක පවතී. එය 1983න් පසු වාර්තා වූ අඩුම පූර්ණ කාලීන රැකියා නියුක්තික ප්‍රතිශතයයි.



ඉහත 'ගැලව්' ආයතනය සමීක්ෂණවලට අනුව එක්සත් ජනපද කොටස් වෙළඳපළේ වෙළඳාම් කරන ව්‍යාපාර ගණන පසුගිය අවුරුදු 20 තුළදී 50%කින් පමණ, එනම් 7300 සිට 3700 දක්වා අඩු වී ඇත. එපමණක් නොව නව ව්‍යාපාරයන් ආරම්භ කිරීමද බරපතළ ලෙස අඩුවී ඇත.

මේ අතර එක්සත් ජනපදය තුළ කුඩා ව්‍යාපාර ප්‍රමාණය ඉහළ ගොස් තිබේ. එරට අලුතින් රැකියා අවස්ථා නිර්මාණය කරන ප්‍රමාණයෙන් 65%ක් පමණ මේ වනවිට සිදු කරනු ලබන්නේ කුඩා ව්‍යාපාර විසිනි.

# හොරු රකින යහපාලනය: බැඳුම්කර වංචාවේ ඇතුළාන්තය

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳව (2015 පෙබරවාරි සහ 2016 මාර්තු 29වැනි දින සිදු කළ බැඳුම්කර නිකුත් කිරීම) රටේ කිසිදු ගනුදෙනුවකට වඩා මේ වනවිට කතාබහට ලක්වී ඇත. පුවත්පත් සිරස්තල ලෙස ප්‍රවෘත්ති වාර්තා වූ අවස්ථා ගණනාවකි. හිටපු මහා බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන් හට තම ධුරය යළි ලබා ගැනීමටද නොහැකිව ධුරයේ කාලය දීර්ඝ නොකරම ගෙදර යාමටද සිදුවිය. එහෙත් තවමත් බැඳුම්කර ගනුදෙනුවේ උණුසුම පහව ගොස් නැත. දැන් සියලු දෙනාම අවධානයෙන් සිටින්නේ මහා බැංකු බැඳුම්කර ගනුදෙනුව පිළිබඳව පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ (පොදු ව්‍යාපාර පිළිබඳව කාරක සභාව) වාර්තාව එළිදකින තුරුය. බැඳුම්කර යනු කුමක්දැයි නොදන්නා සාමාන්‍ය ජනතාව පවා මහා බැංකු බැඳුම්කර වංචාව ගැන විමසිලිමත්ය. ඒ අන් යමක් නිසා නොව "යහපාලනය" පාලනය මෙම කුප්‍රකට වංචාවට සෘජුව සම්බන්ධව ඇති බැවින් එම සම්බන්ධකම දැන ගැනීමට ජනතාවට ඇති කුතුහලය නිසාවෙනි. ඒ නිසාම මෙම බැඳුම්කර ගනුදෙනුව පිළිබඳවත් එම මූල්‍ය වංචාව වසන් කර මහා බැංකු අධිපතිවරයාට සහ එම ගනුදෙනුවට අනුග්‍රහ දැක්වූ එ.ජා.ප. නායකයින් පිරිසිදු වීමට දරන උත්සාහය තේරුම් ගැනීම මේ මොහොතේදී අත්‍යවශ්‍යය.

### මහා බැංකු බැඳුම්කර නිකුතුව

මහා භාණ්ඩාගාරයේ දැනුම් දීමට අනුව රජයේ ඉදිරි මාසික මුදල් අවශ්‍යතාවය සම්පූර්ණ කරදීම, භාණ්ඩාගර සුරැකුම්පත්, (Treasury securities) එනම්, භාණ්ඩාගාර බිල්පත් (Treasury Bills) සහ භාණ්ඩාගාර බැඳුම්කර (Treasury Bonds) නිකුත් කිරීම පිළිබඳව වගකීම ඇත්තේ මහා බැංකුවටය. වසරකට අඩු කාලයකින් කල් පිරෙන (maturity)අයුරින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරන අතර, වසරකට වැඩි කාලයක් සඳහා දිගු කාලයකට - කල් පිරෙන අයුරින් මහා බැංකුව බැඳුම්කර නිකුත් කරයි. මෙම බැඳුම්කරයක මුහුණත වටිනාකම (Face value)රු. 100ක අගයක් ගනී. ශ්‍රී ලංකා මහා බැංකුව රජයේ නියෝජිතයා ලෙස කටයුතු කරමින් මෙම සුරැකුම්පත් නිකුත් කරයි. 2016 වනවිට මෙම සුරැකුම්පත් - බැඳුම්කර නිකුතුව මිලදී ගැනීම සඳහා සුදුසුකම් ලත් ආයතන (ප්‍රාථමික ගනුදෙනුකරුවන්) 15ක් මහා බැංකුවේ ලියාපදිංචිව ඇත. මෙම ප්‍රාථමික ගනුදෙනුකරුවන් අතර ලංකා බැංකුව වැනි රාජ්‍ය ආයතන සහ හිටපු මහා බැංකු අධිපති අර්ජුන් මහේන්ද්‍රන්ගේ බෑනාගේ සමාගම වන පර්පචුවල් ට්‍රෙෂරීස් වැනි පෞද්ගලික ආයතනද වේ.

### වෙන්දේසිය හා මිලදී ගැනීම

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම ප්‍රාථමික ගනුදෙනුකරුවන් මගින් සිදුකරන අතර එය ක්‍රම දෙකකට සිදුකරයි. එනම්, බැඳුම්කර වෙන්දේසිය (Auction)මගින් සහ පෞද්ගලික නිකුතුව (Private placement) මගිනි. මෙහිදී දෙවැනි ක්‍රමයේදී මහා බැංකුවේ ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතයකට අනුව ප්‍රාථමික ගනුදෙනුකරුවන්ට බැඳුම්කර නිකුත් කරයි.



### වංචනික බැඳුම්කර නිකුතුවේ ක්‍රියාවලිය

2015 මාර්තු මාසය සඳහා භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර නිකුත්කර සපුරාගත යුතු රජයේ මුදල් අවශ්‍යතාවය රු. බිලියන 264.683ක් වූ බවත්, ඉන් රු. බිලියන 89.683ක් භාණ්ඩාගාර බිල්පත් මගින්ද ඉතිරිය රු. බිලියන 172 භාණ්ඩාගාර බැඳුම්කර මගින්ද ලබාගැනීමට රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇත. එම රු. බිලියන 172න් මිලියනයක් පමණක් විවෘත වෙන්දේසියෙන්ද ඉතිරිය සෘජු ක්‍රමයට ප්‍රාථමික ගනුදෙනුකරුවන් මගින් ලබා ගැනීමටත් 2015 පෙබරවාරි 27 රැස්වූ එම කමිටුව විසින් තීරණය කර ඇත.

මෙම ප්‍රශ්නගත බැඳුම්කර නිකුතුවට පෙර සතියේ ද්විතික වෙළඳපොළ තුළ 30 වසරක බැඳුම්කර සඳහා 9.48%ක සාමාන්‍ය පොලී අනුපාතිකයක් පැවැති අතර, ඒ ආසන්න අනුපාතයන්ගෙන් මෙම බැඳුම්කර නිකුත් වේ යැයි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විශ්වාස කර තිබුණි. නමුත්, ක්‍රියාවලිය අවසානයේ බැඳුම්කරය නිකුත් කළ පසු, ප්‍රාථමික තැරැව්කරුවන් 16 දෙනෙකු රු. බිලියන 20.708ක් දක්වා මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර, එම බැඳුම්කර සඳහා 12.5%ක් පොලී අනුපාතයක් ගෙවන ලෙසට මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙහිදී වැදගත්ම කරුණ වන්නේ, මෙම මිල ගණන් ඉදිරිපත්ව තිබූ මුළු මුදලින් 75%ක්ම එනම්, රු. බිලියන 15.531ක්ම මහා බැංකු අධිපතිගේ (අර්ජුන් මහේන්ද්‍රන්ගේ) බෑණනුවන්ගේ සමාගම වන පර්පචුවල් ට්‍රෙෂරීස් සමාගම ඉදිරිපත් කර තිබීමයි. (එයින් මිලියන 13ක්ම ඔහු වෙනුවෙන් ලංකා බැංකුව විසින් ඉදිරිපත් කර තිබුණි)

දේශීය ණය කළමනාකරණ කමිටුව විසින් ප්‍රාථමික වෙන්දේසිය මගින් නිකුත් කිරීමට නිර්දේශ කර තිබුණේ රු. බිලියන 01ක බැඳුම්කරයකි. නමුත් මෙම වෙන්දේසියට මිල ගණන් ඉදිරිපත් වීමෙන් පසුව එදිනම රැස්වූ බැඳුම්කර ටෙන්ඩර් කමිටුව රු. බිලියන 10ක් දක්වාම මිලදී ගැනීමට තීරණයක් ගෙන තිබුණි.

> "මාමා-බෑනා එකමුතුව මෙම ගනුදෙනුව සිදුකර ඇත්තේ අගමැති රනිල් වික්‍රමසිංහ සහ එ.ජා.ප.යේ පූර්ණ අනුග්‍රහය සහ අවශ්‍යතාවය අනුව බව අවස්ථා කිහිපයකදීම හිටපු මහබැංකු අධිපතිවරයා විසින් පිළිගෙන ඇත. නමුත් මේ සියලු වංචා කණපිට හැරවීමෙන් "යහපාලනය" පිරිසිදු කිරීමේ කුමන්ත්‍රණ ව්‍යාපාරයක්ද එ.ජා.ප.ය විසින් දැනටමත් දියත් කර ඇත."

මෙම තීරණය ගෙන තිබුණේ, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් විකල්ප 7ක් අතරින් හොඳම විකල්පය ලෙස රු. බිලියන 2.6ක් පමණක් වෙන්දේසිය මගින් ලබා ගැනීම උචිත යැයි භාණ්ඩාගාර බැඳුම්කර ටෙන්ඩර් කමිටුවට නිර්දේශයක්ද කර තිබියදී එයද නොතකමිනි.

එසේම, එදින ප්‍රාථමික වෙන්දේසියේදී බැඳුම්කර නිකුත් කිරීම රු. බිලියන 01කට සීමා කළේ නම් බිලියන 20ක් වූ මුළු ඉදිරිපත් කිරීම්වලින් 75% කට ප්‍රමාණයකට මිල ගණන් ඉදිරිපත් කළ පර්පචුවල් ආයතනයට අවස්ථාවක් හිමි නොවීමට ඉඩ තිබිණි. නමුත්, වෙන්දේසියෙන් ලබා ගැනීමට අපේක්ෂා කළ රු. බිලියන 10ක් දක්වා වැඩි කිරීමේ තීරණය නිසා එදින නිකුත් කළ මුළු බැඳුම්කරවලින් 50%ක් එනම් බිලියන 05ක් ලබා ගැනීමේ අවස්ථාව පර්පචුවල් සමාගමට ලැබිණි. බැඳුම්කර ගනුදෙනුව වංචනිකව හා හුවමාරු වූ තොරතුරු භාවිතා කර එක් පාර්ශ්වයකට (බෑනා සමාගමට) වාසිදායක වන ලෙස සිදුවූ බව ඉතා පැහැදිලිය. මෙම ගනුදෙනුව වඩාත් සැක සහිත වීමට පහත හේතුද අදාළය. එනම්,

1. වෙන්දේසිය අවසන් කිරීමට ඉතා ආසන්න කාලය තුළ එනම්, අවසන් මිනිත්තු 08 තුළ මුළු ප්‍රමාණය වන රු. බිලියන 20.708කින් රු. බිලියන 13.6කම ලංසු ලැබී තිබීම.
2. ඉහත බිලියන 13.6ක වටිනාකම තුළ රු. බිලියන 13ක්ම පර්පචුවල් සමාගම (බෑනා සමාගම) වෙනුවෙන් ඉදිරිපත් කර තිබීම.
3. රු. බිලියන 01ක් සඳහා මිල ගණන් කැඳවා තිබියදී රු. බිලියන 10.058ක් දක්වා ලංසු පිළිගැනීම
4. පර්පචුවල් (බෑනාගේ සමාගම) වෙනුවෙන් ලංකා බැංකුව රු. බිලියන 13ක් වටිනාකමට ලංසු බැඳුම්කර ඉදිරිපත්කර තිබීම සහ එලෙස ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු වෙනුවෙන් වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලංසු ඉදිරිපත් කළ පළමු අවස්ථාව මෙය වීම

කැඳවන ලද එක් බිලියනක් වෙනුවෙන් පර්පචුවල් ආයතනය පමණක් 15 ගුණයක් (රු. බිලියන 15ක්) ලංසු තැබීම අසාමාන්‍ය තත්වයක් වීම

### බැඳුම්කරයේ අවාසි

මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව අපේක්ෂා කළ පරිදි, මෙම දූෂිත ගනුදෙනුව සිදුවූ ආකාරයට සිදුවීමට ඉඩ නොතබා රු. බිලියන 1ට සීමා කළේ නම්, රු. 100ක් මුහුණත අගය ඇති බැඳුම්කරයක් රු. 104ක් දක්වා වටිනාකම් මහා බැංකුවට ලැබෙන පරිදි නිකුත් කළ හැකිව තිබිණි. එයින් රු. බිලියන 1.4ක් බැංකුවට ලබා ගත හැකිව තිබුණි. එසේ සීමා නොකර බිලියන 10ක් දක්වා ලබා ගත් ප්‍රමාණය ඉහළ නැංවීම නිසා රජයට සිදුවූ පාඩුව රු. බිලියන 889කි. (889,358,050)

එසේම, මහා බැංකුවේ ණය දෙපාර්තමේන්තුව ටෙන්ඩර් කමිටුවට නිර්දේශ කළ හොඳම විකල්ප ක්‍රමය වන රු. බිලියන 2.6ක් බැඳුම්කර නිකුතුව තෝරා නොගෙන රු. බිලියන 10 දක්වා එම ප්‍රමාණය ඉහළ දැමීම නිසා සිදුවූ පාඩුව රු.මිලියන 688කි. මෙම දූෂිත ගනුදෙනුව පිළිබඳව විස්තර වාර්තාවක් විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට (කෝප් කමිටුව) 2016 ජූනි 29දින ඉදිරිපත් කළ අතර එම වාර්තාව පදනම ලෙස සලකා කෝප් කමිටුව විසින් පුළුල් විමර්ශනයක් ආරම්භ කරන ලදී, ඒ අනුව 2016 ජූලි 07 හා අගෝස්තු 12 වැනිදා මහා බැංකු හිටපු අධිපතිවරයා මෙන්ම නව අධිපතිවරයාද පාර්ලිමේන්තුවට කැඳවා මෙම දූෂිත ගනුදෙනුව පිළිබඳව විමර්ශන සිදු කරන ලදී. විගණකාධිපතිවරයාගේ විගණන මතය ඉදිරිපත් කර තිබුණේ පැරණි පාර්ලිමේන්තුවේ සැසිවාරයේ පැවති කෝප් කමිටුවේ අනුකාරක සභාවේ සාකච්ඡා කළ කරුණු සහ තවත් බොහෝ ලිපි ලේඛන පදනම් ලේඛන ලෙස ගෙන හැර දක්වමිනි. ඔහුගේ නිර්දේශ 03ක් විය. එම නිරේදේශ ආණ්ඩුවේ දූෂිත අධිපතිවරයා සහ බලධාරීන් "පිරිසිදු කර ගැනීමට"නොහැකි ප්‍රබල නිගමනයක් විය. ඒවා නම්

1. මෙම ගනුදෙනුවේදී වළක්වා ගත හැකිව තිබූ (අවු. 30කට අදාලව නොව එම ගනුදනෙුව සිදුවූ දිනයේ අවාසිය) රු. බිලියන 1.6 (1674,256,805) අවාසිය වළක්වා ගැනීමට කටයුතු නොකිරීම පිළිබඳව බලධාරීන් වගකිව යුතුයි.
2. මහා බැංකු අධිපතිවරයා තම තර්කයය මෙහෙයවීමේදී මහා බැංකු අධිපතිවරයෙකුගෙන් අපේක්ෂා කරනු ලබන මට්ටමේ වෘත්තීමය විචක්ෂණභාවයකින් (Professional due care) යුතුව කටයුතු කර ඇති බවක් පෙනී නොයයි.

එසේම විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවට වාර්තා කරන තම නිගමන සමගින් තවදුරටත් ප්‍රකාශ

02 වැනි පිටුවට



"ජීවිතයේ විඳ දරා ගත නොහැකි තත්වයකට වැටුණු විටදී පවා ජීවත් වීමට පුළුවන් විය යුතුය. එවැනි ජීවිතයක් පවා ප්‍රයෝජනවත් කර ගත යුතුය."

**නිකොලායි ඔස්ත්‍රොව්ස්කි**

# නාලිනී එන්න! ගෘහ සේවයටම යන්න



හොඳ වැටුපක් ලැබෙන රැකියාවක්, ඉඩමක, නිවසක හැකිනම් වාහනයක හිමිකාරීත්වයක්, හොඳ පවුල් ජීවිතයක්. මේ තාරුණ්‍යයට එළඹෙන හැම යුවතියකගේම සාමාන්‍යයෙන් හිත් ඇතුළෙ දළුලන හීන. ඒත් මේ හීන යථාර්ථයක් කරගත හැක්කේ කීයෙන් කී දෙනාටද? හීන දැකීම එහෙමත් නැත්නම් ඉලක්කයක් තබා ගැනීම හොඳ දෙයක්. ඒත් අපි ජීවත්වෙන්නෙ හීන සැබෑ කර ගැනීමට රුකුල්දෙන සමාජයකට වඩා හීන බොඳ කරන සමාජයක. ඒ නිසා ගොඩක් කාන්තාවන්ට උරුමවෙන්නේ මේ සමාජය ඇතුළෙ අපේක්ෂාභංගත්වය.

අපේ රටේ කාන්තා ශ්‍රම බලකාය 36%ක්. රැකියා කිරීමට හැකි වයසේ කාන්තාවන් බහුතරයකට රැකියාවක් කිරීමේ අවස්ථාව අහිමියි. ඒකට හේතුවෙලා තියෙන්නේ අපේ රටේ නිෂ්පාදන ආර්ථිකයක් නොමැතිකම. ඒ නිසා අලුතින් රැකියා උත්පාදන අවස්ථා ඇතිවනවා නම් ඒ ඉතා මන්දගාමීවයි. මේ නිසා 'හොඳ ජීවිතයක් ගත කිරීමේ' ඒ සිහින සැබෑ කර ගැනීම ඉතා අමාරු, දුෂ්කර කාර්යයක් බවට පත්වෙලා. මේ රටේ රැකියා කරන කාන්තාවන්ටත් එන්න එන්නම වැඩිවන ජීවන වියදම හමුවේ තමන් අපේක්ෂා කරපු හීනවලට ළඟා වීමට නොහැකි තත්වයක් උදාවෙලා.

අපේ රටේ කාන්තාවන් ගෙන් වසරකට ලක්ෂයකට වැඩි පිරිසක් විදෙස් රැකියා සඳහා පිටත්වෙන්නේ මෙවැනි වටපිටාවක් තුළයි. ඒ මෙරටදී සැබෑ කර ගැනීමට නොහැකි වූ සිහින කෙසේ හෝ සැබෑ කරගැනීමේ අරමුණින්. 2015 වසරේ රැකියා සඳහා කාන්තාවන්ගේ විදෙස්ගතවීම සංඛ්‍යාත්මකව ලක්ෂයකට මදක් (90 677- මහ බැංකු වාර්තාවට අනුව) අඩු වුවද එම වසරේ රැකියා සඳහා විදෙස්ගත වූවන් ගෙන් 57%ක්ම පිටත්වී ඇත්තේ නුපුහුණු ශ්‍රමිකයන් ලෙසින් හා ගෘහ සේවිකා තනතුර සඳහායි. ගෘහ සේවය සඳහා මැදපෙරදිගට ගිය ඇතැම් කාන්තාවන්ට මුහුණ දීමට සිදුවූ හිංසා පීඩාවන්, ගැටලුකාරී තත්වයන් පමණක් නොව ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වූ අවස්ථා පිළිබඳවද වරින්වර අසන්නට ලැබෙනවා. ඒත් එවැනි සිදුවීම් කොතරම් නම් වාර්තා වුවද ආර්ථික ප්‍රශ්න හමුවේ කාන්තාවන්ට මැද පෙරදිග ගෘහ සේවයට නොයා සිටීමට නොහැකි තත්වයකට පත්වෙලා.

තම පවුලේ අනාගතය වෙනුවෙන් රට රැකියාවේ සිහිනය සැබෑ කර ගැනීමට යන බොහෝදෙනා යන්නේ තම ගේ දොර, ඉඩකඩම් පවා උගස් කර ණයකරුවන් බවට පත්වෙමිනුයි. එසේ යන කාන්තාවන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයකට විවිධ වධ හිංසාවන්ට ලක්වී නැවත මෙරටට පැමිණීමට සිදු වූ අවස්ථාද එමටයි. මැද පෙරදිග විවිධ අනාථ කඳවුරුවලත් ඒ රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල තුළත් සිටින විවිධ අතවරයන්ට ලක්වූ, තාඩන පීඩනයන්ට ලක්වූ කාන්තාවන්ගේ ප්‍රමාණය පිළිබඳව තවමත් නිවැරැදි සංඛ්‍යාලේඛන පවා නැහැ.

ක්වේට්හි රැකියා සඳහා ගොස් නොයෙක් වධ හිංසාවන්ට ලක්වූ ලාංකේය කාන්තාවන් 35 දෙනෙකු මෙරටට පැමිණීම එසේ මෑතදී පළවූ ප්‍රවෘත්තියක්. මේ ආකාරයට මේ වසර තුළ ක්වේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ රැඳී සිටි 1183 දෙනෙකු මෙරටට පැමිණ තිබෙනවා. ගෘහ සේවිකාවන් ලෙස මෙරටින් වැඩි ප්‍රමාණයක් පිටත්ව යන්නේ සවුදි අරාබියටයි. මැද පෙරදිග ගිය කාන්තාවන්ගෙන් වැඩිම මරණ ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේද, වැඩිම වධ හිංසා ප්‍රමාණයක් වාර්තා වී ඇත්තේද සවුදි අරාබිය තුළයි.

ලංකාව තුළ කාන්තාවන්ට රැකියා අවස්ථා උත්පාදනය නොකළ, පැවතුණු හා පවතින ආණ්ඩු විදෙස් රැකියා සඳහා පිටව යන කාන්තාවන්ගේ රැකියාවේ හා ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතතාවය වෙනුවෙන් කර ඇත්තේ මොනවාද? මේ තාක් පාලකයන් කර ඇත්තේ ඉතා දුෂ්කර තත්වයන් යටතේ දුක්, කඳුළු වගුරවමින් ඔවුන් මෙරටට උපයා එවන විදේශ විනිමයෙන් සුර සැප විඳීම නොවේද? පාලකයන්ට අවශ්‍යව ඇත්තේ වහලුන් සේ තව තවත් කාන්තාවන් ගෘහ සේවයටම යැවීම නොවේද?

විදෙස් රැකියා වෙළෙඳපොළට කාන්තාවන් වෘත්තීය මට්ටමින් පුහුණු කර රැකියා අවස්ථා ලබාදීමට වැඩපිළිවෙළක් සකස් කරනවා වෙනුවට, විදෙස් රැකියා සඳහා පිටත්වූවන්ගේ රැකියාවේ ගැටලු මතුවන අවස්ථාවන්වලදී රාජ්‍යතාන්ත්‍රික මට්ටමින් ඊට මැදිහත් වනවා වෙනුවට පාලකයන් කරමින් සිටින්නේ පුරසාරම් දොඩවමින් සිටීම නොවේද? එවැනි ආකාරයේ පාලකයන් නැවත නැවතත් පත්කර ගැනීමට වැඩි දායකත්වයක් දක්වන පුද්ගලයන් ලෙස අප අප ගැනම ලජ්ජා විය යුතු නොවේද? ඉතින් දැන්වත් අප කළ යුත්තේ, අපේ හිත් ඇතුළෙ උපදින සිහින සැබෑ කර ගැනීමට සුදුසු සමාජ වටපිටාවක් නිර්මාණය කර ගැනීමට කාන්තාවන් ලෙස සක්‍රියව මැදිහත්වීමයි.

## සිව්දෙසින්



### පුරුෂ භාරකාරත්වයට එරෙහිව අන්තර්ජාල පෙත්සමක්!

සවුදි අරාබියේ පවතින පුරුෂ භාරකත්ව ක්‍රමය අවලංගු කරන ලෙස ඉල්ලා එරට ආණ්ඩුවට බල කෙරෙන අන්තර්ජාල පෙත්සමකට දහස් ගණනින් සවුදි කාන්තාවන් අත්සන් ලබාදී ඇති බව වාර්තා වේ.

සවුදි කාන්තාවන්ගේ ජීවිතයේ මූලික කටයුතුවලදී එනම් විවාහයේදී, ගමන් බිමන් යාමේදී, බන්ධනාගාරවලින් නිදහස් වීමේදී, සමහර රැකියාවන්ට අදාළ කාරණාවලදී, සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේදී හා වෙනත් කාරණාවලදී තම පියාගේ, සහෝදරයකුගේ, ස්වාමිපුරුෂයාගේ, පුතෙකුගේ හෝ පිරිමි ඥාති පාර්ශ්වයකගේ අනුමැතියකින් තොරව කටයුතු කිරීමට නොහැකිය.

''කාන්තාවන්ටත් පූර්ණ පුරවැසියෙකුට සේ සැලකිය යුතුයි.'' දශකයක කාලයක් තිස්සේ තම අයිතීන් වෙනුවෙන් සටන් කරමින් සිටින සවුදි අරාබි කාන්තා ක්‍රියාකාරිනියෝ පවසති.

### තිදෙනෙකුගේ DNA යොදා ගනිමින් බිහිකළ ලොව පළමු දරු උපත...

පුද්ගලයින් තිදෙනෙකුගේ **DNA** සම්බන්ධ කර ගනිමින් නව ආකාරයකින් බිහිකරන ලද ලොව පළමු දරුවා නිරෝගිමත්ව සිටින බව ඊට සම්බන්ධ වෛද්‍යවරු පවසති.

මෙම දරුවා මේ වසරේ අප්‍රේල් 06 වන දින උපත ලද අතර එම දරුවාගේ මව්පියන් ජෝර්දාන් වැසියන්ය. බිළිඳා එක්සත් ජනපද සාඑල්‍යය මධ්‍යස්ථානයක විශේෂඥවරුන්ගේ රැකවරණය යටතේ සිටින බව පැවසේ.

මයිටොකොන්ඩ්‍රියම් හුවමාරු ක්‍රමය යටතේ නිරෝගිමත් දරුවකු ලබා ගත හැකි බව මෙම වෛද්‍යවරුන්ගේ අදහසයි. බෙලහීනතාවයෙන් පෙළෙන මව්පියවරුන් හා මාරාන්තික ජාන රෝගවලින් පෙළෙන මව්පියවරුන් ඉලක්ක කරගනිමින් මෙම ක්‍රමය සාර්ථකව යොදා ගතහැකි බව වෛද්‍යවරුන් පවසයි.

මයිටොකොන්ඩ්‍රියම් හුවමාරු තාක්ෂණ ක්‍රමය 2015 වසරේ සිට එක්සත් රාජධානියේද නීතිගත කර ඇත.



## හොඳම දේ දරුවන්ටමයි හිමි...!

අකුරු විරසක වුණු පුතු
මෙහෙවර කරයි අන්සතු
හැඳ වැකුණු දැලි කුණු
පිරුවට ලෙසින් සතුවුණු...

සුවඳ මල් කැකුළු
පෙළති මත් බඹරු
ගිගුම් දෙයි කරළිය
හඬින් එරෙහිව නැගුණු
අහෝ ටික දිනකින්
බිඳෙයි ලෙස පෙණ බුබුළු...

නොහැකිව රකිනු
පුතුන් සමඟම මව්වරු
කියයි තම අවනඩු
ගං දියට ගැඹුරු...
මවට දෙස් තියපු
කිඹුලන් හෙළති කඳුළු...
කිරි සුවඳ නොදැන
ගං දෑල රැඳුණු...

රජ මැතිඳ සිටුවරු
වේදිකාවල ගරු
කා බී ප්‍රීතියෙන්
ගයයි "දූ දරුවන් රැකිය යුතු"
ඒ රැකිය යුතු දරු
ඇහිඳියි එබිම වූ කුණු...

හැම දරුවෙක්ම නිති
අපේ දරුවෙක්මැයි ඉති
හැඟෙන යම් දිනකදි
කැකුළු පෙති -
නොසිඳෙනු ඇති...
නැගුණු මදහස් ඇති
ලොවක් නුදුරේම -
එළඹෙති
හොඳම දේ දරුවනි
නුඹලාටමයි එහි හිමි



දැනුම සමාජය හා චින්තනය 09

# ප්‍රකෘතිය වටහා ගැනීමේ මාවත්



"සාර් එලවා දැමීම දුෂ්කර දෙයක් නොවීය. ඒ සඳහා අවශ්‍ය වුයේ දින කිහිපයක් පමණකි. ඉඩම් හිමියන් පන්නා දැමීමත් බොහෝ දුෂ්කර දෙයක් වුයේ නැත. එය මාස කිහිපයකින් කළ හැකි විය. ධනපතීන් පන්නා දැමීමත් මහත් දුෂ්කර වුයේ නැත. නමුත් පන්ති අහෝසි කිරිම අනුපමේය තරම් දුෂ්කරය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**11වැනි වෙළුම,**
**68පිටුව**

මිනිසාගේ දැනුම තුළ විද්‍යාව වෙනුවට මිත්‍යාවත් සත්‍යය වෙනුවට අසත්‍යයත් පැවතීමේ හේතු මීට පෙර අපි සාකච්ඡා කළෙමු. ඒවා යළි පෙළගස්වන්නේ නම් අතීත සම්ප්‍රදායන් හා මිත්‍යාවන් මිනිසුන්ගේ චින්තනය තුළ පරපුරෙන් පරපුරට පැවත ඒම, ධනවාදී අධ්‍යාපනය ලෝක ජනගහනයෙන් විශාල පංගුවක් අධ්‍යාපනයෙන් පිටමං කර අවිද්‍යා අන්ධකාරයේ ගිල්වා තැබීම, ලාභ වෙනුවෙන් ප්‍රාග්ධන හිමියන් අසත්‍යයන් හා මිත්‍යාවන් නැවත නැවත තහවුරු කිරීම, ලාභ ප්‍රයෝජන, වරප්‍රසාද වෙනුවෙන් ආගමික සංස්ථාවන් මිත්‍යා මත තුළම ජනතාව තබා ගැනීමට උත්සාහ කිරීම, පංති වුවමනාවන් සඳහා ධනේශ්වර රාජ්‍යය දැනුවත්වම මිත්‍යාවන් පවත්වාගෙන යාම මිත්‍යාව පැවතීමේ හේතු අතර ප්‍රධාන වේ.

මෙහිදී ධනේශ්වර පංතිය ප්‍රතිවිරෝධයක සිටී. සිය නිෂ්පාදනයන් සඳහා වැඩි වැඩියෙන් සූරාකෑම හා ලාභ ලැබීම සඳහා, ලෝකයේ රටවල් යටත්කර ගැනීම සඳහා, අවිවල ආධිපත්‍යය පවත්වා ගැනීම සඳහා ඔවුනට විද්‍යාව හා තාක්ෂණය අවශ්‍යය. ඒ අරමුණින් ඔවුහු විද්‍යාව හා තාක්ෂණය දියුණු කරති. ඒ අතරම ජනතාව තම පාලනය තුළ ප්‍රාග්ධනයේ වහලුන් ලෙස තබා ගැනීම සඳහා ඔවුනට මිත්‍යාවන්ද අවශ්‍ය වේ. එබැවින් ධනේශ්වර පංතිය එක විටම විද්‍යාව මෙන්ම මිත්‍යාවද නිෂ්පාදනය කරමින් පවත්වාගෙන යයි.

## සත්‍යය හා සමාජවාදය

මේ අනුව මානව චින්තනය අවිද්‍යාවෙන් මුදවා ගත හැක්කේ, ධනවාදයත් ධනේශ්වර පංති වුවමනාවත් පැරදවූ සමාජයකදීය. එනම් සමාජවාදී සමාජයකදීය. මිත්‍යාව සමාජවාදය ගොඩනැගීමට බාධා කරන්නක් වන නිසා සමාජවාදය නිතරම සිටින්නේ අවිද්‍යාවට එරෙහිව විද්‍යාව පැත්තේය. අසත්‍යයට එරෙහිව සත්‍යයේ පැත්තේය. මාක්ස්වාදයේ කතුවරු සමාජවාදය නම් කළේද 'විද්‍යාත්මක සමාජවාදය' ලෙසය.

සමාජවාදය යනු මානව අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවා අවශ්‍ය තරම් නිෂ්පාදනය කිරීමත් එකී නිෂ්පාදනයේ ප්‍රතිලාභ සමස්ත සමාජයටම සාධාරණ ලෙස බෙදී යාමත් අරමුණු කරගත් සමාජයකි. මානව අවශ්‍යතා අඩු නැතිව සැපිරිය හැකි නිෂ්පාදනයක් සඳහා සොබාදහම ජයග්‍රහණය කළ යුතුය. සොබාදහම මානව අවශ්‍යතා සඳහා යොදා ගැනීමේදී සොබාදහම ආරක්ෂා කරමින් එය කළ යුතුය. ඒ සඳහා සොබා දහමේ රහස් හෙවත් ප්‍රකෘතියේ සංවර්ධනයේ නියාම හඳුගත යුතුය. සොබාදහමත් මානව සමාජයත් ඒ තුළ වන සියලු



මතවාදයනුත් එකට ගත්විට එය හඳුන්වන්නේ ප්‍රකෘතිය නමිනි. මානව සංහතියේ ප්‍රගමනය සඳහා, සමාජ සංවර්ධනය සඳහා මිනිසා ප්‍රකෘතිය සමඟ කරන ගනුදෙනුව වඩා නිවැරදි හා ප්‍රතිඵලදායක එකක් වීමට නම් ප්‍රකෘතිය නිවැරදිව වටහා ගත යුතුය.

## විද්‍යාව කළ මෙහෙය

ලෝකය තුළ විද්‍යාව විසින් සිදුකර ඇත්තේ කුමක්ද? ප්‍රකෘතියේ එක් එක් ක්ෂේත්‍රවල රහස් හෙවත් ඒ ඒ ක්ෂේත්‍රවල චලනයේ යාන්ත්‍රණය හා නියාම හෙළිකර ගැනීමය. සොබාදහම ජය ගැනීමට හැකිවුයේ ඒ නිසාය. භෞතික විද්‍යාව විසින් භෞතික වස්තූන්ගේ චලනය හැසිරීම හා එහි පොදු නියාම සොයාගත් අතර රසායන විද්‍යාව, ජීව විද්‍යාව ආදිය එම ක්ෂේත්‍රවල රහස් අනාවරණ කරන ලදී. සමාජ විද්‍යාවන් විසින් සමාජ සංවර්ධනයේ නියාම හෙළිකරන ලදී. ඒවා සොයා ගැනීමෙන් තොරව එම ක්ෂේත්‍රවල ගැටලු විසඳීමට මිනිසාට හැකි වන්නේ නැත. දැනුම යනු එයයි. උදාහරණයක් ලෙස නූතන මිනිසා ගුවන් ගමන් යයි. ඒ සඳහා වූ ගුවන් යානය නිපදවීමට ඔහුට හැකිවූයේ භෞතික වස්තූන් අතර පවත්නා ගුරුත්ව බලය සොයාගැනීමත් පෘතුවියේ ගුරුත්වාකර්ෂණය හෙළිකර ගැනීමත් යාන්ත්‍රික චලිතයේ එක් නියාමයක් වන සෑම ක්‍රියාවකටම ඊට සමාන වූද ප්‍රතිවිරුද්ධ වූද ප්‍රතික්‍රියාවක් තිබේය යන්න සොයා ගැනීමත් නිසාය. භෞතික විද්‍යාවේ මෙම නියාම අයිසෙක් නිව්ටන් විසින් ඉදිරිපත් කළ අතර පසුව මෙය තවත් දියුණුකර අයින්ස්ටයින් විසින් ක්වොන්ටම් භෞතික විද්‍යාව සොයා ගන්නා ලදී. ඒවා යනු අපේ චින්තනය තුළ ප්‍රකෘතිය හා එහි නියාම නිවැරදිව පිළිබිඹු වීම විය. විද්‍යාව මෙම ක්‍රියාවලියේ ගමන් කරන්නේ සාපේක්ෂ සත්‍යයන් හෙළිකර ගනිමිනි. එම සාපේක්ෂ සත්‍යයන් නිරපේක්ෂ සත්‍යයන් බවට පත් වන්නේ දර්ශනයේදීය.

භෞතික විද්‍යාවේත් රසායන විද්‍යාවේත් තාරකා විද්‍යාවේත් ක්‍රියාකාරිත්වය විසින් මේ වනවිට අප වෙසෙන සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ අපේ සූර්යයා පිළිබඳ විශ්වය පිළිබඳ, විශ්වයේ බිහිවීම, තරුවල පිහිටීම හා ඒවා අතර දුර පිළිබඳ බොහෝ රහස් අනාවරණය කරගනු ලැබ තිබේ. එසේ තිබියදී මිනිස්සු මෙම දැනුම කිසිවක් නොතිබූ මීට වසර 3,000කට පමණ පෙර පෘථිවිය පැතලි වස්තුවක් සේ සලකා බිහිකළ ජ්‍යොතිෂයේ තවමත් එල්බ සිටිති. ජ්‍යොතිෂයේ මිත්‍යාව වෙනුවට තාරකා විද්‍යාව ජනතාව අතරට ගෙනයාමට නම් දැන් අවිද්‍යාවෙන් මුදල් ඉපයීම නතර කරන ග්‍රහලෝකවල බලපෑමට බියෙන් නොසිටින නව සමාජයක් නිර්මාණය විය යුතුය. සමාජවාදය අවශ්‍ය වන්නේ එයටය. අවිද්‍යාව රජකරන, ජනතාව මිත්‍යාවේ හිරකර තබන ධනවාදී සමාජය වෙනස් කොට ජනතාව විද්‍යාව හා සත්‍යය වෙත රැගෙන යන නව සමාජයක් ගොඩනගා ගැනීමට නම් මානව සමාජයේ සංවර්ධනයේ නියාම හඳුනා ගත යුතුය.

එම කාර්යයේදී අපට විශ්වාසය තැබිය හැකි වන්නේ මාක්ස්වාදී චින්තනයටය. මාක්ස්වාදී දාර්ශනික මගපෙන්වීම් කෙරෙහිය.

## ලෝකය තේරුම් ගැනීමේ පොදු ආකාර

භෞතික වස්තූන්ගේ සංවර්ධනයට, ඒවායේ චලිතට වඩා මානව සමාජයේ සංවර්ධනය හා එහි චලිතය වඩාත් සංකීර්ණය. මිනිස් සමාජයක් යනු මිනිසුන් රැසක විවිධත්වයේ හා ඒකත්වයේ සංයුක්ත ක්‍රියාකාරිත්වයක ඵලයක් නිසා මානව සමාජයේ සංවර්ධනයේ නියාමයන් හඳුනා ගැනීම වඩාත් අසීරුය. එය විද්‍යාවන්ට වඩා සංකීර්ණය. භෞතික වස්තූන්ගේ චලිතයේ නියාම සොයා ගැනීමට භෞතික විද්‍යාව සමත් වුවත් එවැනි විද්‍යාවකින් සමාජ සංවර්ධනයේ නියාම හෙළිකළ නොහැක. විද්‍යාත්මක සත්‍යයන් මත පදනම් වූ දාර්ශනික පද්ධතියක් අවශ්‍ය වන්නේ ඒ නිසාය.

මෙහිදී මෙතෙක් බිහිකරන ලද, හෙළිකරගන්නා ලද නිවැරදිම දාර්ශනික පද්ධතිය වන්නේ මාක්ස්වාදයයි. එය මනෝමූලික නිගමන මත බිහිවූවක් නොව විෂයමූලික සත්‍යයන් මත බිහිකරන ලද්දකි. සියලු විද්‍යාවන්ගෙන් පෝෂණය වී ඇති එය භාවිතයෙන්ද සත්‍ය බව ඔප්පු කරන ලද්දකි. මාක්ස්වාදී දර්ශනයේ මූලික සිද්ධාන්ත වන්නේ මොනවාද? ඒවා කෙටියෙන් ගතහොත් ලෝකය ද්‍රව්‍යමය එකක් බව පිළිගැනීම, ද්‍රව්‍ය චලිතයේ පවතින බව හෙවත් ද්‍රව්‍ය වෙනස් වෙමින් පරිණාමයක පවතින බව පිළිගැනීම හා එමගින් මැවුම්වාදය ප්‍රතික්ෂේප කිරීම, ද්‍රව්‍යයේ චලිතය සිදුවන්නේ කාලයේ සහ අවකාශයේ බව හෙළිකිරීම හා ද්‍රව්‍ය චලිතයට හේතුවන ඒවායේ අභ්‍යන්තර ක්‍රියාකාරිත්වය හෙවත් දයලෙක්තිකය හෙළිකිරීම වේ. ඒ අනුව මාක්ස්වාදයේ දර්ශනය දයලෙක්තික භෞතිකවාදී දර්ශනයක් වේ.

## දොරටු 6ක්

මාක්ස්වාදී දර්ශනය ප්‍රකෘතිය තේරුම් ගැනීමේදී හා වටහා ගැනීමේදී එක් මාර්ග යක් නොව මාර්ග 06ක් හෙවත් ආකාර 06ක් ඉදිරිපත්කර තිබේ. සාමාන්‍ය එදිනෙදා ජීවිතයේදී ප්‍රකෘතියේ පවතින භෞතික වස්තූන්, සමාජමය වස්තූන්, විවිධ සිදුවීම්, ක්‍රියාකාරකම් තේරුම් ගැනීමේදී මිනිසුන් ඒවා වෙත පිවිසෙන්නේ තමන්ට හුරු එහෙත් අවිද්‍යාත්මක ක්‍රමවලටය. මිනිස්සු බොහෝ විට යමක් සිදුවූ විට එහි සැබෑ හේතුව වහාම හෙළිකර ගැනීමට අසමත් වෙති. තමන්ට විපතක් කරදරයක් වූ විට එය වෙනත් බලවේගයක බලපෑමෙන් සිදුවූවක් ලෙස හෝ 'වෙලාව', 'කරුමය' ආදී ලෙස සිතති. මිනිසුන් බොහෝ දේවල් මතුපිටින් පමණක් දකින අතර ඒවායේ හරය නොදකිති. ඒ නිසාම සෑම වස්තුවකම හැම සිදුවීමකම පෙනුම එහි හරය ලෙස සිතා වැරදි නිගමනවලට එළඹෙති. අතීතයේ මිනිසුන් පෘථිවිය වටා සූර්යයා ගමන් කරනවා යයි සිතුවේ මෙම පෙනුම හා හරය පටලවා ගැනීම නිසාය. මේ පිළිබඳව වරක් එංගල්ස් පවසා තිබුණේ "හරය පෙනුම සමපාත වන්නේ නම් විද්‍යාවත් අවශ්‍ය නොවනු ඇත" කියාය.

ප්‍රකෘතිය වටහා ගැනීමේදී සිදුවන මෙම වැරැද්ද නිවැරදි කර ප්‍රකෘතිය නිවැරදිව වටහා ගැනීමට නම් ඒ වෙත එක් ප්‍රවේශ මාර්ගයක් නොව, එක් කවුළුවකින් නොව ප්‍රවේශමාර්ග කිහිපයකින් කවුළු කිහිපයකින් ඒ වෙත ප්‍රවේශ විය යුතුය. ඒ දෙස බැලිය යුතුය. පංචේන්ද්‍රියයන් විසින් අපට ලබාදෙන ජීවමාන සංජානනයෙන් සෑහීමකට පත් නොවී තාර්කික ඥානය මගින්ද විමසා බැලිය යුතුය. පරීක්ෂණ හා නිරීක්ෂණ අවශ්‍ය වන්නේ ඒ සඳහාය. සංස්ලේෂණ-විශ්ලේෂණ අවශ්‍ය වන්නේද ඒ සඳහාය. නිවැරදි නිගමන වෙත ආ හැක්කේ ඒ මගිනි.

මේ අනුව ප්‍රකෘතිය තේරුම් ගැනීම සඳහා අපගේ දැනුම තුළ, අපගේ චින්තනය තුළ සත්‍යය පිළිබිඹු වීම සඳහා අවශ්‍ය වන මාක්ස්වාදය විසින් ඉදිරිපත් කර ඇති පොදු ආකාර 06ක් තිබේ. එම ආකාර 06 පිළිබඳව කතාකිරීම මීළඟට හමුවෙමු.

> සිය නිෂ්පාදනයන් සඳහා වැඩි වැඩියෙන් සූරාකෑම හා ලාභ ලැබීම සඳහා, ලෝකයේ රටවල් යටත්කර ගැනීම සඳහා, අවිවල ආධිපත්‍යය පවත්වා ගැනීම සඳහා ඔවුනට විද්‍යාව හා තාක්ෂණය අවශ්‍යය. ඒ අරමුණින් ඔවුහු විද්‍යාව හා තාක්ෂණය දියුණු කරති. ඒ අතරම ජනතාව තම පාලනය තුළ ප්‍රාග්ධනයේ වහලුන් ලෙස තබා ගැනීම සඳහා ඔවුනට මිත්‍යාවන්ද අවශ්‍ය වේ.

කාලීන

'විකිණීම, බිලිදීම සහ එට්කා' යන තේමාවෙන් පසුගිය සැප්තැම්බර් 20වැනි දින කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ පවත්වන ලද සම්මන්ත්‍රණයේදී ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විසින් සිදු කරන ලද දේශනයේ සංක්ෂිප්ත ලිඛිත සටහනක් කාලීන වැදගත්කම සලකා මෙසේ පළ කරේ.

# රට අනුගමනය කරන වැරදි ආර්ථික ප්‍රතිපත්තිය වෙනස් කළ යුතුයි!

රට තුළ ආන්දෝලනයට ලක්වන මාතෘකා ගණනාවක් තිබෙනවා. මේ සියලු මාතෘකා අතරේ යටින් දිවෙන මහා දැවැන්ත අර්බුදයක් රට තුළ තිබෙනවා. අපේ රටේ ජනතාවගෙන් කොයි තරම් ප්‍රමාණයකට නිවාස නැද්ද කියලා ආණ්ඩුව දන්නේ නැහැ. එක වෙලාවකට කියනවා, අපේ රටේ පවුල් ලක්ෂ 15කට ගෙවල් නැහැ කියලා. තවත් වෙලාවක පවුල් ලක්ෂ හත හමාරකට නිවාස නැහැ කියනවා. තමන්ට ඉන්න නිවසක් නැතිව පීඩාවට පත් වෙලා ඉන්නේ උතුරේත් දකුණේත් ජනතාවයි. ඒ වගේම විශාල රැකියා හිඟයක් මතුවෙලා තිබෙනවා. තරුණයින් ලක්ෂ තුන හමාරක් විරැකියාවෙන් පෙළෙනවා. අවුරුදු 25 අඩු රැකියා කළ හැකි තරුණයින්ගෙන් 21%කට රැකියා නැහැ. උතුරේත් දකුණේත් තරුණයින් විරැකියාවෙන් පීඩා විඳිනවා. ජීවත් වීමට සරිලන ආදායකමක් නොලැබීමෙන් ජනතාව පීඩාවට පත්වෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයා පසුගියදා පාර්ලිමේන්තුවේදී කිව්වා අපේ රටේ ජනතාවගෙන් 43%ක් ඩොලර් 2කට වඩා ආදායම අඩුයි කියලා. රුපියල් 290ක ආදායමක් නැතිව ජීවත් වෙන්නේ කොහොමද? අපේ රටේ ජනතාගෙන් විශාල පිරිසකට ජීවිතය අහිමි කොට තිබෙනවා.

අපේ රටේ ජනතාව තමන්ට ඉන්න ගෙයක් හදාගන්න පරම්පරා ගණනක් දුක් විඳිනවා. කෙනෙකුට ඉන්න තැනක් නොලැබීම බේදවාචකයක් නොවේද? තමන්ගේ දරුවන්ට නිසි අධ්‍යාපනයන් ලබාදෙන්න බැරිනම් එය බේදවාචකයක් නොවේද? අපේ රටේ පාසල් 400ක් තිබෙනවා එක ළමයෙකුවත් ඇතුළත් නොකරපු. පාසැල් 2000ක් තිබෙනවා ළමයින් දහ දෙනෙකුට අඩුවෙන් ඇතුළත් කරපු. පාසල් 4000ක් තිබෙනවා, ළමුන් 20කට අඩුවෙන් ඇතුළත් කරපු. නමුත් පාසල් 26කට ඉල්ලුම් පත්‍ර ලක්ෂයක් ඉක්මවලා ලැබෙනවා. අපේ රටේ අධ්‍යාපනය සීමිත පාසල් ප්‍රමාණයකට සීමා කර අනෙක් සියල්ල අත්හැර දමා තිබෙනවා.

ජනතාව සෞඛ්‍ය අතින් අනාරක්ෂිතභාවයට පත්වෙලා. බෝ වෙන රෝගවලින් පීඩා විඳිනවා. රෝග විනිශ්චය කර ගන්න බැරිව දුක් විඳිනවා. ලෙඩරෝග නිසා මිනිසුන් ආර්ථික අතින් බෙලහීනතාවයට පත්වෙලා. මේ නිසා ඇත්ත සටනක් අපිට තිබෙනවා. මේක වත්මන් නායකයින්ගේ පමණක් අර්බුදයක් නෙවෙයි. වසර 68ක් තිස්සේ අපේ රට පාලනය කරපු පාලකයින්ගේ වැරදි ආර්ථික ප්‍රතිපත්තියේ ව්‍යසනයයි, අද දකිමින් තිබෙන්නේ. අපේ රටේ ආර්ථිකය අද මර ලතෝනි දෙමින් තිබෙනවා.

රනිල් වික්‍රමසිංහලා අද මොකද කියන්නේ? රනිල් ආර්ථික ඔස්තාද් කියලා බොරු මතයක් හදලා තිබුණා. දැන් ආණ්ඩුවේ උපාය මාර්ගය වී තිබෙන්නේ රාජ්‍ය ආයතන විකිණීමයි. රාජ්‍ය සම්පත් ස්වභාවික සම්පත් බිලි දීමයි. සේවා ක්ෂේත්‍රය තවදුරටත් විවෘත කිරීම සඳහා එට්කා වැනි ගිවිසුම් අත්සන් කිරීමයි.



ජනතා විමුක්ති පෙරමුණ විකිණීමට විරුද්ධයි. කුඩා ආර්ථිකයක් තිබෙන අප වැනි රටක අත්‍යවශ්‍ය පංගුවක් රජය විසින් හැසිරවිය යුතුයි. එසේ නැතිනම් ව්‍යාපාරිකයින් අතළොස්සකට මුළු රටේ ආර්ථිකය බිලිවෙන්න පුළුවන්කම තිබෙනවා.

රනිල් වික්‍රමසිංහලා කරන්න හදන්නේ මේ සියල්ල අත්හරින්නයි. ඒ සඳහා ඔවුන් ඉදිරිපත් කරන හේතුව රාජ්‍ය ආයතන පාඩු ලබන බවත් රටට බරක් වී තිබෙන බවයි. දැන් එයාර් ලංකා සමාගම විකුණන්න හදනවා. රනිල් වික්‍රමසිංහ කියනවා පාඩු ලබන එයාර් ලංකා එකට දාන සල්ලි නවත්වලා එම මුදල් පාසල් වලට දෙනවා කියලා. එහෙම සුන්දර කතා කියනවා. පාඩු නිසා විකුණන කතාව බොරුවක්.

මේ ආයතන පාඩු ලබන්නේ ජනතාවගේ වරදින් නෙවෙයි. අපේ රටේ තෙල් සංස්ථාව, ඉන්දියානු අයි.ඕ.සී. සමාගම තෙල් වෙළඳාමේ යෙදෙනවා. පිටරටින් තෙල් ආනයනය කරමින් ගබඩා කරමින්, රට පුරා තිනෙ ෂෙඩ් හරහා තෙල් වෙළඳාමේ යෙදනවා. අයි.ඕ.සී. සමාගම විශාල ලාභයක් ලබාග න්නා අතර ආණ්ඩවේ තෙල් සංස්ථාව පාඩුයි කියනවා. රටේ තෙල් වෙළඳාමෙන් 65%-66%ක් වැනි විශාල ප්‍රමාණයක් තෙල් සංස්ථාව සතුව තිබියදී පාඩු ලබන්නේ කොහොමද? වැරැද්ද කාගේද? එතන වරද තිබෙන්නේ පාලකයාගෙයි. පාලකයාගේ වරදට තෙල් සංස්ථාව වන්දි ගෙවිය යුතු නැහැ.

**පාඩු ලබනවා කියලා තෙල් සංස්ථාව විකුණනවා නම් පොලීසියත් විකුණා දාන්න කියලා අපි කියනවා. අකාර්යෂකම වී තිබෙන්නේ එක් එක් ආයතන පමණක් නෙවෙයි, මුළු ආණ්ඩුවම අකාර්යක්‍ෂමයි. එහෙනම් ආණ්ඩුවත් විකුණා දාන්න ඕන. එනිසා මේ තිබෙන්නේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රශ්නයක්.**

ලෝකය පුරා නිදහස් ප්‍රාග ්ධනය රිංගන්න බැරිවුණු තැන් තිබෙන්නේ ආණ්ඩුව සතුවයි. එයාර් ලංකා, කොළඹ වරාය නැගෙනහිර ජැටිය, විදෙස් ප්‍රාග්ධනයට රිංගන්න ඉඩ හදලා දෙනවා. අපේ රටේ සම්පත්, ශ්‍රමය සූරාකන්න ඉඩ හදලා දෙනවා. රනිල් වික්‍රමසිංහලා කරන්න හදන්නේ අධිරාජ්‍යවාදී ප්‍රාග්ධනයට ඉඩ හදන එකයි. කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විදෙස් සමාගමකට දෙන්න මේ වෙනකොටත් ටෙන්ඩර් කැඳවලා ඉවරයි. නමුත් සහතික ලෙස අපි කියනවා, කොළඹ වරායේ නැගෙනහිර ජැටිය විකුණා

> "රනිල් වික්‍රමසිංහලා අද මොකද කියන්නේ? රනිල් ආර්ථික ඔස්තාද් කියලා බොරු මතයක් හදලා තිබුණා. දැන් ආණ්ඩුවේ උපාය මාර්ගය වී තිබෙන්නේ රාජ්‍ය ආයතන විකිණීමයි. රාජ්‍ය සම්පත් ස්වභාවික සම්පත් බිලි දීමයි. සේවා ක්ෂේත්‍රය තවදුරටත් විවෘත කිරීම සඳහා එට්කා වැනි ගිවිසුම් අත්සන් කිරීමයි. "

දැමීමේ ප්‍රයත්නය පරාජයට පත් කරනවා.

කුඩා නිෂ්පාදනයක් තිබෙන අපේ රටේ කොළඹ වරායත් ඉහළම වරායන් 26 අතර තිබෙනවා. කොළඹ, ගාල්ල, හම්බන්තොට, ඔලුවිල්, ත්‍රිකුණාමලය යන වරායවල් 5ක් අපේ රටට තිබෙනවා. අෂ්රොෆ් ඇමතිවරයා වරාය ඇමති වුණාට පස්සේ ඔලුවිල් වරාය හැදුවා. ඒ සඳහා විශාල ණය මුදලක් ගත්තා. අපි රු. කෝටි 800ක් වියදම් කළා. දැන් විවෘත කරලා අවුරුදු 3ක් ගතවුණත් එක නැවක්වත් වරායට ආවේ නැහැ. හම්බන්තොට වරායට කෝටි 14,400ක් වියදම් කළා. කෝටි 12,900ක් ණය ගත්තා. මේ වෙනකොට හම්බන්තොට වරායේ පාඩුව රු. කෝටි 3800යි. මේ සියල්ලට මුදල් දාන්නේ කොළඹ වරායේ ආදායමින්. කොළඹ වරායේ පර්යන්තවල බහාලුම් කටයුතු කොම්පැණි 3කට දීලා තිබෙනවා. මීට පෙර වරාය අධිකාරිය මගින් 86%ක් බහාලුම් කටයුතු මෙහෙයවූවා. දැන් එය 38% දක්වා අඩුවෙලා තිබෙනවා. ගැඹුරු අඩු නිසා නැගෙනහිර ජැටිය පසුගිය කාලයේ විශාල වියදම් කරලා ගැඹුර වැඩි කළා. දොඹකර ගෙනත් වැඩ ආරම්භ කරන්නේ නැතිව දැන් නැගෙනහිර ජැටියත් විකුණන්න හදනවා. ආණ්ඩුවේ ඇමතිවරයෙක් කිව්වා පෝට් සිටිය චීනයට දුන්න නිසා ඉන්දියාව අප්සට් එකේ ඉන්නවා, ඒ නිසා නැගෙ නහිර ජැටිය ඉන්දියාවට දෙනවා කියලා. එතන ආර්ථික සාධක නැහැ. එනිසා මෙම නැගෙ නහිර ජැටිය විකිණීම පරාජයට පත්කළ යුතුයි.

**මත්තල ගුවන්තොටුපොළ සහ හම්බන්තොට වරාය පවරාගෙන කර්මාන්ත හදන්න කියලා රනිල් වික්‍රමසිංහ චීනයට ගිහින් කිව්වා. කෝටි 14,400ක් වියදම් කරපු හම්බන්තොට අඩු ගණනේ කෝටි 20,000ටකවත් විකුණන්න ඕනැ. නමුත් හම්බන්තොට වරාය හදපු චීනයම කියනවා ඒක කෝටි 14,400ක් වටින්නේ නැහැ කියලා. එතන තමයි ගැහිල්ල තිබෙන්නේ. ඇත්තටම වරායට කෝටි 14,400ක් වියදම් කරලා නැහැ.**

ඊළඟට ලංකා හොස්පිටල් එකත් විකුණන්න හදනවා. පෞද්ගලික රෝහල්වල ගාස්තු නියාමනය කිරීමේ මධ්‍යස්ථානයක් විදියට ලංකා හොස්පිටල් ආයතනය ආණ්ඩුවට භාවිතා කරන්න පුළුවන්. එවැනි තත්වයක් තිබියදී ලංකා හොස්පිටල් ආයතනය විකුණා දමන්න හදනවා.

දෙවන ලෝක යුද්දෙ කාලයේ ත්‍රිකුණාමලය ආශ්‍රිතව තෙල් ටැංකි 102ක් ඉදිකළා. මෙම තෙල් ටැංකිවල තෙල් මෙ.ටොන් 10,000ක් පමණ ගබඩා කරන්න පුළුවන්. එසේ තිබියදී විකුණන්න හදනවා. හම්බන්තොට වරාය හදන්න කලින් මුල් සැලසුම වූයේ නැව්වලට සේවා සැපයීමේ ස්ථානයක් ගොඩනැග ීමයි. හම්බන්තොට වරාය ආසන්නයෙන් දිනකට නැව් විශාල ප්‍රමාණයක් ගමන් කරනවා. එයින් නැව් 100කට තෙල් ගහන්න පුළුවන් නම් එය අපේ රටට විශාල ආදායමක්. කොළඹ වරායේ වියදමින් තෙල් ටැංකි 12ක් හම්බන්තොට වරායේ ඉදිකළා. ඒ තෙල් ගබඩා ටැංකි ටිකත් රනිල් වික්‍රමසිංහ විකුණන්න හදනවා. අයි.ඕ.සී. එකට, ජොන් කීල්ස් මුදලාලිට රටේ සම්පත් බිල්ලට දෙනවා.

කල්පිටිය ආශ්‍රිතව අපේ රටට අයිති දූපත් 14ක් තිබෙනවා. මහින්ද රාජපක්‍ෂගේ කාලයේ එයින් දූපත් දෙකක් විකුණා දැම්මා. අක්කර 1256ක් පමණ තිබෙන තවත් දූපතක් දැන් විකුණන්න හදනවා. රනිල් වික්‍රමසිංහ හම්බන්තොට දිසාපතිට ලියුමක් යවනවා හම්බන්තොට ප්‍රදේශයේ අක්කර 15,000ක් කර්මාන්ත ශාලා හදන්න සමාගම්වලට පවරා දෙන්න කියලා. අපේ රටේ මුතුන් මිත්තන්ගේ සිට පාරම්පරිකව පැවත එන ඉඩම් සම්පත සමාගම්වලට බදු දෙන්න හදනවා.

පෝට් සිටි ව්‍යාපෘතිය හරහා අපේ රටේ විශාල ඉඩම් ප්‍රමාණයක් විදෙස් රටවල්වලට අයිති කරගන්න හදනවා. පෝට් සිටි ව්‍යාපෘතිය මගින් මතුපිට ඉඩම අක්කර 600ක් පමණ අපිට අහිමි වෙනවා. මුහුදු පත්ලේ ප්‍රමාණය අක්කර 1,000 ඉක්මවනවා. මේ ඉඩ ප්‍රමාණය පිරවීම සඳහා වැලි ඝන මීටර් ලක්ෂ 650ක්, ගල් ඝන මීටර් ලක්ෂ 34ක් අවශ්‍යව තිබෙනවා. ඊට අවශ්‍ය වැලි මීගමුව කලපුවෙන් ලබාග න්න සැලසුම් කර තිබෙනවා. ඒ හරහා මීගමුව අවට වෙරළ දැඩි හානියකට පත්වෙනවා. විශාල ජෛව විවිධත්වයක් තිබෙන ජීවී සම්පත, කොරල් පර විනාශ වෙනවා. කඩුවෙල හංවැල්ල ප්‍රදේශවල කළුගල් ලබාගන්න සැලසුම් කර තිබෙනවා. එම ප්‍රදේශවලත් පරිසර පද්ධතිය දැඩි හානියකට පත්වෙනවා. මේ ආකාරයට මුළු පරිසර පද්ධතියම බිලි දෙමින් තිබෙනවා. එක පැත්තකින් රාජ්‍ය ආයතන විකුණමින්, තවත් පැත්තකින් රටේ වටිනා සම්පත් බිලි දෙමින් ඉන්නවා. මෛත්‍රී රනිල් ආණ්ඩුව හරියට ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිකරුවෝ වගේ. රටේ සම්පත් සියල්ල වෙන්දේසි කරමින් තිබෙනවා. මේවා ආණ්ඩු නෙවෙයි. ආණ්ඩුවක් කළ යුතුව තිබෙන්නේ රටේ සම්පත් ආරක්ෂා කිරීමයි.

දැන් ආණ්ඩුව කරමින් තිබෙන්නේ, එට්කා ගිවිසුම හරහා එම තොරතුරු තාක්‍ෂණික ක්ෂේත්‍රය ඉන්දියාවට විවෘත කරන්නයි. තොරතුරු තාක්‍ෂණික ක්ෂේත්‍රය ඉතාම වැදගත් බව ඉන්දියාව තේරුම් අරගන තිබෙනවා. එට්කා ගිවිසුම සඳහා සිදුකරන සාකච්ඡාවලදී අයි.ටී.ක්ෂේත්‍රය අතහැරීමට ඔවුන් කිසිදු සූදානමක් නැහැ. තොරතුරු තාක්‍ෂණ ආයතන දියුණු කරන්න අපේ රටේ ආණ්ඩුව මුදල් ආයෝජනය කරන්නේ නැහැ. එම ක්ෂේත්‍රය ඉන්දියාවට විවෘත නොකළ යුතුයි. අපේ රටේ තරුණයින්ගේ අනාගතය තමයි එට්කා මගින් බිලි දෙන්න හදන්නේ.

**ඉන්දියාවේ විශාල රැකියා වියුක්තියක් තිබෙනවා. ඒ හරහා ලංකාවේ තරුණයින්ට අවස්ථාව අහිමි කරනවා. ඒ මගින් ලංකාවේ දක්‍ෂ තරුණයා රට අත්හැර යාමට පෙළඹෙනවා. එම නිසා එට්කා ගිවිසුම අත්සන් කිරීමට ඉඩ ලබාදිය යුතු නැහැ. ඊට එරෙහිව සටනක් ආරම්භ කළ යුතුයි.**

ආණ්ඩුව විසින් විකුණන්න හදන බිලිදෙන්න හදන රටේ මර්මස්ථාන ටික අපි හරියට තෝරාගන්න ඕනැ. ඉන්පසු මේ විකිණීම පරාජයට පත්කිරීම වෙනුවෙන් සටනක් දියත් කළ යුතු වෙනවා; එම සටන ජයග්‍රහණය දක්වා ගෙන යා යුතුව තිබෙනවා. එම සටන එතනින් නතර නොකළ යුතුයි. මේ විකිණීම ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් එකක ගැටගැහිලා තිබෙනවා. රනිල්ගේ මෛත්‍රීගේ පමණක් ගැටලුවක් නෙවෙයි. ඔවුන්ගේ නොහැකියාව අර්බුදය තිව්‍ර කරනවා. දැන් ධනවාදයට බල කර තිබෙනවා ආණ්ඩුව සියල්ල අත්හැරිය යුතුයි කියලා. ආණ්ඩුව විසින් සිදුකරන්නේ නීති සකස් කිරීම සහ යටිතල පහසුකම් ලබාදීම පමණයි. ඒක තමයි නව ලිබරල්වාදී වට්ටෝරුව. ඒ අනුව තමයි අපේ රටේ ආණ්ඩුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට, රේගුවට, සංශෝධන ගේන්නේ. ඒ හරහා එම සේවාවන් පෞද්ගලීකරණය කරන්න හදනවා. ඒ නිසා සටන තිබෙන්නේ හුදු පෞද්ගලීකරණය කිරීමට එරෙහිව, හුදු විකිණීමට බිලිදීමට එරෙහිව පමණක් නෙවෙයි; මේ අනුගමනය කරමින් තිබෙන වැරදි ආර්ථික ප්‍රතිපත්තිය වෙනුවට වෙනස් ආර්ථික ප්‍රතිපත්තියක් ගොඩ නඟා ගැනීම වෙනුවෙන් මේ සටන දියත් කළ යුතුව තිබෙනවා.



15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 සැප්තැම්බර් 06

# කොන්ත්‍රාත් වහල් සේවය අහෝසි විය යුතුයි!

## පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා

(කාර්මික ආරවුල් පනතේ සංශෝධන පිළිබඳ විවාදයට එක්වෙමින්)

ඇමතිතුමනි, ඔබතුමා දන්නවා මේ වන විට රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක සේවා කටයුතු සිද්ධ වෙන්නේ මේ කියන manpower සේවා ආයතන මඟින් බව. දැනට අවුරුදු 10, 15, 20 වැනි කාලයක් manpower ආයතන මඟින් යෙදවූ සේවකයින් වැඩ කරනවා. ප්‍රධාන පෙළේ බැංකුවල, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වැනි ප්‍රධාන රාජ්‍ය ආයතනවල පවා අද සේවය කරන්නේ manpower ආයතන මඟින් යෙදවූ සේවකයන්. සමහර වෙලාවට සේවකයන්ට ප්‍රශ්නයක් වුණාම ඒ සේවකයන්ට යන්න තියෙන්නේ තමන් වැඩ කරන ආයතනයට නොවේ. වැඩ කරන ආයතනයත් එක්ක කිසිදු ගිවිසුමක් නැහැ. වැඩ කරන ආයතනයේ බැඳීමක් නැහැ. ඒ සේවකයන්ගේ සේවක අයිතිවාසිකම් සම්පූර්ණ කරන්න. පෞද්ගලික සමාගමක් ගත්තොත් "කොකා-කෝලා" වැනි පෞද්ගලික සමාගමක් වෙන්න පුළුවන්. බහුජාතික සමාගම් වෙන්න පුළුවන්. ඒවායේ වැඩ කරන සියලුම සේවකයන් සම්පාදනය කරන්නේ මේ manpower ආයතනවලින්. සමහර වෙලාවට තමන් හිතනවා තමන් වැඩ කරන්නේ manpower එකේ කියලා. හැබැයි බලාගෙන යන කොට තමන් වැඩ කරන්නේ "අප්පුහාමි" කියන manpower ආයතනයේ. "අප්පුහාමි" කියන manpower ආයතනයත් අවුරුදු දෙකෙන්, තුනෙන් තමන්ගේ සේවා ගිවිසුම් වෙනස් කර තිබෙනවා. ඒ කියන්නේ, ඒ manpower ආයතනය අතින් අතට මාරු වෙනවා. අවුරුදු 10ක්, 15ක් යන කොට manpower හිමිකාරිත්වයත් මාරු වෙලා තිබෙනවා. සේවකයා දන්නේ නැහැ, තමන්ගේ සේව්‍ය පක්ෂය, එහෙම නැත්නම් තමන්ගේ 'හාම්පුතා' කවුද කියලා. එවැනි අවාසනාවන්ත තත්ත්වයක් දැනට තිබෙනවා. ඒ නිසා, ඒ නිසා ඇමතිතුමන්ලාගේ පැත්තෙන් වහාම ඒ මැතිවරණ පොරොන්දුව ඉටු කරන්න. මැතිවරණයේදී ඔබතුමන්ලා පුන පුනා කිව්වා, "අපේ රටේ කම්කරුවන් මුහුණ පාන ප්‍රධාන ප්‍රශ්නයක් වන මේ කොන්ත්‍රාත් සේවය, එහෙම නැත්නම් වහල් සේවය නැති කරනවාය කියා. ඒක වැඩකරන ජනතාව හඳුන්වන්නේ "වහල් සේවය" කියලායි.

රුපියල් 700ක දීමනාවක් දෙනවා නම් ඇත්තටම කම්කරුවාට ලැබෙන්නේ රුපියල් 300ක් හෝ 350ක් පමණයි. ඉතිරි රුපියල් 350ම එහෙම නැත්නම් සියයට 50ම ඒ කොන්ත්‍රාත් සමාගම ගන්නවා. කොන්ත්‍රාත් සමාගම නිකම් ඉඳලා, සේවකයෝ සැපයීම කියන පදනම මත පමණක් වැටුපෙන් අර්ධයක් ලබා ගැනීම කිසිසේත්ම සාධාරණ වෙන්නේ නැහැ. ඒ ක්‍රමය වහාම වෙනස් කළ යුතුව තිබෙනවා.

### මෑන් පවර් 'කොන්ත්‍රාත්' කරලා

බැංකු ගත්තොත් පසු ගිය කාලයේ manpower ආයතන හරහා අවුරුදු 10ක්, 15ක් වැඩ කළ සේවකයන්ව මීට අවුරුදු එකහමාරකට, දෙකකට කලින්, ආණ්ඩුව ආවාට පසුව, ඔබතුමන්ලා මේ පොරොන්දුව ඉටු කරනවා කියලා සමහර තැන්වල කොන්ත්‍රාත් පදනමට හැරෙව්වා. එහිදී කිසිදු වෙනසක් වෙලා නැහැ. manpower ආයතනයේ වැඩ කළ සේවකයා එම රජයේ හෝ පෞද්ගලික ආයතනයේම කොන්ත්‍රාත් සේවකයෙක් වෙලා ඉන්නවා. නමුත් ස්ථිර කරලා නැහැ. දැන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ ලංකා බැංකුව වාගේ රාජ්‍ය බැංකු ආයතනවලට ගියොත්- පෙනෙනවා විවිධ කොන්දේසි දාලා ඒවායේ notice කරලා තිබෙනවා, අවුරුදු හතක් manpower ආයතනයක වැඩ කරලා තිබෙනවා නම්; තවත් අවුරුදු දෙකක් එකී රාජ්‍ය ආයතනයේ කොන්ත්‍රාත් සේවයේ වැඩ කරලා තිබෙනවා නම් ඔහුට හෝ ඇයට ස්ථිර වෙන්නට පුළුවන් බව. අපේ රටේ කම්කරු නීතියට අනුව, ඔබතුමන්ලාම මේ



පාර්ලිමේන්තුවට ගෙනැල්ලා සම්මත කළ නීතියට අනුව මාස හයකට වැඩි කාලයක් එක දිගට සේවයේ නියුක්ත වුණා නම් එම සේවකයා අනිවාර්යයෙන් ස්ථිර කළ යුතුයි. එහෙම තිබියදී කොහොමද ඒ ආයතනය දන්වීම් පළ කරන්නේ අවුරුදු දෙකක් කොන්ත්‍රාත් සේවයේ සිටියොත් පමණයි ස්ථිර කරන්නේ කියලා.

පසුගිය කාලයේ විදුලිබල මණ්ඩලයේ සහ ටෙලිකොම් ආයතනයේ කොන්ත්‍රාත් සේවකයන් පිළිබඳ ගැටලු මතු වුණා. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන්ට අනිවාර්යයෙන්ම ස්ථිර කරනවා කියලා ඔබතුමන්ලා පොරොන්දු වුණා. නමුත් මෙ වන විට එයින් භාගයක් විතර තමයි ස්ථිර කරලා තිබෙන්නේ. ඉතිරි අය සම්බන්ධයෙන් තවමත් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන නැහැ. ඒ පිළිබඳව ලැබෙන ආරංචි තමයි, ඔවුන්ව ස්ථිර කරන්නේ නැහැ; ඒ වෙනුවට නව තාක්ෂණය භාවිතා කරනවා; නව තාක්ෂණය භාවිත කරන විට ඔවුන්ව ස්ථිර කරනවා වෙනුවට ඉන්න අයත් එළියට දමන්නයි සිදු වෙන්නේ කියන එක. මේක ඔබතුමන්ලා දීපු මැතිවරණ පොරොන්දුවට මුළුමනින්ම පටහැණි දෙයක්. ඒ නිසා ඉතිරි සේවකයන් ස්ථිර කරන්නට, ඒ අයව බඳවා ගැනීමට අවශ්‍ය කරන කඩිනම් මැදිහත්මක් අත්‍යවශ්‍ය වෙලා තිබෙනවා.

අවසාන වශයෙන් වතුකරයේ සාමූහික ගිවිසුම අත්සන් කළේ 2013දීයි. හරි විදිහට නම් 2015 මාර්තු අගවන විට වතු සේවකයින් සහ සේව්‍ය පාර්ශවය අතර සාමූහික ගිවිසුම් අත්සන් කළ යුතුව තිබුණා. නමුත් අද වනතුරු ඒ ගිවිසුම් අත්සන් කර නැහැ.

### දවස් 25ක් වැඩ ඕනෑ

නියෝජ්‍ය ඇමතිවරු මේ පාර්ලිමේන්තුවේදී පෙට්‍රල් වක්කරගෙන ගිනි තියාගන්නත් හැදුවා. පෙට්‍රල් දමාගෙන ගිනි තියාගන්න හදපු සංදර්ශන පැවැත්වුවත්, රුපියල් දෙදහස් පන්සීයේ ඒ දීමනාව වතු සේවකයන්ට ලබාදෙන්න ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලාට තවම බැරි වුණා. එතකොට ඔවුන්ගේ පැත්තෙන් ඔවුන් ඉදිරිපත් කළ තර්කය තමයි, "අප පාර්ලිමේන්තුවේ නීතිවලට බැඳිලා නැහැ. අප සාමූහික ගිවිසුම් අනුව තමයි කටයුතු කරන්නේ. ඒ අනුව තමයි අපේ බැඳීම් තිබෙන්නේ" කියන එක. ඊට පසුව ඔබතුමන්ලා රුපියල් මිලියන 10,000ක සල්ලි වෙන් කළා කිව්වා. ඒ අයට ණය දුන්නාය කිව්වා. ණයවලින් ඒ පඩිය ගෙවන්න කිව්වා. අවසානයේ ඔබතුමන්ලා පල්ලම් බැහැලා කිව්වා, "දවසකට රුපියල් 100 ගණනේ දෙන්න."කියා. එතකොට මාසයකට දවස් 25ක් වැඩ කළොත් පමණයි රුපියල් සියයේ ඒවා 25ක් 2,500ක් හම්බ වන්නේ. හැබැයි, දැන් කිසිම හාම්පුතෙක්, කිසිදු වතු සමාග මක් කිසිදු වතු සේවකයෙකුට අඛණ්ඩව දින 25ක් වැඩ කරන්න අවස්ථාව ලැබෙන්නෙත් නැහැ. එහෙම නම් "අනිවාර්යයෙන්ම දවස් 25ක් වැඩ කරන්න දෙන්න." කියන එක අනිවාර්ය කරන්න ඕනෑ.

2016 සැප්තැම්බර් 08

# ටෙලි නාට්‍ය ගුණය වර්ධනය කරන ආයතනයක් ඕනෑ!

(කලාව, කලාකරුවාගේ හා ජනතාවගේ රසවින්දනය පිළිබඳ කල් තැබීමේ විවාදයට එක්වෙමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා

1979 වසරේදී අපේ රටේ තිබුණේ චිත්‍රපටශාලා 359යි. 2014 වසර වන විට එය 130 දක්වා අඩුවෙලා තිබෙනවා. චිත්‍රපට කර්මාන්තයේ යම් කඩා වැටීමක් තිබෙනවා. 1979 වසරේදී අපේ රටේ ප්‍රේක්ෂකයන් ලක්ෂ 750ක් චිත්‍රපට බලලා තිබෙනවා. 2014 වසර වන විට එය ලක්ෂ 40 දක්වා අඩු වෙලා තිබෙනවා. අපේ රටේ වැඩිම පිරිසක් චිත්‍රපට බලපු අවුරුද්දේ ලක්ෂ 750ක් තමයි චිත්‍රපට බලලා තිබෙන්නේ. නමුත් ටෙලි නාට්‍ය ගත්තොත්, සතියක් ඇතුළත බලන ප්‍රමාණය ඊට සමාන වෙනවා. දවසකට ලක්ෂ 120ක් පමණ බලන මාධ්‍යයක් බවට අද එය පත් වෙලා තිබෙනවා. අනවසරයෙන් ඇවිල්ලා, අප මත කඩා ගෙන වැදිලා, වෙන කරන්න දෙයක් නැතිකමට මොන නාලිකාව දැම්මත් ඒ පැය තුන ඇතුළේ අපට බලන්න ඉඩ සලසන මාධ්‍යයක් බවට ටෙලි නාට්‍ය පත් වෙලා තිබෙනවා. සිනමාශාලා අඩු වුණාට, සිනමා ශාලාවලට යන ප්‍රේක්ෂකයන් ප්‍රමාණය අඩු වුණාට, රූපවාහිනිය නැරඹීම වැඩි වෙලා තිබෙනවා.



හැම ගෙදරකම වාගේ රූපවාහිනී යන්ත්‍රයක් තිබෙනවා. රාකාරියට ගිහිල්ලා ආවාට පස්සේ, කාර්යාලීය කටයුතු අවසන් කළාට පස්සේ, ව්‍යාපාරය වැහුවට පස්සේ, පාසල් ගිහිල්ලා ආවාට පස්සේ, හැම දෙනාටම නරඹන්න තිබෙන, අපේ ඇගේ වදින මාධ්‍යය බවට අද ටෙලි නාට්‍ය පත් වෙලා තිබෙනවා. ඒ නිසා ඒවායේ ප්‍රමිතිය අතිශයින් වැදගත් කරුණක් බවට පත් වෙලා තිබෙනවා. ඒවා වැඩිපුර නරඹන්නේ එක්කෝ අපේ රටේ තරුණ මව්වරු, එහෙම නැත්නම් මව්වරු වීමට සිටින තරුණියන්. ඔවුන්ට තමයි ටෙලි නාට්‍යවලින් වැඩිම බලපෑමක් සිදු වන්නේ. ඒ නිසාමයි ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳව අපි වැඩි වැඩියෙන් සැලකිලිමත් විය යුතු වන්නේ.

නාට්‍ය කලාවේ අර්බුදය ගත්තොත්, දැන් මේක නහයෙන් උඩටත් ගිහින් තිබෙන්නේ. අපි මේ කථා කරන්නේ ඇත්තටම, මේකේ කොතැනින් හෝ කොණක් අල්ලා ගෙන, ආපසු හරවන්න පුළුවන්ද කියා බලන්නයි. ඒ සඳහ දරන ලද උත්සාහයක් තමයි මේ තිබෙන්නේ.

> ටෙලි නාට්‍යවල ගුණාත්මක තත්ත්වය වර්ධනය කරන්න, ජනතාවට උසස් රස වින්දනයක් ලබා දෙන්න යම් ව්‍යවස්ථාපිත ආයතනයක් ඇති කළ යුතුයි. ඒ ආයතනය මඟින් ටෙලි නාට්‍ය සහ ටෙලි නිෂ්පාදන වර්ගීකරණයක් කළ යුතුයි. ඒ වර්ගීකරණය අනුව අවම මිලක් තීරණය කළ යුතුයි. ඒ අවම මිල තීරණය කළාට පස්සේ නාලිකාවලට පුළුවන් තමන්ට කැමැති විධියට ඒ ටෙලි නාට්‍ය මිලදී ගන්න. ඒ විතරක් නොවෙයි, ටෙලි නාට්‍යයක් විකාශනය කරන්න තිබෙන කාලය පිළිබඳව ඒ මණ්ඩලයට තීන්දු කරන්න පුළුවන්. එවැනි මණ්ඩලයක් නිර්මාණය කර ගැනීමකින් තොරව අපට මෙතැනින් එහාට යන්න බැහැ.

### ටෙලි මිල බැහැලා

මේ අර්බුදයේ ප්‍රධාන පැති දෙකක් තිබෙනවා. එකක්, දැන් මේ ටෙලිනාට්‍යවල ගුණාත්මකභාවය බිඳවැටීම. දෙවන කාරණය, විදේශීය ටෙලිනාට්‍යවලින් සිදු කරන ආක්‍රමණය. අපේ ටෙලිනාට්‍ය ගුණාත්මකව බිඳ වැටීමට බලපා තිබෙන්නේ, මේ ක්ෂේත්‍රයේ හිටපු මා කලින් කිව්ව වාගේ, සිනමාවෙන් ආපු, සාහිත්‍යකරණයෙන් ආපු, එසේ නැත්නම් අපේ වේදිකාවෙන් ආපු, දක්ෂයන් මේ ක්ෂේත්‍රයෙන් ඉවත්වෙලා තිබීමයි. එසේ නැත්නම් දක්ෂයන්ගෙන් වැඩ නොගැනීමයි. ඒකට ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ, නිෂ්පාදන වියදමට සාපේක්ෂව මේ නිර්මාණ මිලදී නොග ැනීමයි. මේ නිර්මාණ මිලදී ගන්නේ කුණු කොල්ලයට.

ටෙලි නාට්‍යයක්ය කියන්නේ අපි තිරයේ දකින රංගන ශිල්පී, ශිල්පිනියන් පමණක් නොවෙයි. ඒ පිටුපස ඉතා විශාල පිරිසක් ඉන්නවා. අධ්‍යක්ෂවරුන්, පසුතල නිර්මාණකරුවන්, රංගන ශිල්පීන් ශිල්පිනියන්, කැමරා ශිල්පීන්, කැමරා අධ්‍යක්ෂවරුන්, පටිගත කරන්නන්, ගීත රචකයන් මේ ආදී නිර්මාණකරුවන් සමූහයකගේ සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් තමයි මේ ටෙලි නාට්‍ය නිර්මාණයක් කියන්නේ. එහෙම වෙන කොට අද රූපවාහිනී නාලිකාවක් ටෙලි නාට්‍යයක එක කථාංගයක් මිල දී ගන්නේ කීයටද?

එදා ටෙලි නාට්‍යයක් නිර්මාණය කරන කොට අධ්‍යක්ෂකවරයා, රංගන ශිල්පීන්, තාක්ෂණ ශිල්පීන් ඇතුළු සියලුදෙනා එකතු වෙලා යම් පූර්ව සූදානමක් කරනවා; වැඩමුළු තියනවා; සාකච්ඡා කරනවා, පිටපත අධ්‍යයනය කරනවා. එහෙම කරලා තමයි shoot එකට එන්නේ. හැබැයි, අද කොහොමද කරන්නේ? උදේට එන්න කියනවා. ඒ ආපු එක්කෙනා එක්ක shoot කරනවා. බිරිඳගේ සහ සැමියාගේ දර්ශනයක් රූපගත කරන්න ඕනෑ නම්, බිරිඳට රඟපාන නිළිය ආවේ නැතත් සැමියාට රඟපාන්න ආපු නළුවා ඉන්නවා නම්, ඒ නළුවා එක්ක ඒ කොටස කරනවා. බිරිඳට රඟපාන එක්කෙනා හවසට ආවොත් ඇයත් එක්ක ඒ කොටස කරනවා. ඒ තැනට තමයි මේ කර්මාන්තය පත්වෙලා තිබෙන්නේ.

විවිධ ස්ථානවල රූගත කිරීම් කළොත් තමයි ටෙලි නාට්‍යයක විචිත්‍ර බව වැඩි දියුණු වන්නේ. හැබැයි, අද මේ මිල ප්‍රශ්නය නිසා බොහෝ අධ්‍යක්ෂවරු පෙළඹිලා තිබෙනවා ඉතාම සීමිත ස්ථාන ප්‍රමාණයක්, කොළඹ අවට තිබෙන සීමිත ස්ථාන ප්‍රමාණයක් locations බවට පත් කරගෙන රූගත කිරීම් කරන්න. එකම තැන තමයි රූගත කිරීම් කරන්නේ.

### කලාකරුවන් කුලීකරුවන් කරලා

ඒ විතරක් නොවෙයි. රඟපානවා කියන එක කජු කනවා වාගේ වැඩක් නොවෙයි නේ.

## කවුළුව හැර තබමි

# මෙහෙම ගියොත් බඩුම තමයි

වැඩ වර්ජනයක් නිසා රජයේ රෝහල්වල හදවත් සැත්කම් නවතී.

කම්කරු නිලධාරීන් දින 21 ක් තිස්සේ වර්ජනයේ

අජිත් නිවාඩ් කබ්රාල් මහතා මහා පරිමාණ දූෂණ ගනුදෙනු 13 ක් කරලා. තවම කිසිදු පරීක්ෂණයක් නැහැ.

මේ දිනවල පුවත් පත්වල පළවූ වාර්තා කිහිපයකි ඒ.

අම්මලා පාසල් එනකොට අඳින ඇඳුමේ විනීතභාවය රැකීමට අධ්‍යාපන ඇමතිගෙන් චක්‍රලේඛයක්

පාසැල් නැතිව දරුවන් දහස් ගණනක් අතරමං

මේ තවත් පුවත්පත් වාර්තාවකි.

රාජ්‍ය සේවකයෝ රාජ්‍ය ආයතන විකුණා කෑමට එරෙහිව සටන් වදිද්දී, සෞඛ්‍ය සේවකයින් තම අයිතීන් වෙනුවෙන් සටන් වදිද්දී, විශ්වවිද්‍යාල සිසුන් වීදිවලට බසිද්දී, පාසල් යන වයසේ දරුවන්ට පාසල් අහිමි වෙද්දී, දූෂිතයින් කෝටි ප්‍රකෝටි ගණන් මහජන මුදල් ගසාකද්දී යහපාලන ආණ්ඩුවට ලොකුම කාරණය වී ඇත්තේ අම්මලා ඉස්කෝලෙට අඳින ඇඳුමය. රටේ දැවෙන ප්‍රශ්නවලට කන් වසන ආණ්ඩුව අම්මලාගේ ඇඳුමට ඇස් අරිති. පාසැල්වල පිළිගත හැකි විනයක් තිබිය යුතුය. එය අවිවාදිතය. එහෙත් රට කරවන මහ එවුන් රටේ ආර්ථික, දේශපාලන, මූල්‍ය, සමාජීය විනය අමු අමුවේ වනසමින් කටයුතු කරමින්ම අම්මලාගේ ඇඳුමේ එල්ලී සිටිති. මේ නම් අපූරු පාලකයින් ඉන්නා රටකි. රටේ අපරාධ දෝරේ ගලද්දී ආණ්ඩුව අම්මලාට රෙද්ද වනයි. මෙහෙම ගියොත් යහපාලනයේ රෙදි ගැලවෙන දිනයද වැඩි ඈතක නොමැත. දැනටමත් මේ ආණ්ඩුවේ බොහෝ දෙනා වැඩ කරන්නේ රෙදි නැති ගාණටය. ආණ්ඩුවේ රෙදි ගැලවුණාට නම් කම් නැත. එය හොඳය. ප්‍රශ්නය වන්නේ ඒ රෙදිවලින් රටේ ප්‍රශ්න වසා දැමීමය.



# පර නොවන මල



1967 'චේ' අනුස්මරණය කරමින් කළ කතාවකදී ෆිදෙල් කැස්ත්‍රෝ පැවසුවේ 'චේ' සියවසේ දේශපාලන 'කලාකරුවා' බවයි. 'චේ' විසින් ගරිල්ලා යුද්ධයේදී පෙන්වූ ප්‍රවීණභාවය පෙන්වා දීමේ මුඛ්‍ය අදහසිනි, ෆිදෙල් එසේ පවසා තිබුණේ. 'හෙයිඩ්' නැමති දේශපාලන විචාරකයා ෆිදෙල් කියූ කාරණයේ අර්ථය පුළුල් කරමින් පවසා සිටියේ 'චේ' නැමති අලංකාර නිර්මාණයේ හිමිකරුවා 'චේ'ම බවයි. නැතිනම් ඔහු වැනි නව මිනිසකු නිමවූ මිනිසා ඔහුම බවයි. ඔහු ඔහු විසින්ම පූර්ණ මිනිසකු බවට පත් විය. 'චේ' ගේ චරිතයට ලබා දෙන අරුත් දිනෙන් දින පුළුල් වේ. අලුත් වේ. ඒ අනුව 'චේ' යනු උත්තුංග විප්ලවීය 'කලා කෘතියක්' වැනිය. ඔහු විශ්වීය කලා කෘතියකි. 'චේ' ඔහුගේම පරම්පරාවට අයිති වස්තුවක් නොවේ. අනාගත පරම්පරාවටද අයිති වස්තුවකි. ඔහු පෞද්ගලික වෙළඳ භාණ්ඩයක් නොව පොදු මානුෂීය වස්තුවකි. එහෙත් කණගාටුවට කරුණ නම් ධනවාදය විසින් ඇතැම් තැනක ඔහු විකුණා කෑමේ වෙළඳ භාණ්ඩයක් කරගෙන සිටීමයි. ත්‍රීවිල් පසුපස ස්ටිකරයේ සිට අතේ කොටා ගන්නා පච්චය දක්වා අද 'චේ' විලාසිතාවකි. සැබැවින්ම ලෝකය වඩාත් සුන්දර වනු ඇත්තේ ඔහු කවුරුන්ද යන්න අතේ පච්චය කොටාගෙන සිටින මිනිසාද හඳුනාගත් දිනයේදීය.

'චේ'යනු වෙළඳ නිර්මිතයක් නොව සැබෑ මිනිස් නිර්මිතයක් බව තහවුරු කිරීමේ සටනක නියැලී සිටින ජනතා විමුක්ති පෙරමුණේ සමාජවාදී තරුණ සංගමය වාර්ෂිකව ඔක්තෝබර් 08 දින චේ වෙනුවෙන් සමරු උත්සවයක් සංවිධානය කරයි. 'චේ'ගේ දේශපාලන අධ්‍යාත්මය රැක ගැනීම ඔහු මරා දැමූ දිනටද වඩා අද දින අසීරු වී ඇත. ඒ වෙනුවෙන් කරන අරගලය 'චේ'ට සාධාරණය ඉටු කරන අරගලයක් පමණක් නොව මුළු මිනිස් වර්ගයාගේම හිතසුව පිණිස කෙරෙන අරගලයකි.

එසේම එම අරගලය යනු 'චේ' නැවත නැවතත් මරා දැමීමට එරෙහිව කරන අරගලයද වේ.

# රනිල්ගේ ටයර්වලින් දුවන මහින්ද

බැලූ බැල්මට මෛත්‍රී - රනිල් ආණ්ඩුවත් මහින්ද නඩයත් අතර මතුපිටින් මහා ගැටුමක්, ප්‍රතිවිරෝධයක් ඇතැයි සමහරුන්ට පෙනිය හැක. මේ ආණ්ඩුවට එරෙහි ජනතාවගේ එකම ගැලවුම්කරුවන් මහින්ද ප්‍රමුඛ නඩය බව පෙන්වීමට රට පුරා රැස්වීම් තියමින්, පන්සල් ගානේ බඩගාමින් මහින්දලා විශාල ගෝරනාඩු දමමින් සිටී.

මහින්දගේ නිල රථයක ටයර් ගෙවී ඇති බවත් ඒ ගැන මහින්ද රනිල්ට කෙලින්ම කතා කර ඇති බවත් ඉන් පසු රනිල් මැදිහත්වී, මහින්දට වහාම ටයර් හතරක් ලබාදී ඇති බවත් පසුගියදා පුවත්පත්වල වාර්තාවී තිබුණි. නියමිත පටිපාටිවලට පිටින් කෙරුණු මේ ගනුදෙනු ගජ මිතුරන් දෙදෙනෙකු අතර සිදුවූ පෞද්ගලික ගනුදෙනුවක ස්වරූපයක් උසුලයි. ඇත්තටම ගෙවීගෙන යන මහින්දලාගේ ටයර් අලුත් කිරීමට රනිල් මැදිහත්වීම අහම්බෙන් සිදුවන දෙයක් නොවේ. තම බලය සහ පැවැත්ම වෙනුවෙන් යම් මට්ටමක බලයක් සහිතව මහින්දලා දේශපාලනය කිරීම රනිල්ලාට වෙස්වළාගත් ආශිර්වාදයකි.

මෙවැනි සපෝට් රනිල් මහින්දට දුන්නේ එකක් දෙකක් නොවේ. පෙරළා මහින්ද රනිල්ලාට කෘතගුණ සැලකුවේ වාරයක් දෙවාරයක් නොවේ.

බලයේ සිටින විට වරක් මහින්ද රනිල්ට සිරිකොත ඉදිරිපිට පාර කාපට් කර දුන්නේය. ඊට කෘතගුණ ලෙස රවීට එරෙහි විශ්වාස



භංගයේදී එය ගෙනා මහින්දලාම පාර්ලිමේන්තුවට ආවේ නැත. අතුරුදහන් වූවන්ගේ කොමිසම ගෙනෙන විට එය මඟ හැරියේය. පැය කිහිපයකින් විමල්ට රට යෑම සඳහා නීති විරෝධී ලෙස පාස්පෝට් එක හදා දුන්නේය. එය රනිල් ප්‍රසිද්ධියේම පැවසුවේය. මහින්දලා රනිල්ලාට එකතුවී මේ රවටන්නේ රටේ ජනයාවය. ප්‍රසිද්ධියේම එය කරන තරමට ඔවුන්ට ධෛර්යක් ලැබී ඇත්තේ මෙරටේ ජනයා 'රවටනු ලැබීමට' එතරම් කැමති නිසාදැයි අපි නොදනිමු. මහින්දලාට අලුත් ටයර් දෙන විට රටේ ජනයා යන්නේ 'රිම්' එකෙන්ය. රිම් එකෙන් යන ජනයා 'රැවටීම' ජීවන විලාසිතාවක් කරගත් විට රටට වන දේ අමුතුවෙන් කිවයුතු නැත.

# පොලිටිකල් පංතිය

"ඔන්න ඕවට තමයි ළමයිනේ පලිගන්නව කියන්නෙ." පොලිටික්ක දවසක් නඩුවක් කියාගෙනම පංතියට ගොඩවැදුණා.

"සර් එනව දැක්කෙම නෑ." වසන්තිය හුරතල් වුණේ 'ගුඩ් මෝනිං' කියාගන්න බැරිවුණු එක කැපෙන්න.

"මොකාද සර් පලිගන්නෙ... හැපින්නද?" අනුරුද්දියත් මොනව හරි කියන්න ඕනෙ නිසා කිවුව මිසක් අගක් මුලක් දැනගෙන හිටියෙ නෑ.

"හැපින්න... හැපින්න හොඳයි. මුං එක්ක බැලුවාම" පොලිටික්කට මලම පැනල. "අනිවාරතේ පැන පැන එලෝනවා."

"එහෙනම් සර්, එකත් එකටම පොළඟ." කනියා අනුරුද්දියගේ කණාවැළ ඇල්ලන්න ගිහින් ඇන්න.

"බම්බුව..." කිවුවා නෙමෙයි පොලිටික්කගෙ කටින් පැන්න. "මේ කියන්නෙ සර්පයො ගැන නෙමෙයි... උන්ට වඩා විෂ මිනිස්සු වගයක් ගැන"

"කවුද සර් පස්සෙන් එළවන්නෙ... අපිට කියන්න" මංජුව අත කොටවෙන්න නමාගෙන නැගිට්ට.

"නෑ... නෑ ළමයිනෙ මගෙ පස්සෙන් එලවන්නෙ නෑ. ඒව කොහෙද මාත් එක්ක..." පොලිටික්ක පපුව ඉස්සරහට දැම්ම. "එත් බලන්නකො මේ රට වෙනුවෙන් කැපවුණු මිනිස්සුන්ට ඉන්න දෙන්නෙ නෑනෙ. බොරු චෝදනා පටලනව. හැමදාම කටඋත්තර දෙන්න කැඳෝනව. රිමාන්ඩ් කරනව."

"පොඩ්ඩක් ඉන්න සර්... කවුද රට වෙනුවෙන් කැප වුණේ?" මංජුව හරහට හිටිය. "සමහරුන්ට රටයි බඩයි ටැපලෙනවා" මංජුව දෙවෙනි කෑල්ල කිවුවෙ හිමීට හින්ද පොලිටික්කට මීටර් වුණේ නෑ.

"ඇයි රට බේරගන්න කැපවුණු දේශප්‍රේමියො දැන් හිරේට දක්කන්නනෙ හදන්නෙ. හදවත වාවන්නෙ නෑ" පොලිටික්ක හදවත අතට ගන්න පුළුවන්නම් ගන්නව. "නාමල් බේබි, යෝ බබා, එයාලගෙ ආච්චි ඩේසි, මහින්දානන්ද ළමයා, කෙහෙලිය ළමයා, විමල් ළමයා, ජයන්ත ළමයා, චානුක බබා... තව හමුදාවෙ බුද්ධි..." පොලිටික්ක හෑල්ලක් කියාගෙන යන්න පටන් ගත්ත.

"එයාලා දේශප්‍රේමී වුණේ යුද්දෙ යන කාලෙයි ඊට පස්සෙයි කරපු වැඩ නිසානේද සර්" සමන ඇහුවෙ හිමිහිට.

"ඔව් සමන්. ඒ මිනිස්සුන්ගෙ වැඩ හින්ද තමයි... රට මේ තත්වෙ තියෙන්නෙ..." පොලිටික්ක කියන්න හැදුවා.

"අයියෝ සර්... කියන්න දෙයක් නෑ. රට මේ තත්වෙට වැටුණෙ ඒ මිනිස්සුන්ගෙ වැඩ හින්ද තමයි. රටේ වැඩි දෙනෙක් දැනගත්ත පහුගිය ජනාධිපතිවරණෙ වෙනකොට." සමන පිහියෙන් ඇන්න වගේ කියල දැම්ම.

"නෑ නේද සමන්. මේවා බොරු චෝදනා නේද?" පොලිටික්ක තවත් හෝදන්න හදනව.

"චෝදනාද බොරු? දේශප්‍රේමීකමද බොරු? හොරකම් වහගන්න... මහජන දේපළ කොල්ලකන එක වහගන්න... මිනීමරුම් වහගන්න නේද ලාබෙට දේශප්‍රේමී වුණේ. ගෙදර වාහනේ ජනාධිපති ලේකම් කාර්යාලෙට කුලියට දීලා ඒ කුලියත් අරගෙන, ඒ වාහනේ පාවිච්චි කරන්න අරගෙන ඒකට ජනාධිපති කාර්යාලෙනුත් ඉන්ධන දීමනාත් අරගෙන, තව රාජ්‍ය ආයතනවලිනුත් දීමනා අරගෙන හම්බ කරපු මෙයාලා බබාලා, ළමයි නෙමෙයි රජවැඩකාරයො...

හොරු සමඟ හෙළුවෙන් හිටපු අය අදත් ලැජ්ජ නැතුව දේශප්‍රේමී පාංකඩ හොයනව හෙළුව වහගන්න. තමන්ගෙ හොරකම්වලට නීතිය ක්‍රියාත්මක වෙනව වගේ පේනකොට පාංකඩ අස්සෙ හැංගිලා විලාප ගහනව, 'මෙන්න පලිගන්නවෝ' කියල. අනේ හසරක් දන්නෙ නැති අහිංසකයොත් හිතනව 'ඇත්ත තමයි මේ මිනිස්සු දේශප්‍රේමීකම ගැන කියවන හින්ද පලිගන්නවද' කියලා. ඇත්ත බැලුවාම කට්ටිය දේශප්‍රේමී බංකර්වලට වෙලා ගාණට වැඩේ දීලා. ඇත්ත එළිවෙනකොට දැන්නම් නෝන්ඩි. දන්න කෙනෙක් ආයි කතා කරන්නෙ නෑ." සමනගෙ කතාව ඉවරවෙන්නෙ නැතිවෙයි කියල පොලිටික්ක කළු ලෑල්ල පැත්තට හැරිල මොනවද ලියන්න ගත්ත. කවුරු හරි කිවුව ඒ මලක නමක් කියල.

## ටෙලි නාට්‍ය...

13 පිටුවෙන්



ඔවුන්ගේ භාවමය ප්‍රකාශන මඟින් අපට සංවේදනා දනවන්න ඕනෑ. දුක, වේදනාව, සතුට, ප්‍රේමය ඒ සියල්ල අපට දනවන්න ඕනෑ. නමුත් දැන් මේ මිල ප්‍රශ්නය නිසා මොකද වෙලා තිබෙන්නේ කියලා ඇමතිතුමා දන්නවා ඇති. උදේ හතරට මේ නළු නිළියන් ගන්නවා. උදේ හතරට ගත්තාම දවසක වැඩ කරලා ඉවර වෙන කොට පාන්දර 2.00යි, 3.00යි. ඔවුන්ට විවේකයක් නැහැ. ඉන්න තැනක් නැහැ. ඉස්සර නම් ඔවුන්ට යම් විවේකයක් සහිතව ඉන්න හිටින්න තැන් දීලා තමයි මේ රූගත කිරීම් කළේ. හැබැයි, අද මේ අය දෛනික කුලිකාරයෝ බවට පත් කරගෙන පාන්දර 4.00 සිට රෑ 2.00 දක්වා ඔවුනගේ වැඩ දවස බවට පත් කර ගෙන තිබෙනවා. ඒ කාලයේ සාමාන්‍ය ප්‍රශස්ත මට්ටමේ ගෙවීමක් ඔවුන්ට තිබුණා. ඒ කාලයේ මුළු නාට්‍යයටම තමයි කලාකරුවෝ කොන්ත්‍රාත් අත්සන් කළේ. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? අද අත්සන් කරන්නේ එක්කෝ සතියකට, එහෙම නැත්නම් දවසකට. දැන් ඒක තවත් අඩු වෙලා පැයේ කොන්ත්‍රාත්කරුවන් බවට කලාකරුවන් පත් වෙලා තිබෙනවා. ඒකයි අපි කිව්වේ දැන් මේ කලාකරුවන් "කුලීකරුවන්" බවට පත් වෙලා තිබෙනවා කියලා. කලින් ටෙලි නාට්‍යයක් නිර්මාණය කරන කොට අධ්‍යක්ෂවරයෙක් හිටියා. ඔහු ස්ථිරයි. හැබැයි, දැන් මේ ප්‍රචාරය වන වැල් මෙගා ටෙලි නාට්‍යවල අධ්‍යක්ෂකවරයෙක් ඉන්නේ සතියයි. දෙකයි. ඔහු දන්නේ නැහැ. ඊළඟට මොකද වෙන්නේ කියලා. අධ්‍යක්ෂකවරු සති දෙකෙන් දෙකට මාරුවෙමින් තමයි පිටපත ලියැවෙන්නේ.

ටෙලි නාට්‍ය මිලදී ගන්නා මිල පමණක් අඩු වෙලා තිබෙනවා. නිෂ්පාදන වියදම වැඩි වෙලා. ටෙලි නාට්‍ය episode එකක් ගන්න මිල අඩු වෙලා. ඒ නිසා මොකද වෙන්නේ? ඒ නිසා දැන් සියලුම අධ්‍යක්ෂවරු හා නිෂ්පාදකවරුන් පෙළැඹිලා සිටින්නේ ටෙලි නාට්‍යයක් නිර්මාණය කරනවා වෙනුවට " ටෙලි කොත්තු" හදන්නයි. දැන් ටෙලි නාට්‍ය "හදනවා." ටෙලි "ගහනවා." ටෙලි කොත්තු හදනවා. විශාල ප්‍රේක්ෂක සනුහරයක් සාලයට ගෙනැල්ලා ඇහේ වද්දන ටෙලි නාට්‍යවල ගුණාත්මකභාවය අඩු වෙන්න ඒ කාරණා තමයි බලපා තිබෙන්නේ.

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. අද මේ ටෙලි නාට්‍යවල මිල තීරණය කරන්නේ වෙන කවුරුවත් නොවෙයි. මේ ටෙලි නාට්‍ය මිලදී ගන්නා රූපවාහිනී නාලිකායි. නමුත් මීට කලින් තිබුණු ක්‍රමය මොකක්ද? කලින් තිබුණු ක්‍රමය අනුව ඒ ගුවන් කාලය යම් තනි අනුග්‍රාහකයෙක් ගත්තා. ඒ කාලය තුළ ටෙලි නාට්‍ය විකාශනය කළා. නමුත් අද රූපවාහිනී නාලිකා ටෙලි නාට්‍ය මිලදී ගන්නවා. මිලදී අරගෙන ඔවුන් ඒ සඳහා දැන්වීම් හොයනවා. ඔවුන් කොච්චර දැන්වීම් හොයනවාද?

**දැන්වීම් අතරට ටෙලි නාට්‍ය කෑල්ලක්**

අපි මේ කාරණය මීට කලිනුත් සාකච්ඡා කළා. ටෙලි නාට්‍යයක් දැන් පෙන්වන්නේ පැය භාගයෙන් කොච්චර කාලයක්ද? අපට නාට්‍ය බලන්න පුළුවන් පැය භාගයෙන් විනාඩි 16යි නැත්නම් 17යි. විනාඩි 17ක් බැලුවත් හොඳයි වාගේ තමයි අපට හිතෙන්නේ. ඒ නිසා ජනතාව දැන් කියන්න පුරුදුවෙලා සිටිනවා, "ටෙලි නාට්‍යයක් අතර දැන්වීම් බැලුවා නොවෙයි, දැන්වීම් අතර ටෙලි නාට්‍යය කෑලි කීපයක් බැලුවා"ය කියන්න. විනාඩි 15කට, විනාඩි 16කට අද නාට්‍ය සීමාවෙලා තිබෙනවා. ටෙලි නාට්‍යයක් විකාශනය කරනකොට රූපවාහිනි තිරයේ යටින් දැන්වීම් දමන බව ඔබතුමාත් දන්නවා. මුලදී ඒ දැන්වීම් දම්මේ රූපවාහිනී තිරයේ යටින් විතරයි. දැන් රූපවාහිනී තිරයේ දෙපැත්තෙනුත් දැන්වීම් දමනවා. ආපසු තිරයේ උඩිනුත් දැන්වීම් දානවා. අපි අඟල් 24 රූපවාහිනියක් මිලදී ගත්තාට, අපට ටෙලි නාට්‍යය බලන්න වෙන්නේ රූපවාහිනියේ පොඩි කෑල්ලක. මේ ගැන හිතන්න. පසුතල නිර්මාණයට රුපියල් ලක්ෂ ගණන් වියදම් කරලා, හොඳින් රූප රචනය කරලා, අධ්‍යක්ෂකවරයා රංගන ශිල්පීන් මෙහෙයවාගෙන අපට හොඳ රූපයක් පෙන්වන්න උත්සාහ කරනවා. හැබැයි, ටෙලි නාට්‍ය පෙන්වන කොට රූපවාහිනියේ තිරය මැද්දෙනුත් advertisement එකක් දමනවා. තිරයේ මැද්දෙනුත් කකුළුවෙක් හරි, මකුළුවෙක් හරි, පණුවෙක් හරි මොකෙක් හරි එනවා. ඒකත් advertisement එකක්. ටෙලි නාට්‍යය පෙන්වන කාලයත් අඩු කරලා. ටෙලි නාට්‍යය පෙන්වන තිරයේ ප්‍රමාණයත් අඩු කළාට පස්සේ ටෙලි නාට්‍යයට කල දසාවක් යයිද?

**ටෙලි නාට්‍යවල ගුණාත්මක තත්ත්වය වර්ධනය කරන්න, ජනතාවට උසස් රස වින්දනයක් ලබා දෙන්න යම් ව්‍යවස්ථාපිත ආයතනයක් ඇති කළ යුතුයි. ඒ ආයතනය මගින් ටෙලි නාට්‍ය සහ ටෙලි නිෂ්පාදන වර්ගීකරණයක් කළ යුතුයි. ඒ වර්ගීකරණය අනුව අවම මිලක් තීරණය කළ යුතුයි. ඒ අවම මිල තීරණය කළාට පස්සේ නාලිකාවලට පුළුවන් තමන්ට කැමැති විධියට ඒ ටෙලි නාට්‍ය මිලදී ගන්න. ඒ විතරක් නොවෙයි, ටෙලි නාට්‍යයක් විකාශනය කරන්න තිබෙන කාලය පිළිබඳව ඒ මණ්ඩලයට තීන්දු කරන්න පුළුවන්. එවැනි මණ්ඩලයක් නිර්මාණය කර ගැනීමකින් තොරව අපට මෙතැනින් එහාට යන්න බැහැ.**

## හවුල් ආණ්ඩුවේ...

05 පිටුවෙන්



දෙනා එක්ව එකට ආණ්ඩු කරමින් වෙන වෙනම සමුළු පවත්වා මේ කරන්නේ තමන් ප්‍රශ්න කරන තමන් අතහැර යන සාමාජිකයාට හීන පෙන්වා ටික දිනකට හෝ තමන් වටා තබා ගැනීම මිස අන් කිසිවක් නොවේ.

කෙසේ වෙතත් මේ සියල්ල විසින් ආණ්ඩුවේ පැවැත්ම දුබල කරමින් අරාජික කරමින් තිබෙන අතර වත්මන් ආණ්ඩුවට එරෙහි නව විකල්ප බලයක් සඳහා වූ විෂය මූලික වටපිටාව හා දේශපාලන අවස්ථාව තව තවත් පුළුල් කරමින් තිබේ. එම අවස්ථාව අත්පත් කර ගැනීමට එ.ජා.ප.යට හෝ ශ්‍රීල.නි.ප.යට හෝ වෙනත් කුඩා කණ්ඩායමකට හැකියාවක් නැත. ඒ සඳහා ඉඩ තිබෙන්නේ, වම මූලික කරගත් ප්‍රගතිශීලීන්ගේ බලවේගයකටය. මෙම හවුල් ආණ්ඩුව ශ්‍රීල.නි.ප.යටත් එ.ජා.ප.යටත් තනි බලයක් ලබාගැනීමට නොහැකි වූ දුබලකම නිසා බිහිවූ දුබලකම් දෙකක එකතුවක් බව මුලදීත් සඳහන් කළෙමු. "මෝඩකම් දෙකක් එක් නුවණක්කාර කමක් වන්නේ නැතැයි" කියමනක් තිබේ. ඒ අනුව දුබලකම් දෙකක් ඒක්වූ විට එක් ප්‍රබලකමක් ඇති වන්නේද නැත. සිදුවන්නේ දුබලකම දෙගුණ වීමය. එබැවින් වත්මන් හවුල් පාලනය දුබල එකක් වීම වැළැක්විය නොහැකි අතර එය බිඳ වැටෙද්දී එයට දායක වූවන්ද පරාජය වී නව විකල්ප බලයකට මග විවර කරන බව ඉතා පැහැදිලිය.

## ධීවරයින් වෙනුවෙන්...

03 පිටුවෙන්



සියලුම දේශපාලන පක්ෂ සහ කණ්ඩායම් නියෝජනය වෙනවා. අපි මේ කාරණය පිළිබඳව දකින්නේ මේ ආකාරයටයි. එකක් තමයි මේ හැදෙන්න යන ව්‍යවස්ථාවක්. ඒ ගැන විවාදයක් නැහැ. එහි ජනතා අපේක්ෂාවන් ඉටුකර ගැනීම සඳහා අපි වෙහෙසෙමින් සිටිනවා. නමුත් මේ තත්වය තුළම අපි දකින්නට කරුණු දෙකක් තියෙනවා. එකක් තමයි දැන් ක්‍රියාත්මක 1978 ව්‍යවස්ථාව ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පවා අකුළවපු, 19 වතාවක් සංශෝධය වුණු ව්‍යවස්ථාවක්. ඒ ව්‍යවස්ථාව විසින් ධනපති පංතියේ පත්වන කණ්ඩායමට ලබාදෙන අසීමිත බලය විසින් අපේ රටේ සුවිශේෂ දේශපාලන අර්බුද රාශියක් ඇති කළා. ඒ නිසා මේ මේ ව්‍යවස්ථාව වෙනස් විය යුතුයි කියන තැන ජ.වි.පෙ. ඉන්නවා. 1978 මෙය සම්මත කරපු අවස්ථාවේ සිට අපි විරුද්ධව සිටියා. ඒ නිසා ජ.වි.පෙ. විදිහට මේ ව්‍යවස්ථාව වෙනස් කර නව ව්‍යවස්ථාවක් හැදිය යුතුයි කියන ස්ථාවරයේ ඉන්නවා.

විශේෂයෙන් මේ මොහොතේ ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය ගත්තොත් මේ ව්‍යවස්ථාව වෙනස් කර ජනතාවගේ අයිතිවාසිකම් රැකෙන, ඒකාධිපති බලතල නැති ආණ්ඩු ක්‍රමයක් හදන්න සුවිශාල ජනවරමක් ලැබී තිබෙනවා. ඒ වගේම මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න, ජාතික ප්‍රශ්නය විසඳීමට යම් උත්සාහයක් මෙයින් ගත යුතුව තිබෙනවා. මේ රටේ ව්‍යවස්ථාව හදපු හැම අවස්ථාවෙම, 1970, 1978 කියන මේ දෙකේදිම ඒවා හැදුවේ 2/3ක් තිබුණු ආණ්ඩු පක්ෂය විසින්. 1970දී සිරිමාවෝට 2/3ක බලයක් තිබුණා. 1978දී ජේ.ආර්.ට 5/6ක බලයක් තිබුණා. ඒ නිසා ඒ අවස්ථා දෙකේදිම ධනපති පංතියේ බලය ගත්තු කණ්ඩායම සුවිශාල බලයක් සහිතව අන් අය නොවිමසා ව්‍යවස්ථාව හැදුවා. ඒ නිසාම ඒකාධිපති ලක්ෂණ සහිතව, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයත් උල්ලංඝනය කරමින්, ජනතාවට ඇහුම්කන් නොදී ව්‍යවස්ථාවක් හදන්න පුළුවන් වුණා. නමුත් මෙවර ගත්තොත් ඡන්දය දුන් විදිය අනුව කටවත් බහුතර බලයක් නැහැ. පක්ෂ ගත්තොත් 2/3ක් තියා එක පක්ෂයවකටවත් බහුතර බලය වත් නැහැ. ඒ නිසා රටේ ජනතාවගේ හා පාර්ලිමේන්තුව ඇතුළෙ සියලු දේශපාලන පක්ෂවල අදහස්වලට ඉඩදීමෙන් තමා ව්‍යවස්තාව හදන්න වෙලා තියෙන්නේ. දේශපාලන අර්බුදයක් මේ රටේ ජනතාව විසින් හදලා දීලා තියෙනවා. ඒ අර්බුදය මේ ව්‍යවස්ථා සම්පාදනයේදී ධනාත්මකව තමයි යෙදවෙන්නේ. ඒ නිසා මේ එක පක්ෂයකටවත් අධික බලයක් නොමැතිවීමේ වාසිය ජ.වි.පෙ. අපි දකිනවා. හැදෙන අලුත් ව්‍යවස්ථාවක් තුළට යම් ජනතා අයිතිවාසිකම් ප්‍රමාණයක්, ප්‍රගතිශීලී නීති ප්‍රමාණයක් එකතු කර ගන්න ජ.වි.පෙ. අපි මැදිහත් වෙමින් ඉන්නවා. රටේ ප්‍රශ්න සියල්ල විසඳෙනවා යැයි ව්‍යවස්ථාව කරේ තියාගෙන යන්න අපි සූදානම් නැහැ.

විධායක බලතල අහෝසි කරන ජනතා බලය ශක්තිමත් කරන, සාධාරණ මැතිවරණ ක්‍රමයක් සකස් කර ගත හැකි ව්‍යවස්ථාවක් වෙනුවෙන් අපි මැදිහත් වෙනවා. කොහොම වුණත් මේ සම්බන්ධයෙන් අදහසක් ඇති කර ගත හැක්කේ අවසන් ලියවිල්ලක් සකස්වූවාට පසුවයි.

***නියමුවා:- අධිකරණ නියෝග මත පසුපසට ගැනීමට සිදුවූ වැට් බදු පනත නැවතත් ගෙන ඒමට ආණ්ඩුව ක්‍රියාකාරීම තුළින් ආණ්ඩුව ජනතාව මත බදු පැටවීම කෙරෙහි තබා ඇති විශ්වාසය පැහැදිලියි. මේ තත්වය තුළ එළඹෙන අයවැය පිළිබඳ ඔබේ පුරෝකථනය කවරාකාරද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** ආණ්ඩුව දැනට කැබිනට් මණ්ඩලය විසින් නැවතත් වැට් බදු පනතක් සම්මත කර තිබෙනවා. එය සම්මත කර ගැනීමට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු වෙනවා. දැනට තිබෙන තොරතුරු අනුව කැබිනට් මණ්ඩලය නැවත සම්මතකර තිබෙන්නේ 15% දක්වා වැට් බදු ඉහළ දැමූ, ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙච්ච ඒ කරුණුම තමයි. ආණ්ඩුවට බදු පිට බදු පනවන්න සිද්ධවෙලා තිබෙන්නේ එක් පැත්තකින් ආණ්ඩුවේ ආර්ථික අර්බුදය නිසා. අනිත් එක ආණ්ඩුව ජනතාවගෙ බොටුව මිරිකලා පාලනය ගෙනියන්න කිසිම පැකිලීමකින් තොරව ලෑස්ති නිසා. මොකද දැන් ආණ්ඩු ජනතාවට බදු ගහනවා. ඒත් මේ ආණ්ඩු ජනතා බදු මුදල් සුවිශාල වශයෙන් තනි තනි ධනපතීන් අතට ලබාදීමේ අවස්ථා ගණනාවක් තිබෙනවා. දැන් උදාහරණයක් ලෙස ගත්තොත් මෑතකදී හෙළිදරව් වූ කරුණක් තමයි දුම් බද්ද. 2015 වර්ෂයේ දුම් බදුවලින් එකතු වූ ප්‍රමාණය රුපියල් මිලියන 2,237ක්. නමුත් මේ දුම් බදු මුදලෙන් ඇත්තටම රජයට බදු වශයෙන් ලැබෙන්නේ 10%යි. ඒ කියන්නේ රුපියල් මිලියන 223 යි. ඉතිරි මිලියන 2000ම ගන්නේ එක ව්‍යාපාරිකයෙක්. ආණ්ඩුවට සැබෑ ලෙසම බදු අවශ්‍ය නම් කළ යුතුව තිබෙන්නේ මේ දුම් පරික්ෂාව ලංගම ඩිපෝවලට පැවරීමයි. ඒ පරීක්ෂණය සරල දෙයක්. ආදායමෙන් 90%ක් සමාගමකට දීලා එකතු කළ යුතු දෙයක් නෙවෙයි.

ඒ වගේම ආණ්ඩුව සමාගම්වලින් 20%ක බදු අයකරමින් තිබුණා මේ අයවැයට කලින්. දැන් ඔවුන් එය 17%ට අඩු කරලා. සමාගම්වල බදු සම්පූර්ණම වාගේ කපාහැරලා තිබෙන්නේ. ඒක නිසා මේක ධනපතීන්ට, තමන්ගෙ යාළු මිත්‍රයන් වෙච්ච ධනපති කණ්ඩායම්වලට විශාල වශයෙන් බදු සහන ලබාදෙමින් පොදු ජනතාව මත වක්‍ර බදු පටවමින් ජනතාව පීඩාවට පත්කරන ආණ්ඩුවක්. අපි පැහැදිලිවම පක්ෂයක් වශයෙන් තීරණය කරලා තිබෙනවා නැවත වතාවක් ආණ්ඩුව වැට් බද්ද මේ ආකාරයෙන් පාර්ලිමේන්තුවට ගෙනාවොත්, පාර්ලිමේන්තුව තුළ පමණක් නොව පාර්ලිමේන්තුවෙන් පිටත් සටන් ක්‍රියාමාර්ගවලට යන්න.

***නියමුවා:- ප්‍රධාන පක්ෂ තමන්ගේ සමුළු කැඳවමින් සාමාජිකයින් බඳවාගැනීමේ ව්‍යාපෘති දියත්කරමින් නැවත වටයකින් ජනතාව රැවටීමට සූදානම් වෙමින් සිටින්නේ රට පුරා ජනතා ගැටලු කඳු ගැසෙමින් තිබියෙදීයි. පීඩාවට පත් ජනතාවගේ විකල්ප තෝරාගැනීම බවට පත්වීමට ජ.වි.පෙ. සූදානම කවරේද?***

***බිමල් රත්නායක සහෝදරයා:-*** ඔව්, ඇත්තටම එක්සත් ජාතික පක්ෂය තමන්ගේ සංවත්සරය පැවැත්වූවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රී පිලත් සමුළුව පැවැත්තුවා. නමුත් අපි මේක සම්බන්ධව කිසිසේත්ම විශේෂ දේශපාලන ගුණාත්මක තත්වයක් ඇතිවුණායැයි විශ්වාස කරන්නේ නැහැ. ඔවුන් දෙගොල්ලම රාජ්‍ය බලය පාවිච්චි කර තමන්ගෙ' පක්ෂය වටා සෙනග ගෙන්වා ගැනීමට කරපු උත්සාහයක් තිබුණා. නමුත් අපි දැකපු දේ තමයි විශාල රාජ්‍ය බලයක් යොදා තම ප්‍රචාරක කටයුතු විශාල වශයෙන් කරනවා. මම දැක්ක සමහර මැතිවරණ නිරීක්ෂණ වාර්තාවල තියෙනවා සාමාන්‍යයෙන් මැතිවරණයකට කරනු ලබන රූපවාහිනී ප්‍රචාරක වියදමට කිට්ටු වියදමක් සමහර ඔය සමුළුවලට වියදම් කර තියෙනවා. එහෙම කළත් ඔය සමුළු දෙකේම බලගතු ජනතා විශ්වාසයක් හැදෙන සෙනඟ සහභාගිත්වයක් තිබුණේ නැහැ.

ඒ සමුළුවලින් පස්සෙත් අපට පෙනෙන දේ තමයි ගම්මට්ටමින්, බිම්මට්ටමින් එ.ජා.ප.යට හෝ ශ්‍රීල.නි.ප.යට ඒ සම්බන්ධයෙන් ප්‍රබෝධයක් ඇතිවෙලා නැහැ. ඒ නිසා ජ.වි.පෙ. පැත්තෙන් ගත්තොත් වර්තමානයේ ඉතාම හොඳ සාධනීය දේශපාලන වටපිටාවක් ගොඩනැගෙමින් තිබෙනවා. ඒ නිසා පක්ෂය පාර්ශ්ව ගණනාවකින් අපේ සංවිධාන ශක්තිමත් කරමින් යනවා. විශේෂයෙන් ගත්තොත් මාස 6කදී දිරිය පුරවැසි සමිති ගොඩනැගීමේ කටයුත්ත ඉතා සාර්ථකව, මේ වනවිට දහස ඉක්මවලා ගොඩනගා තියෙනවා. ඒ වගේම අපේ වෘත්තිය සමිති පෙරමුණත්, ගොවි සමිති පෙරමුණත් පුළුල් වශයෙන් ගොඩනගමින් යනවා. ඒ නිසා පක්ෂයක් වශයෙන් සැලසුම් කරල තිබෙන්නේ, පොදු ජන බලවේගවලින් සමන්විත එ.ජා.ප. ශ්‍රීල.නි.ප. කියන පක්ෂ දෙක හැර පොදු ජනතාවගේ බලවේගවලින් සමන්විත නව ජනතා මධ්‍යස්ථානයක් ගොඩනග න්න. දැනට මාස 3 කට ආසන්න කාලයක තිස්සේ සිට නායක මට්ටමින්ම අපි ඒ සඳහා වූ වැඩ කටයුතු දැනටම ආරම්භ කර තියෙනවා.

රාජ්‍ය බලය පෙන්නල, බත් පැකට් එකයි අරක්කු බෝතලෙයි රු.1000යි දීල පොදු ජනතා මිනිස්සු ගෙනැල්ලා කරන සමුළුවලින් පොදු ජනතා මනසේ වෙනස්වීමක් අපි දකින්නේ නැහැ ඒ නිසා පක්ෂයක් විදියට නව අත්හදා බැලීම් කරමින් විශාල කැපකිරීමෙන් අපි පක්ෂය ශක්තිමත් කරන්න, විශේෂයෙන්ම අධිරාජ්‍යවිරෝධී ධනේශ්වරවිරෝධී තමන්ගේ වෙනස්කම් එලෙස තබාගන්නා අතර ජනතා විමුක්ති පෙරමුණත් සමග එකට වැඩකරන්න සූදානම් සමාජ කණ්ඩායම්, පුද්ගලයන්, නායකයන් සමගත් අපි පුළුල් වශයෙන් වැඩ කිරීම ආරම්භ කර තියෙනවා. කවුරු සමුළු කැඳවුවත් ජ.වි.පෙ. මැදිහත්වී ගොඩනගන පොදුජන මධ්‍යස්ථානය 2020දී රටේ අනාගතය තීරණය කරන ප්‍රධාන දේශපාලන බලවේගය බවට පත්වෙන බව අපිට විශ්වාසයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com


සමාජවාදී තරුණ සංගමය පෘතුගාලයේ තරුණ උළෙලට..



තරුණ කඳවුරක සහෝදරත්වය...



කියුබන් තානාපති හා SYU අතර සාකච්ඡා...



'වමේ පුස්තකාලය' වෙබ්අඩවිය විවෘත කරමින්...



උතුරේ ජනතාවට සවන් දෙමින්...



ජ.වි.පෙ. පවුල් සුහදහමුව - තිස්සමහාරාමය



## ජනතාවට බදු ගහන ආණ්ඩුවේ ආර්ථික ගමන පරාජය කළ යුතුයි

ජ.වි.පෙ. ප්‍රධාන ලේකම්
**ටිල්වින් සිල්වා සහෝදරයා**

ජනතාවට බදුබර පටවන, හොරුන්ට ඉණිමං තනන හා රාජ්‍ය ආයතන දියකරන ආර්ථික වැඩපිළිවෙළක් ආණ්ඩුව විසින් ආරම්භ කර ඇති බවට චෝදනා කළ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මෙම ක්‍රියාමාර්ගවලට එරෙහි සියලු දෙනා ඒකරාශී කර ගෙන දැවැන්ත උද්ඝෝෂණ ක්‍රියාවලියක් ආරම්භ කිරීමට ජ.වි.පෙ. සූදානම් බව අවධාරණය කර සිටියේය.

ඔහු මෙම අදහස් පළ කළේ ආණ්ඩුවේ වැට් බදු යෝජනාව පිළිබඳව කරුණු දැක්වීම සඳහා පසුගිය 27වැනි දින ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද ප්‍රකාශ කළේය.

"ආණ්ඩුවේ මෙම බදු ගැසීම කිසිදු සාධාරණත්වයක් නැහැ. එනිසා මෙම අසාධාරණ වැට් බද්ද පරාජයට පත් කරන්න ජනතා විමුක්ති පෙරමුණ උපරිම විදිහට මැදිහත් වෙනවා. ආණ්ඩුව ආර්ථිකය සංවර්ධනය කරලා නිෂ්පාදනය වැඩිකරලා ආදායම් ලබා ගන්නවා වෙනුවට ආණ්ඩුව සිදුකරමින් ඉන්නේ හැඬු කඳුලින් ඉන්න රෝගීන්ගෙන් පවා බදු අය කරගන්න එකයි. එම නිසා ආණ්ඩුවේ මෙම ක්‍රියාමාර්ග පරාජයට පත්කළ යුතුයි.

ආණ්ඩුවේ කතාව යහපාලනය වුණාට ක්‍රියාව සිදු වෙන්නේ හොරුන්ට ඉනිමං තැනීමටයි. මේ ආණ්ඩුව ආර්ථික වශයෙන් බටහිරට ඕන විධියට වැඩ කරමින් ජනතාවට බදු පටවමින් හොරුන්ට රිංගන්න හිල් හදලා දෙනවා. ආණ්ඩුවේ මෙම ක්‍රියාමාර්ග නිසැකවම පරාජයට පත් කළ යුතුයි. එනිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ, රේගුවේ සේවකයින් ආරම්භ කොට තිබෙන සටන් ක්‍රියාමාර්ග



සඳහා ජනතා විමුක්ති පෙරමුණ සම්පූර්ණ සහාය ලබා දෙනවා. ඒ වගේම ආණ්ඩුවේ මෙම ක්‍රියාමාර්ගවලට එරෙහි සියලු දෙනා ඒකරාශී කර ගෙන දැවැන්ත උද්ඝෝෂණ ක්‍රියාවලියක් ආරම්භ කරනවා."

මෙම මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. මධ්‍යමකාරක සභික නීතිඥ සුනිල් වටගල සහෝදරයාද සහභාගි විය.

## හවුල් ආණ්ඩුවටත් රටේ ආර්ථික අර්බුදයට උත්තරයක් නැහැ

ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම්
**විජිත හේරත් සහෝදරයා**



අයවැය ගෙනෙන අවස්ථාවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය අපේක්ෂාවෙන් ආණ්ඩුව කැබිනට් මණ්ඩලයේ වැට් පනත සම්මත කර ගත් බව ප්‍රකාශ කළ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා ඒ අනුව වත්මන් හවුල් ආණ්ඩුවටද රටේ ආර්ථික අර්බුදයට විසඳුම් නොමැති බව ඉතාමත් හොඳින් පැහැදිලි වන්නේයැයි කියා සිටියේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 16වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාවේදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"ශ්‍රී.ල.නි.ප ඇමතිවරු එළියේ විරෝධය ප්‍රකාශ කළාට කැබිනට් එකේදී වැට් පනතට සහාය ලබා දුන්නා. එළියේ විරෝධය ප්‍රකාශ කළේ ජනතාව රවටන්නයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිවරු කිව්වා ගෙනාපු වැට්බදු පනතේ අඩුපාඩු ගොඩක් තිබෙනවා ඒ නිසා අපි සංශෝධන දානවා කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇත්තටම විරුද්ධයි නම් පනතට විරුද්ධව ඡන්දය පාවිච්චි කරලා පෙන්නන්න කියලා අපි කියනවා.

එ.ජා.ප.යත් ශ්‍රී.ල.නි.ප.යත් සමුළුවලදී කිව්වා 2020දී තමන්ගේ පක්ෂය තනිවම ආණ්ඩුවක් හදනවා කියලා. එහෙම කියන ගමන් දැන් එකතු වෙලා රට හදනවා කියලත් කියනවා. දැන් එකතු වෙලා රට හදනවා නම් 2020දී වෙනම ආණ්ඩු හදන්නේ මොකටද කියලා අපි අහන්න කැමතියි. මේවා තමන්ගේ පාක්ෂිකයින් රවටන්න කරන බොරු වැඩ. එනිසා අපි ජනතාවට කියනවා ආණ්ඩුවේ මෙම අසාධාරණ බදු ප්‍රතිපත්තියට එරෙහිව හවුල් ආණ්ඩුවේ ජනතා විරෝධී ක්‍රියාවලියට එරෙහිවත් විරෝධය පළකිරීමට කටයුතු කරන්න කියලා. ඒවගේම ජනතාවට සාධාරණ, නිෂ්පාදන ආර්ථිකයක් සහිත පාලනයක් ගොඩ නැගීම සඳහා මැදිහත් වන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටිනවා."

## බාහිර උපාධි බඳවා ගැනීම සංශෝධනය මගින් අධ්‍යාපන කප්පාදුවක්

සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක
**එරංග ගුණසේකර සහෝදරයා**

බාහිර උපාධි පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය තුළ සිදුකරන ලද වෙනස්කම් මගින් ආණ්ඩුව විසින් අධ්‍යාපන කප්පාදුවකට සූදානම් වන බව පැහැදිලි යැයි සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා පෙන්වා දුන්නේය.

ඔහු මේ බව කියා සිටියේ පසුගිය 26වැනිදා ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත් වූ මාධ්‍ය හමුවක් අමතමිනි.

සෑම වර්ෂයකම උසස් පෙළ විභාගය සඳහා මුහුණ දෙනු ලබන ලක්ෂ දෙකකට ආසන්න පිරිසෙන් 125,000ක පමණ පිරිසක් සමත් වන නමුත් ඉන් සරසවි වරම් හිමිවන්නේ 25,000කට පමණ පිරිසකට බව පෙන්වා දුන් එරංග ගුණසේකර සහෝදරයා අධ්‍යාපන ක්‍රියාවලිය ඇතුළෙ අනාථභාවයට පත් 100,000කට අධික තරුණ පිරිසට රාජ්‍ය විශ්ව විද්‍යාල පදනම් කරගෙන බාහිර උපාධි පාඨමාලා හේතුවෙන් තිබූ උසස් අධ්‍යාපන බලාපොරොත්තුව ආණ්ඩුව විසින් බාහිර උපාධි පාඨමාලා බඳවාගැනීම් කප්පාදුව මගින් බිඳදමා ඇතැයි ප්‍රකාශ කළේය.

මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"මේ බාහිර උපාධි අධ්‍යාපන කප්පාදු ක්‍රියාවලියට එරෙහිව අපි සටන් පෙරමුණක් ගොඩනගමින් සිටිනවා. මේ ආණ්ඩුවේ ප්‍රෝඩාකාරී වැඩපිළිවෙළට



එරෙහි සටන සඳහා අප සමඟ එකතු වන ලෙස මේ රටේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රගතිශීලී මතයක් දරන සියලු දෙනාටත් අපි ආරාධනා කරනවා."

## උතුරේ ජනතාවගේ හෘද සාක්ෂිය අපි දන්නවා

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා හෝදරයා**

උතුරේ මහ ඇමති විග්නේශ්වරන් විසින් පසුගියදා කරන ලද ජාතිවාදී ප්‍රකාශය ජ.වි.පෙ. විසින් දැඩිව හෙළා දකින බව ප්‍රකාශ කළ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ජ.වි.පෙ. උතුරේ ජනතාව සමග වැඩ කරන බැවින් ඔවුන්ගේ හෘද සාක්ෂිය හඳුනන බවත් උතුරේ ජනතාවගේ ඉල්ලීම විග්නේෂ්වරන්ගේ ඉල්ලීම් නොවන බවත් ප්‍රකාශ කළේය.

විග්නේශ්වරන්ගේ ප්‍රකාශ ක්‍රියාවට නොනැගෙන නමුත් එම ප්‍රකාශ විසින් රාජපක්ෂ වටා සිටි දකුණේ ජාතිවාදීන් පෝෂණය කිරීමත් ඔවුන්ට අවස්ථා ලබාදීමත් කණගාටුදායක බව පෙන්වා දුන් ටිල්වින් සිල්වා සහෝදරයා, මහ ඇමතිවරයෙකු ලෙස තමන්ගේ බංකොලොත්කම වසා ගැනීම සඳහා විග්නේශ්වරන් විසින් ජාතිවාදී රැඩිකල් ප්‍රකාශ සිදු කරමින් සිටින්නේයැයි කියා සිටියේය.

ටිල්වින් සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 27වැනි දින පැවති මාධ්‍ය හමුවේදී නැගුණු ප්‍රශ්නයකට පිළිතුරු දෙමිනි.





බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.